# දායාද

අතීත අභිමාන හෙටටත්

පුරාවිද්‍යා පුවත් අටුවාව

2017 ජූලි

එකොළොස් වන කලාපය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

අධ්‍යාපන අමාත්‍යාංශය


# යාන්ඔය ජලාශයට යටවෙන පුරාවිද්‍යා උරුමය සුරැකීමට පියවර






පහළ යාන්ඔය නිම්නය කැබිතිගොල්ලෑව වාහල්කඩ ප්‍රදේශයෙන් හරස් කොට ජලාශයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය මේ වන විට අවසන් අදියරට පැමිණ තිබේ. ජලාශයට යටවන සමස්ත භූමි ප්‍රමාණය හෙක්ටයාර් 1015ක් බව ගණනය කර ඇත. එසේ යටවන ජලාශ භූමියේ පුරාවිද්‍යා ස්මාරක කොතරම් ප්‍රමාණයක් පවතින්නේද යන්න ගවේෂණය කිරීම සඳහා 2015 වසරේ දී පුරාවිද්‍යා හානි ඇගයීම් සමීක්ෂණයක් සිදු කරන ලදි. එම වාර්තාවේ නිර්දේශ මත පදනම්ව ජලාශයේ ජලය පිරවීමට පෙර ස්මාරක ගලවා ඉවත් කිරීමට හෝ පවතින තත්ත්වයන් වාර්තා කිරීමට 2017 වසරේ මුල කැණීම් ව්‍යාපෘතියක් අරඹන ලදී.

මේ පිළිබඳ විස්තර වාර්තාව 02 පිටුවේ පළ කෙරේ.

## පාහියන්ලෙන පිළිබඳ බහු විෂයයික වාර්තාවක්



ශ්‍රී ලංකාවේ විශාලතම ස්වාභාවික ගල්ලෙන ලෙස ප්‍රකටව ඇති ඓතිහාසික පාහියන් ලෙන අනාගත පරපුර වෙනුවෙන් සංරක්ෂණය කොට දායාද කිරීම සඳහා බහු විෂයයික වාර්තාවක් ඉතා කඩිනමින් කැඳවීමට අධ්‍යාපන අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා අදාළ නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත. 02 පිටුවට...

## නව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වැඩ බාරගනී



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය, තාක්ෂණ ඉංජිනේරු පීඨයේ පීඨාධිපති පී. බී. මණ්ඩාවල මහතා පසුගිය දා පුරාවිද්‍යා අධ්‍යක්ෂ ධූරයේ වැඩ භාරගත්තේය. ඉතා දිගු කලක් පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණත්වය ලැබූ එතුමන් 1983 වසරේ මධ්‍යම සංස්කෘතික අරමුදලට ව්‍යාපෘති කළමනාකරුවෙකු ලෙස බැඳී එතැන් සිට මේ දක්වා පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අදාළ කටයුතුවල නියැලෙමින් ඉහළ තනතුරු රැසක් හෙබවූ විද්වතෙකි. වාස්තු විද්‍යාඥයෙකි. ශාස්ත්‍රීය පොත්පත් රැසක් ද එතුමන් විසින් ප්‍රකාශයට පත් කර ඇත.

හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වූ

## ආචාර්ය ඩබ්. එච්. විජයපාල මහතා අභාවප්‍රාප්ත වෙයි

එතුමන් පිළිබඳ සැකසුණු කෙටි වාර්තාවක් දෙවන පිටුවේ පළ කෙරේ.

ඇතුළත පිටු


හඳුන්වාදෙන උරුමය පිටුව 03
හබුතගල හෙවත් තරුලෙන්ගල පිටුව 05
ඇඩම්ස්බර්ග්: මුල්කිරිගල පිටුව 07
එතු සළුපිළි අපූරුව පිටුව 20
උරුම රකින මිනිස්සු පිටුව 34

මුල් පිටුවෙන් - යාන්ඔය නිම්නයේ



පහල යාන්ඔය නිම්නය කැබිතිගොල්ලෑව වාහල්කඩ ප්‍රදේශයෙන් හරස්කොට ජලාශයක් නිර්මානය කිරීමේ ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. මෙම ව්‍යාපෘතිය වසර 2015 දී ආරම්භ කර ඇති අතර මේවන විට ව්‍යාපෘතිය අවසන් අදියරේ පවතී. මෙම ස්ථානයේ ඉදිවෙන ජලාශයට හෙක්ටයාර 1015 ක් යටවන බව ගණනය කර ඇත.

එසේ යටවන ජලාශ භූමියේ කෙතරම් ප්‍රමාණයක් පුරාවිද්‍යා ස්මාරක පවතින්නේ ද යන්න සොයා බැලීම සඳහා වසර 2015 දී සිදුකරන ලද පුරාවිද්‍යා හානි ඇගයීම් සමීක්ෂණයට අනුව (Archaeological Impact Assessment) ජලාශ භූමියට පුරාවිද්‍යා ස්මාරක 14 ක් යට වන බවට වාර්තා කොට ඇත. මෙම වාර්තාවේ ඇති නිර්දේශ මත පදනම්ව ජලාශයේ ජලය පිරවීමට පෙර ගලවා ඉවත්කිරීමට හෝ පවතින තත්ත්වයන් වාර්තා කිරීමට සාදක ලබා ගැනීමට මෙම කැණීම් ව්‍යාපෘතිය 2017.03.04 දින ආරම්භ කරන ලදී.

කැණීම් ආරම්භ කිරීමෙන් පසුව අද දක්වා මෙගලිතික සුසාන භූමියක කැණීම් කටයුතු ද එක් ටැම්පිට ගොඩනැගිල්ලක මෙන්ම කුඩා ප්‍රමාණයේ එක් ස්තූපයක ද කැණීම් කටයුතු සිදුකරමින් පවතී. මෙගලිතික සුසානයේ කුටීර සුසාන 154 ක් පමණ මතුපිටින් වාර්තා වී ඇති අතර එයින් සුසාන 03 ක කැණීම් කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර එයින් සුසාන භරණි 04 ක් මේවන විටත් සුරක්ෂිතව ඉවත්කර ඇත. සුසාන භූමියේ කැණීම් කටයුතු තවදුරටත් සිදුකරමින් පවතී. මෙම සුසානයෙන් ලබාගන්නා අඟුරු කාබන් 14 සමස්ථානිකය මත කාලනීර්නයන් සිදුකර කොපමණ කාලයක් මෙම සුසාන පැරණි ද යන්න නිවැරදිව හෙලිකරගැනීමට මෙන්ම ස්තර විද්‍යානුකූලව ලබාගන්නා පාංශු නියැදිවලින් වෙන්කර ගන්නා පුරාණ පෙතොලිත් (Pitholith) සංඝටක මගින් පෙරකාලයේ පැවැතුනු කෘෂිකාර්මික රටාව පිළිබඳව තොරතුරු ද ලබාගැනීමට ද අපේක්ෂා කරයි. ටැම්පිය ගොඩනැගිල්ල සහ ස්තූපය අර්ධ වශයෙන් නිධන් සොරුන් විසින් විනාශකොට තිබුන අතර එම ගොඩනැගිලිවල මූලික නිර්මාණාත්මක අවධීන් හඳුනාගැනීම තවදුරටත් සිදුකරමින් පවතී.

**ආචාර්ය තුසිත වගලවත්ත,**
ප්‍රධාන කැණීම් භාර නිලධාරී
**ඒ. ඒ. විජයරත්න**

මුල් පිටුවෙන් - පාහියන් ලෙන...

නාය යාමේ අවදානමට ලක්ව ඇති ඓතිහාසික පාහියන් ලෙනෙහි වර්තමාන තත්ත්වය පරීක්ෂා කිරීම පිණිස එම පරිශ්‍රය වෙත ගොස් අදාළ විද්වතුන් හා නිලධාරීන් සමග සිදුකළ තොරතුරු විමසා බැලීමෙන් අනතුරුව එලෙස උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව පුරාවිද්‍යා, ඉංජිනේරු, වාස්තුවිද්‍යා හූ ගර්භ විද්‍යා ඇතුළුව ක්ෂේත්‍ර රැසකින් විද්වතුන් සම්බන්ධ කරගනිමින් අදාළ වාර්තාව කඩිනමින් දැඳවීමට පියවර ගෙන තිබේ.

## සැමරුම



ආචාර්ය ඩබ්. එච්. විජයපාල මහතා

හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු වූ ආචාර්ය ඩබ්. එච්. විජයපාල මහතා පහුගිය දා අභාවප්‍රාප්ත විය. මෙම කෙටි සටහන එතුමන් වෙනුවෙනි.

2016 අගෝස්තු මස අග භාගයේ ආචාර්ය විජයපාලයන් මෙලොව හැර ගියේය. ඔහුගේ වියෝවට සමගාමීව පිටු 20 ක සමරු කළඹක් නිකුත් කෙරිණි. ලංකාවේ වෙසෙන විශිෂ්ට පුරාවිද්‍යාඥයින්ගේ සහ ඔහුගේ සමීපතමයින් වෙතින් ඊට අදහස් එක්කොට තිබුණි.

හිටපු ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහ මහතාගේ සටහනින් කොටසක් මෙලෙස වෙයි.

"ආචාර්ය ඩබ්. එච්. විජයපාල පේරාදෙනිය විශ්වවිද්‍යාලයෙන් ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය දිනා එහි පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළේය. පසුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් ධුරයකට පත්ව එහි ඉහළම තනතුර වූ අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් සේවය කොට විශ්‍රාම ගියේය. කිතුල්ගල බෙලිලෙන, පාහියන්ලෙන, අළුලෙන, දොරවකලෙන ඇතුළු ලෙන් ගණනාවක් කැණීම් කරමින් ප්‍රාග් ඓතිහාසික උරුමය මතු කිරීමට ඉමහත් සේවයක් කළේය. ඇත්ත වශයෙන් ම ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාඥයන් අතර පුරෝගාමියෙක් විය. එතුමාගේ සුවිශේෂීය ශාස්ත්‍රඥානයත් පරිපාලන හැකියාවත් නිසා, රජයේ සේවයෙන් විශ්‍රාම ගිය වහාම මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර ඔහුට ප්‍රදානය කෙරිණි. සේවය කළ සෑම ආයතනයකම සේවක පිරිස් නිසි ලෙස මෙහෙයවමින් ඉහළම සේවයක් කිරීමට ඔහු තුළ වූ හැකියාව අතිශය ආකර්ෂණීය විය. ශ්‍රී ලංකා පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ ඔහුගේ නාමය සදානුස්මරණය වන්නේ බොහෝ දෙනෙකු මන්මත් ව හඹා යන ප්‍රසිද්ධිය හා ජනප්‍රියත්වය කෙරෙහි බිංදුමාත්‍ර තැකීමක් හෝ නොකොට ශික්ෂණයෙන් හා විනයෙන් පිරිපුන් ශාස්ත්‍රෝන්නතකාමී බුද්ධිමතෙකු වශයෙනි..."

සරලව ගතහොත් ආචාර්ය විජයපාල මිනිසෙකු ලෙස ජීවිතයේ කෙටි කලක් තුළදී බොහෝ දෑ කළ හැකි බව පසක් කළ සරල එහෙත් එඩිතර මිනිසෙකි. ආචාර්ය විජයපාල මෙරට පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ දිශානතීන් කිහිපයක් ඔස්සේ සිය ප්‍රාගුණ්‍ය ප්‍රකට කළ විද්වතෙකි. ප්‍රාග් ඓතිහාසික කැණීම් ක්ෂේත්‍රයේ ඔහු ප්‍රකට කළ ශක්‍යතාව ඉන් එකකි. දොරවක්කන්ද ගල්ලෙන කැණීමෙන් ලද තතු මත ඔහු පළ කළ මතවාද දූනුදු ඉහලළ තලයක වෙයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් (කැණීම්) ලෙස සිටිය දී පිටු 16 කින් යුත් "ලංකාවේ ආදි මිනිසා පිළිබඳව දොරවකින් ලැබෙන තතු ...." මැයෙන් ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රිකාවේ "... දෙවැනි පස් තට්ටුවේ සිට නොකඩවා මෙම ගල්ලෙන ප්‍රාග් ඓතිහාසික ජනාවාසයක්ව පැවති බව ඉන් පෙනේ..." ශ්‍රී ලංකා පුරාවිද්‍යා වංශකතාවේ, ස්තූප වැනි පූජනීය ස්ථාන සම්බන්ධ පූර්ව සංරක්ෂණ පරීක්ෂණ කැණීම් සිදුකිරීම හඳුන්වා දෙන ලද්දේ මෙතුමන් විසිනි. දැලිවල කොටවෙහෙර කැණීම, තිස්සමහාරාම සඳගිරි ස්තූපය කැණීම, අනුරාධපුර මිරිසවැටිය ස්තූපය කැණීම් මේ සඳහා නිදසුන්ය. ස්ථානීය කෞතුකාගාර පිහිටුවීමෙහිලා පුරෝගාමී කාර්යයක් ඉටුකළ පුද්ගලයෙකු ලෙස ද මෙතුමන් කැපී පෙනේ. බුදුරුවගල, වව්නියාව, යාපහුව හා දඹදෙණිය වැනි ස්ථානීය කෞතුකාගාර ඔහුගේ අධීක්ෂණය යටතේ නිර්මාණය විය. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පර්යේෂණ අවකාශය පුළුල් කිරීමට ඔහු ගත් ප්‍රයත්නය ද ඇගයිය යුත්තකි. 1982-84 කාලයේ මාතොට කැණීම, 1994 දී ජර්මානු කාවා ආයතනය සමග තිස්සමහාරාම කැණීම ඊට නිදසුන්ය. පුරාවිද්‍යා කැණීම් පිළිබඳ නවීන දැනුමෙන් සන්නද්ධ ජර්මානු ජාතික විද්වතුන් දෙපළක් වූ මහාචාර්ය රූත් හා ආචාර්ය වයිසර් මෙම කැණීම් හා අත්වැල් බැඳගත්හ.

ජීවිතයේ අවසන් හුස්ම පොද හෙළන්නට සති කිහිපයකට පෙරාතුව පොළොන්නරුවේ දෙමළ මහා සෑයේ කැණීම් පරීක්ෂාවට ගොස් එම දාගැබ් මස්තකය තරණය කිරීම එතුමන් අතින් ඉටු වූ අවසන් උතුම් මෙහෙවර ලෙස සැලකේ. පුරාවිද්‍යාඥයෙකු, දක්ෂ පරිපාලකයෙකු, උරුම කළමනාකරුවෙකු සහ මානව දයාවෙන් පිරි ගුරුවරයෙකු ලෙස ඔහුගෙන් උගත හැකි දෑ බොහෝය. ඔහුට නිවන් සුව ලැබේවා.

**සංස්කාරක**

## හඳුන්වාදෙන උරුමය

හඳුන්වා දෙන උරුමය තීරුව යටතේ මෙවර අපි නැගෙනහිර පළාතේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෙට්ටඹුගල ලෙන් සිතුවම් සහ එහි ශිලා ලේඛන පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරමු.



# වෙට්ටඹුගල ලෙන් සිතුවම්

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික යුගයට අයත් ගුහා සිතුවම් හමුවන තන්තිරිමලය, බිල්ලෑව, රජගල, ගොනාගොල්ල ආදී සියලු ස්ථාන අතුරින් වැඩිම සිතුවම් ප්‍රමාණයක් සහිත දිවයිනේ විශාලතම ප්‍රාථමික සිතුවම් එකතුවක් මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිවුලෙයාය ග්‍රාම සේවා වසමේ වෙට්ටඹුගල නම් ස්ථානයෙන් පසුගියදා හමුවිය.

මෙම වෙට්ටඹුගල පිහිටා ඇත්තේ ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කිවුලෙයාය ග්‍රාම නිලධාරී වසමේය. මෙම ස්ථානය "වස්තුබේගල" නමින් ද හඳුන්වයි. ඉතා සුවිශාල කඳුගැටයක් මධ්‍යයට වන්නට ගල් ලෙන් සංකීර්ණයත්, ශිලා ලේඛනත්, අනෙකුත් පුරා සාධකත් පිහිටා ඇති අයුරු පසුගිය දා එහි ගිය අපට දැකගන්නට ලැබිණි.

අදාළ ස්ථානයට ළඟා වීමට සැකසුණු විශේෂ පාරක් නොවූ අතර අඩි 06-07 ක් උසට වැඩුණු මානා පඳුරු පොඩි කරමින් කටු අකුල් අතරින් රිංගමින්, වැල්වල එල්ලෙමින් විශාල ගල් කුළු වටේ යමින් මුලින්ම කුඩා ගල් ලෙනක් වෙත ළඟාවීමු. කටාරම් කෙටූ, ශිලා ලේඛන සහිත එම ගල් ලෙන පසුකර තවත් ඉහළට නැගීමෙන් අනතුරුව ඉතා විශාල ගල් ලෙන් සංකීර්ණය අප නෙත ගැටුණි.

දිවයිනේ විවිධ පළාත්වල දී අප නෙතු ගැටුණු සුවිශාල ලෙන් සංකීර්ණ මා මතකයට නැගේ. කිතුල්ගල බෙලිලෙන, බුලත්සිංහල පාහියන්ලෙන, කුරුවිට බටදොඹලෙන, කෑගල්ල - අළුලෙන ඒ අතරින් ප්‍රමුඛය. වෙට්ටඹුගල සුවිශාල ලෙනෙහි දිග දළ වශයෙන් මීටර් 300ක් පමණ ද, උස මීටර් 20ක් පමණ ද වෙයි. බෙලිලෙන, පාහියන්ලෙන ආදිය මෙන් මෙම ලෙනෙහි පාමුල ගල තුළට එතරම් ගැඹුරට හෑරී සම්පූර්ණ පියස්සක් ලෙස නිර්මාණය නොවුණා ද උසින් හා දිගින් මෙම ලෙන ඉහත ලෙන් අබිබවා සිටිතැයි හැඟේ. කෙනෙකුට සැහැල්ලුවෙන් බිම හිටගෙන ශිලා පෘෂ්ඨයේ නිර්මාණ නිමැවුමට සුදුසු ලෙස ගල් ලෙන් තලය ඉහළ සිට පහළට පිහිටියේ ය.

ඉතා පැහැදිලි ලෙස ලෙන් කටාරම දර්ශනය වෙයි. බ්‍රාහ්මී අක්ෂරයෙන් හා පුරාණ සිංහල භාෂාවට අයත් ලෙන් ලිපියකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ, අභිලේඛන අංශයේ අප සහෝදර නිලධාරී තනුර දයානන්ද ලෙන මුදුනෙහි ඇති බ්‍රාහ්මී අක්ෂර එකිනෙක ගැටගසමින් අරුත් සම්පාදනයට වෙහෙසෙයි. "ලෙන් කටාරමට යටින් කොටා ඇති අක්ෂර පූර්ව බ්‍රාහ්මී අක්ෂර වශයෙන් හඳුනාගත හැකිය. එහි කොටා ඇත්තේ ශුමන පවතෙ උපරජ නග කතිශ...." යන්නයි. මෙහි සරල තේරුම නම් මෙම පර්වතයේ නම "ශුමන පර්වතය" යන්නයි. දේවානම්පියතිස්ස රජුගේ මලණුවන් වූ රුහුණට පලාගිය මහානාග රජුගේ කාලයට සාපේක්ෂ කාලයේ දී භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් මෙය පූජා කරන ලද බවත් සඳහන්ය. ඔහුගේ විස්තර කිරීමත්, අපගේ සාමාන්‍ය දැනුමත් අනුව ස්ථිර ලෙසම මෙය ඓතිහාසික වටිනාකමකින් යුත් පුරාවිද්‍යා නෂ්ටාවශේෂයකි. කලාගාරයකි.



ලෙනෙහි සම්පූර්ණ උස මීටර් 03ක් පමණ වන අතර, සම්පූර්ණ දිග මීටර් 25ක් පමණ වේ. සියල්ල ප්‍රාථමික යුගයට අයත් ගුහා සිතුවම්ය. ගුහා සිතුවම් පෙළ ලෙනේ වම් පස සිට දකුණට විකාශය හඳුනාගන්නට වෙහෙසුනෙමි. සමස්ත සිතුවම් එකතුව 200 ඉක්මවා තිබේ. සිතුවම් ගොන්න මානව රූප, සත්ත්ව රූප, සංකේත රූප ලෙස වර්ගීකරණයට ලක් කළ හැකිය. සත්ත්ව රූප අතුරින් අලියා, ඇතා සහ මුවාගේ රූප පැහැදිලි ලෙසම නිරූපිතය.

සිය මනසේ ආස්වාදයක් ජනිත කළ විවිධ ඇදහිලි හෝ විශ්වාස නැතිනම් යාතුකර්ම සඳහා භාවිත සංකේත ඔවුන් අතින් සිතුවමට නැගුණි. වෘත්තය, ත්‍රිකෝණය, ඊතලය සහ තවත් නොයෙක් සංකේත ඔවුන් විසින් භාවිතයට ගෙන ඇත. මානව රූප සිතුවම් කිරීමට ද ඔවුන් අමතක කර නොමැත. ප්‍රාථමික ජන කොටස් මෙම ලෙන් භාවිත කොට ඇඳි සිතුවම් මගින් අපේක්ෂිත සරල අරුත පැහැදිලිය. ජ්‍යාමිතික හැඩතලවලින් ත්‍රිමාණ රූපී බවින් ගැඹුරු ජීවන දර්ශන ප්‍රකට නොකළ මෙම ප්‍රාථමික ලෙන් සිතුවම් සාම්ප්‍රදායික නොවේ. ශෛලිය නිදහස්ය. අව්‍යාජය. ශිලා පෘෂ්ටය ප්‍රකාශන මාධ්‍ය මෙවලම විය. භාවිත අමුද්‍රව්‍ය කෘත්‍රිම නොවේ.

සුවිශාල සිතුවම් කලාගාරයෙන් තවත් ටික දුරක් ඉහළට නගින විට පියගැට පෙළක් හා සෙල්ලිපි 02ක් දැකිය හැකිය. එම ගිරිලිපි මගින් ද මෙම පර්වතයේ නම "ශුමන පර්වතය" බව තහවුරු කරයි. මෙම ශිලා ලේඛනයන්හි ද පියගැට පෙළෙහි ද විශේෂත්වයක් වෙයි. මේ පළාතේ පුරාවිද්‍යා ස්ථානයන්ගෙන් හමු වන පියගැට පේළිවලට වඩා දිග පළලින් මේවා විශාලය. අනෙක පියගැට පෙළ ඉහළට නගින විට දෙපසින් බලාගෙන යෑමට හැකිවන සේ සෙල්ලිපි සකසා තිබීම ද විශේෂය.

කෙසේ නමුත් වෙට්ටඹුගල ඓතිහාසික වශයෙනුත්, පුරාවිද්‍යාත්මක වශයෙනුත් මෙරට ඉතිහාසයට නවමු අත්දැකීමක් එකතු කරනු නොඅනුමානය.

මෙම ස්ථානයේ බිතුසිතුවම් ආරක්‍ෂා කර ගැනීමට ආරක්ෂිත වැටක් සැකසීමටත් මේ වන විටත් ශිලා ලේඛන කිහිපයක් පිටපත් කර ඇති බවත් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සෙනරත් දිසානායක මහතා පවසයි. ඔහුගේ උපදෙස් පරිදි ඉදිරි පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

සටහන: **සුනිල් බණ්ඩාර කෝරළගේ**
ඡායාරූප : **මහේෂ් ගුරුමැටිය**

# කැටවල තිරිංගල්ලෙන ප්‍රාග් ඓතිහාසික ස්ථානය

ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයෙන් බටහිර හා නිරත දිගට දිශානුගතවූ සබරගමුව පළාත තුළ රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැටවල ග්‍රාමයේ මෙම ප්‍රාග්ඓතිහාසික මානව ජනාවාස භූමිය ස්ථානගතව ඇත. රත්නපුර බේසම නමින් හඳුන්වන භූගෝලීය සානුවට මුහුණලා ඇති උස් කඳු පන්තියක දකුණු දිශාවට බරවූ කදු බෑවුමක තරමක් තැනිතලා කලාපයක ප්‍රාග් ඓතිහාසික ලෙන් ජනාවාසය පිහිටයි. කඳු පාමුල තැනිතලා නිම්නයක මධ්‍යයට වන්නට ලෙන පිහිටීම නිසාම මෙම ස්ථානයට පිවිසීම තරමක් පහසු ය.

මෙහි පරිසරය පහතරට තෙත් කලාපයට අයත් ය. ඒ අනුව කලාපයේ සෑම නිම්නයක් හරහාම කුඩා දිය පහරක් ගලා බසී. පහතරට තෙත් කලාපයේ ශාක සියල්ලක්ම මෙම ප්‍රදේශය තුළින් දැකගත හැකිය.බොහෝ උස්ව වැඩෙන උඩුවියනකින් හා මැද පන්තියේ යටි වියනකින් ද ඊටත් පහළ තුනී ශාක පන්තියකින් ද මෙම ප්‍රදේශයේ වනාන්තර සැකසී තිබේ. ඉතා ප්‍රශස්ත මට්ටමේ ජල පෝෂක කලාපයන් රැසක් පරිසරය පුරාවට දැකගත හැකිය. වැඩි වශයෙන් පස සෝදා පාලුවට ලක්වීමේ වැඩි ප්‍රවණතාවයක් දැකගත හැකිය. වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර් 3000 - 4200 ත් අතර වෙනස් වෙමින් ක්‍රියාකාරී වේ. එමෙන්ම මෙම ප්‍රදේශයේ වාර්ෂික උෂ්ණත්වය සෙන්ට්‍රිගේඩ් අංශක 28 - 34 ත් අතර වෙනස් වීම් දැකගත හැකිය.

මෙරට ඉතිහාසයෙන් වැඩිම කලක් මිනිසා ගෙවා ඇත්තේ ගල් යුගය තුළය. පුරාශිලා යුගයේ දැනට හඳුනාගෙන ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන අතුරින්, බූන්දල, පතිරාජවෙල, උස්සන්ගොඩ හා ඉරණමඩු පාංශු කලාපය, ප්‍රධාන තැනක් ගනී. මේවායින් පවතින පරිසර තත්වයන්ට ඔරොත්තු දීමට නොහැකිව පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතිරිව ඇති සාධකයන් වන්නේ තිරුවාණා හා කහඳ ගලින් නිමවූ ශිලා මෙවලම් පමණි.

ඉන්පසුව මෙරට පුරාවිද්‍යා උරුමයට ප්‍රාග් ඉතිහාසයෙන් එක්වන යුගය වන්නේ මධ්‍යශිලා යුගයයි. එම යුගය මෙරට පමණක් නොව ලොවපුරා ශ්‍රී ලාංකීය නාමය හැඩකරන්නට මේ වනවිට සමත්ව ඇත. එහිවූ නව සොයා ගැනීම් හා සිදුකළ පර්යේෂණයන්හි ප්‍රතිඵල ලොව අනෙක් රටවල් විශ්මයට පත්කරයි. විශේෂයෙන්ම මෙම යුගය නියෝජනය කරන්නේ නවීන මානවයා වූ හෝමෝ-සේපියන් සේපියන් ය. (Homo sapiens sapiens) මොහු මෙරටට ආවේණික නමකින් නාමකරණය වූයේ බළංගොඩ මානවයා ලෙසින් ය.

## තිරිංගල්ලෙනට ආසන්න ප්‍රාග් ජනාවාස

මෙම ස්ථානයේ සිට කිලෝ මීටර් 04 කට ආසන්න දුරකින් කුරුවිට බටදොඹ ලෙන පිහිටා ඇත. ඒ අනුව ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මෙම ස්ථානය සමග සෘජු සබඳතා කුරුවිට බටදොඹ ලෙන සමඟ පවත්වන්නට ඇතැයි අනුමාණ කල හැකිය. සීමා මායිම් රහිත ප්‍රාග් ඓතිහාසික ලෝකයේ එම මානවයන් සෑම ස්ථානයකම සැරිසරා තම සලකුණු ඉතිරිකර තිබේ. යම් විටක කුරුවිට බටදෙඹ ලෙනෙහි ජීවත්වූ මානවයින්ගේ තාවකාලික ලැගුම්පලක් ලෙසින් මෙ ස්ථානය භාවිතයට ගන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. විශේෂයෙන්ම ශිලාමෙවලම් නිෂ්පාදනය සඳහා වූ අමුද්‍රව්‍ය මෙම ස්ථානය ආශ්‍රිතව බහුලව තිබීම ඊට ප්‍රධාන හේතුවක් ලෙසින් දැක්විය හැකිය.

## තිරිංගල්ලෙනේ ස්වභාවය

දැනට වගා කටයුතු සිදුවන ඉඩමක මෙම ලෙන් පියස පිහිටා තිබේ. නයිස් පාෂාණයෙන් සමන්විත ගල් පර්වතයකින් ලෙන නිර්මාණය වී ඇත. හුදකලා ගල් පර්වතයක එක් පසක් උස්ව ඇති නිසා පහල කොටස ලෙනක් ආකාරයෙන් සැකසී තිබේ.ගල් පර්වතයේ ඉදිරිපස උස්ව ඇති කොටසේ පොළව හා සම්බන්ධව ඇති කොටසින් ලෙන ආරම්භ වේ. ලෙනෙහි ව්‍යාප්තිය දික් අතට වැඩිය. අභ්‍යන්තරයට ජලය ඉහලින් ගලා ඒමක් සිදු නොවේ. අභ්‍යන්තරය වර්ග මීටර් 50 කට ආසන්න ය. දකුණු දිසාවට මුහුණලා ලෙන ස්ථාන ගතව ඇත. ජලය වැටෙන සීමාව ලෙන් අභ්‍යන්තර බිත්තියේ මධ්‍යයේ සිට මීටර් 5 ක් (Drip line) ඉදිරියෙන් දැක ගත හැකිය. ලෙනෙහි උස මීටර් 6 ක් පමණ වේ. ලෙන ආසන්නයෙන්ම තිරිංගල්ලෙන නම් දොලක් ගලා බසී. ඉදිරිපස කොටසේ සාමාන්‍ය පස් තැම්පතු ප්‍රමාණයක් දැකගත හැකිය. ලෙනෙහි ආනතිය අනුව ඇතුලාන්තය තෙක්ම මනාව ආලෝකය ලැබේ. ඒනිසා මිනිස් වාසයට හිතකර වාතාශ්‍රයක් හා පරිසරයක් දැකගත හැකිය.

## තිරිංගල්ලෙනේ ප්‍රාග් ඓතිහාසික සාධක

ලෙනේ වැසි ජලය වැටෙන සීමාවේ ස්ථාන කීපයකින් පුරාවිද්‍යාත්මකව වැදගත් ප්‍රාග්ඓතිහාසික යුගයේ සාධක රැසක් දැකගත හැකිය. ඒ සියල්ලක්ම මධ්‍ය ශිලා යුගයේ භාවිතයට ගන්නට ඇතැයි අනුමාන කරන ශිලා මෙවලම් නිෂ්පාදන අතුරු ඵලයන් ය. ඒ අතරින් තිරුවානා පතුරු (Quartz flake) හා කහඳ පතුරු (chart flake) මෙන්ම න්‍යෂ්ඨි (core) කොටස් හා මිටි (Hammer) වලින් කැඩීගිය කොටස් කීපයක් දැකත හැකිය. මීට අමතරව ගරුගල් කැබලි (Ocher) කීපයක් ද මතුපිට මතුව ඇත්තේ වැසි ජලයට පස නිරාවරණය වීමත්, විවිධ මානව ක්‍රියාකාරකම් නිසා පස් ස්තර අවුල් වී ඇති නිසාත් ය.

මෙම ලෙනේ පස් තැම්පතු බෙහෝමයක් කාලයාගේ ඇවෑමෙන් විනාශයට පත්ව ඇත. ලෙන් අභ්‍යන්තරයේ කෙළවරට වන්නට පිහිටි ගල මතුව තිබීමෙන් පැහැදිලි වන්නේ අතීතයේ සිට ගැඹුරු පස් තැම්පතු ප්‍රතිශතයක් සැකසී නොමැති බවකි.

මධ්‍යශිලා යුගය (Mesolithic) වූ ක්ෂුද්‍ර ශිලා යුගයේ (microlithic) නියෝජන ශිලා මෙවලම් වියහැකි ගල් පතුරු කීපයක් මතුපිට තිබූ අතර ඒවා සියල්ලක්ම විවිධ පැතිවලින් පතුරු ඉවත්කර තිබුනි. ඒ අතරින් වූ හතරැස් න්‍යෂ්ටි (core) කොටසිකින් පතුරු ඉවත්කළ බවට වූ නිශේධන කැළැල් (Negative flake scar) රැසක් දැකගත හැකිය. ස්ථානයේ දක්නට ලැබුණු ශිලා මෙවලම්යැයි අනුමාන කළ හැකි ශිලාපතුරු





අනිවාර්ය මානව ක්‍රියාකාරකම් ලෙසින් පැහැදිලිය. පුරාවිද්‍යාත්මක කෝණයෙන් හදුනාගනු ලබන ප්‍රහාර වේදිකා, පෙරගැලවුම් පතුරු ලක්ෂණ, ශිලා පතුරු මත වූ පැහැදිලි අතුල්පැත්ත හා පිටපැත්තේ ලක්ෂණ, ප්‍රහාර බුබුලු ලක්ෂණ, රැලිති හා ආවාට, න්‍යෂ්ටි මතවූ වෙනත් විද්‍යාත්මක ශිලාමෙවලම් සාධක යනාදියෙන් මේ බව තහවුරු වේ.

## තිරිංගල්ලෙනේ ප්‍රාග් ඓතිහාසික මානව ජනාවාසකරණය

මෙම ලෙනෙහි පවත්නා වත්මන් සාධක මතින් අනාවරණය කරගත හැක්කේ මෙම ස්ථානයේ ද ප්‍රාග් ඓතිහාසික මානවයා ජිවත් වූ බවකි. ඒ සඳහා පවත්නා පරිසර හා සම්පත් සාධක බෙහෙවින්ම උපකාර වී ඇත. විශේෂයෙන්ම වර්ග මීටර් 50 කට ආසන්න වපසරියකින් යුතු ලෙන් පියස, ඉතාම ආසන්නයෙන් පිහිටි දොල පහර, ශිලාමෙවලම් සකස් කිරීමට අවශ්‍ය බහුල අමුද්‍රව්‍ය, හා ආහාර යන කරුණු මුල් වන්නට ඇත.

මෙම ස්ථානයේ ජනාවාසවී තිබූ බවට ශිලා මෙවලම් සාධක ප්‍රමාණවත් ය. මෙම මානව ජනාවාසය අඛණ්ඩව මෙම ලෙන ආශ්‍රිතව පැවතියේ ද යන්න තහවුරු කරගැනීම සඳහා පස් ස්තර අධ්‍යනයකට යා යුතුය. එහෙත් පවත්නා පරිසර තත්වයන් හා නොදැනුවත්ව සිදුවූ මානව ක්‍රියාකාරකම් හමුවේ ඒ සඳහා ඇති ඉඩ අහුරා ඇති බවක් පැහැදිලි ය. ඉතිරිව ඇත්තේ සීමා සහිත පස් තැම්පතු ප්‍රමාණයකි. ඉතා තුනී ස්තරයක් ලෙසින් පවතින පස් ස්තරය තුළ ශිලා මෙවලම් සාධක රැසක් මතුපිටින් දැකගත හැකි වීමෙන් පැහැදිලි වන්නේ අභ්‍යන්තරයට වන්නට බොහෝ සාධක තිබිය හැකි බවකි.

මෙම ස්ථානයේ ජනාවාසකරණය පිළිඳව විමසීමේ දී කරුණු 2 ක් අනුමාන කළ හැකිය. ඉන් එකක් වන්නේ ස්ථානය ආසන්නයෙන් ඇති දොළ පහරින් ලබාගත් ශිලා අමුද්‍රව්‍ය ශිලා මෙවලම් නිෂ්පාදනය කිරීමට යොදගත් තාවකාලික ලැගුම් පලක් ලෙසින් මානවයන් යොදාගත් බවය. ඒ අනුව ශිලා මෙවලම් නිෂ්පාදනයට මෙන්ම තාවකාලිකව ලැගුම් ගන්නට ද භාවිතා කරන්නට ඇත. අනෙක් කරුණ වන්නේ ස්ථිර වාසස්ථානයන් ලෙසින් නොකඩවා භාවිතයට ගන්නට ඇති බවකි. වැඩි වර්ෂා කාලයේ දී ස්ථානයෙන් ඉවත් වී නැවත පැමිනෙන්නට ඇත. කෙසේ වෙතත් මේ පිළිබඳව වැඩිදුර අර්ථකතන සැපයීමට වෙනත් පුළුල් අරමුණු ඔස්සේ පර්යේෂණ සිදුකළ යුතුය. මෙවැනි ස්ථාන සබරගමුව පළාතේ ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබදව පවතින සීමිත සාධක සහිත ස්ථානයන් බැවින් අනාගත පර්යේෂණ සදහා මැනවින් ආරක්ෂා කළයුතුව ඇත.

**එච්. එම්. එස්. කේ. ඇරැගම**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර (කැණීම්),
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය (කෑගල්ල),
සීතාවක,
අවිස්සාවේල්ල.

# කාවන්තිස්ස රජු කරවා පිදූ හබුතගල වෙහෙර හෙවත් තරුලෙන්ගල

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හුළංනුගේ ග්‍රාමයේ හබුතගල විහාරය හෙවත් තරුලෙන්ගල විහාරය පිහිටා තිබේ. මොනරාගල-පොතුවිල් මාර්ගයේ හුළංනුගේ හන්දියෙන් වම්පසට ඇති මාර්ගයේ කි.මී. 1.5ක් පමණ ගිය පසු මෙම ඓතිහාසික විහාරස්ථානය දැකබලා ගත හැකි ය. තත් විහාරස්ථානය වර්තමානයේ හැඳින්වෙන්නේ තරුලෙන්ගල නමිනි. කරඳේවිහාරය, කරඳහෙල විහාරය යන නම් ද සාමාන්‍ය ව්‍යවහාරයේ පවතී.

හබුතගල විහාරයේ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් පිළිබඳ ව සී.ඩබ්. නිකලස්, ගුණපාල සේනාධීර, එල්ලාවල මේධානන්ද හිමි වැනි විද්වත්හු පර්යේෂණාත්මක ලිපි පළ කළහ.

පුරාතන රෝහණ රාජධානියේ පැවැති මෙම හබුතගල විහාරයේ නිර්මාතෘ කාවන්තිස්ස රජු බව මෙහි ඇති ශිලා ලේඛනයකින් ඒ බව තහවුරු වෙයි. කරඳහෙල විහාරස්ථානයට මෙතුමා නිතර නිතර ආබවත් කරඳහෙල සිට මඟුල් මහාවිහාරයට ද එහි සිට ජයරම්පළ දුටුගැමුණු රජුගේ මාලිගයට ද යෑමට ගල් ඇතිරූමාවතක් තිබූ බවත් ජනප්‍රවාදවල කියැවේ. එහෙත් කාවන්තිස් රජු විසින් හබුතගල නමින් විහාරස්ථානයක් කළ බවට කිසිදු තොරතුරක් වංශ කථාවේ සඳහන් ව නැත. මෙහි ඇති ලෙන්වලින් බොහෝ ප්‍රමාණයක් මෙතුමා විසින් සිදුකරන්නට ඇතැයි සිතීම යුක්ති යුක්ත ය. බදන්ත සෝමදේව, ආචාර්ය උත්තිය, කුම්භකාර තිස්ස විහාරස්ථානයට ලෙන් පිදූහ. චුස්සා උපාසිකාව තමාට අයත් හමණ විරවැව ද මත්තා උපාසිකාව තමාගේ මහවැව ද හබුතගල වෙහෙරේ සංඝයාට ලබාදුන් බව මෙහි ඇති පර්වත ලිපිවලින් කියවේ. නම සඳහන් නොවූ අයෙකු ගබ්ඩත තිරිවැව කරවා දුන් බවත් ද හුලියවැවේ බදු දෙක දුන් බවත් අනෙක් ලිපියක සඳහන් ය.

පුරාවිද්‍යාස්ථානයට ප්‍රවේශ වන ස්ථානයෙහි වම් අත පැත්තට වන්නට නටබුන් වූ දාගැබකි. මෙහි වට ප්‍රමාණය දළ වශයෙන් මීටර් 75කි. සලපතළ මළුවක් හා ප්‍රාකාරයක් මෙහි තිබූ බව පෙනේ. මේ ස්තූපයට බටහිරින් ගලක



හාරන ලද ගල් වංගෙඩියකි. එය අඩියක් ගැඹුරු ය. එය ආසනයෙහි ටැම්පිට ගොඩනැගිල්ලක ශේෂයන් විද්‍යමාන ය. කන්ද මුදුනෙහි කටාරම් කෙටූ ලෙන් රාශියක් දක්නට පිළිවන. පඩිපෙළ තරණය කළ පසු හමුවන කටාරම් කෙටූ විශාල ලෙනක සැතපෙන ඉරියව්වෙන් යුත් සුවිශාල බුදුපිළිමයකි. මෙවැනි බුදුපිළිමයක් කුමන බඹරගස්තලාවේ ද දෘශ්‍යමාන ය. නිදන් සොයන්නන් විසින් මෙම පිළිමයට කර තිබූ හානිය සුළු පටුනොවෙයි. පිළිමය නිර්මාණය කිරීම සඳහා ගඩොල් සහ මැටි මාධ්‍ය උපයෝගී කොටගෙන ඇත. ලෙන් බිත කපරාරු කොට සිතුවම් ඇඳ තිබූ බවට සාධක හමුවෙයි. ප්‍රාග් ඓතිහාසික යුගයට වැටෙන සිතුවම් ද අද වන විට මේ ලෙනෙහි දක්නට ලැබේ. විනාශ කෙරුණු පිළිමය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නැවතත් පිළිසකර කරමින් සිටියි.

කන්ද මුදුනෙහි දැවැන්ත ලෙනකි. ඊසාන දෙසට මුහුණලා ඇති ගල් පර්වතයක මෙය පිහිටා ඇත. දිගින් අඩි 512ක් ද පුළුල අඩි 30ක් ද වෙයි. උස ම ස්ථානය අඩි 82කි. මුළු ලෙනෙහි ම කටාරම තිබුණ ද ශිලා ලිපියක් දක්නට නැත. ලෙන තුළ බිම තට්ටු අටකට පිහිටියේ ය. පුරාතන යුගයට අයත් බදාම ශේෂයන් අදටත් දර්ශනය වෙයි. මේවා හැරුණු විට ශිලා ලිපිසහිත කටාරම් කෙටූ ලෙන් කිහිපයක් ඇත. භාවනා යෝගී භික්ෂූන් වහන්සේ බොහෝ ප්‍රමාණයක් හබුතගල විහාරයේ ලෙන්වල වාසය කළ බව මින් මොනවට පැහැදිලි වෙයි.



එදා භික්ෂූන් වහන්සේගේ පැන් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා උපකාරී විනැයි සිතිය හැකි විශාල ගල් කෙම් දෙකක් අදටත් කරඳ හෙලෙහි ඇත. මේවායේ ජලය කිසිඳා නොසිඳෙන බව කියති. කඳු ගැටය පාමුලට වන්නට පොකුණු හතරක ශේෂයන් දක්නට පිළිවන ඒවා අද වනවිට ගොඩ වී වගුරු බවට පත් ව තිබේ. සිරිපතුල් ගල්, මුත්‍රගල්, පහන් ගල්, ගල් පඩිපෙළවල්, කණුපාදම් ගල්, සඳකඩපහණ, ගල් පුවරු, උළුකැබලි, ගඩොල්, වළං කැබලි, කොත් කැබලි ආදි පුරාවිද්‍යාත්මක සාධක බොහෝමයක් හබුතගල විහාරයේ තන්හි තන්හි දක්නට ලැබේ. යථෝක්ත ශේෂයන්ගෙන් තහවුරු වන්නේ පුරාණ කාලයෙහි මේ ස්ථානය බොහෝ සෙයින් දියුණුවට පත් ව තිබූ බවයි.

විවිධ හේතූන් නිසා අභාවයට ගිය හබුතගල විහාරය නැවත සොයාගෙන ආරක්ෂාකර ගැනීමට භික්ෂූන්වහන්සේ රැසක් කටයුතු කළහ. මේ අතරිනිදු අකුරැස්සේ දියලපේ ඉන්දානන්ද, තාඹුගල ආනන්දසිරි වැනි හිමිවරු ප්‍රමුඛයෝ වන්නා හ.

පුරාවිද්‍යාත්මක වටිනාකම්වලින් අනූන තරුලෙන්ගල 2014.10.10 ගැසට් පත්‍රය මඟින් පුරාවිද්‍යාස්ථානයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. 2018 වර්ෂයේ දීමෙහි ඇති සිතුවම් සංරක්ෂණය කිරීමටත් දැගැබ කැණ සංරක්ෂණය කිරීමටත් අපේක්ෂිත ය. තරුලෙන්ගල ආරණ්‍ය සේනාසනයේ වර්තමාන විහාරාධිපති බැලුම්මහර සාන්තසිරි හිමියෝ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහාය ඇති ව විහාරස්ථානයේ ප්‍රගමනය උදෙසා කටයුතු කරමින් සිටිති.

**රජිත් නාමසිංහ**
සංවර්ධන නිලධාරී,
පුරාවිද්‍යා කලාප කාර්යාලය,
ලාහුගල.

# සුප්‍රකට නිල්ලග්ගම බෝධිඝරය



කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මකුලෑව ග්‍රාම නිලධාරී වසමේ අතිදුෂ්කර වූ ද හුදකලා වූ ද නිල්ලග්ගම ග්‍රාමයේ හෙට්ටිගම වැව පාමුල මේ ලෝ ප්‍රකට නිල්ලග්ගම බෝධිඝරය නම් වූ පුරා අවශේෂ පිහිටා ඇත.

කුරුණෑගල සිට අංක 57, ඇල්ල, මාර්ගයේ අනුරාධපුරය දක්වා ගමන් කරන බස්රථයක පැමිණ ගල්ගමුව නගරයෙන් බැස ගල්ගමුව ඇහැටුවැව මාර්ගයේ කි.මී. 07 ක් පමණ ඉදිරියට ගිය පසු හමුවන බිම්පොකුණ පන්සල් මාර්ගයේ කි.මී. 03 ක් ගමන් කළ විට නිල්ලග්ගම බෝධිගරය හමුවේ. මෙම ස්ථානය වෙත ලගාවීමට ඇති පහසුම ගමන් මාර්ගයයි.

අනුරාධපුර යුගයේ ක්‍රි.ව. 7-9 සියවස්වලට නෑකම් කියන පුරා සාධක රාශියක් මෙහි වෙයි. පැරණි චෛත්‍ය ගොඩැල්ල, පැරණි ගල් කණු, මල් ආසන, කැසිකිලි ගල, සිරිපතුල්ගල, ආදිය අතර බෝධිඝරයට ප්‍රමුඛතාව හිමිවෙයි. ශ්‍රී ලංකාවේ දැනට ඉතිරි වී ඇති හොඳින් සංරක්ෂිත එකම බෝධිඝරය නිල්ලග්ගම බෝධිඝරය බව පුරා විද්වත්හු පෙන්වා දෙති.

වයඹ පළාත තුළ බෝධිඝර හෙවත් බෝ වෘක්ෂය වන්දනා කිරීම සඳහා ඉදිකළ ගෘහයන් එසේත් නැතිනම් වහලය සහිත ප්‍රදක්ෂණ පථයක් ඇතුළත් බෝධිඝර විවිධ හැඩතලවලින් හා විවිධ අමුද්‍රව්‍යවලින් නිර්මිතව ඇත. හත්තිකුච්ජි පුරාවිද්‍යා ස්ථානයේ බෝධිඝරය ගඩොලින්ද, පඬුවස්නුවර පුරාවිද්‍යා ස්ථානයේ බෝධිඝරය ගඩොලින් ද, පුඩුපුලංචියේ බෝධිඝරය ශෛලමය බිත්තිවලින්ද නිර්මාණය කර ඇත. නිල්ලග්ගම බෝධිඝරය මේවා අතරින් සුවිශේෂී වූයේ එය මුළුමනින්ම ශෛලමය අංග සම්පූර්ණ සංරක්ෂිත බෝධිඝරයක් වීම නිසාය.

ස්ථර දෙකකින් එනම් මාලක දෙකකින් සමන්විත බෝධිඝරයට පිවිසීම සඳහා නැගෙනහිර හා බටහිර දෙසින් පිවිසුම් දොරටු දෙකකි. පිටත මාලකය හා ඇතුළත මාලකය යන දෙකම සමචතුරස්‍රාකාර වේ. පිටත මාලකය දිග අඩි 6 අගල් 09 වේ. පිවිසීමට ඇති දොරටු දෙකෙහිම පාමුල කැටයම් රහිත සඳකඩ පහන් 02 කි. ඉන්පසු පිය ගැට දෙක බැගින් වේ. ඒ දෙපස කොරවක්ගල් දෙකකි. දොර උළුවස්ස දෙකෙහිම එකම ආකාරයට කැටයම් කර ඇත. උළුවහු හා උඩලිපතෙහි ඉතා අලංකාර කැටයම් අතර උළුවහුවල පහළ කොටසෙහි මානව රූප 02 කි. එක් අතකින් පුන්කලසක් ද අනෙක් අතින් මල් පොකුරක් ද රැගෙන සිටියි. ඊට ඉහලළින් අශ්වයකු මත නැගි මිනිස් රුවකි. ඒ ආකාරයට උළුවස්ස පහළ සිට ඉහළ කොටස දක්වාම කැටයමින් පරිපෝෂිතය. දොරටුවෙහි උඩලිපතට පහළින් ඇති ශෛලමය පුවරුවෙහි හංස පේළිය බැගින් වේ. එක් පසක දහය බැගින් දෙපහෙසිම විස්සකි. පිටත මාලකයේ ශෛලමය බිත්තිය පිටතින් අලංකාරව නිමකළ ඇත් හිස් 105 කි. පිටතින් බලන්නෙකුට ඇත් හිස් මනාව දැකගත හැකි වේ.

ඇතුළත මාලකය අඩි 13 බැගින් සම සතරැස් වේ. එහි බිත්තිවල උස අඩි 6 අගල් 6 වේ. වෙහි පදනම් ගල් පුවරුවෙහි හංස පංතියකි. ඊට ඉහළින් ගල් පුවරුවෙහි නෙළුම් පත් රටාය. ඊට උඩින් ඇති සුමට ගල් පුවරුවෙහි සිංහ රූ 09 ක් උක්කුටිකයෙක් වෙයි. මැද සිටින උක්කුටික වූ සිංහයාට දෙපසින් සිටින සිංහයින් දෙදෙන සිටගෙන සිටින අතර පිටුපස හැරී ඔවුනවුන්ගේ මුහුණු දෙස බලා සිටියි. ඉතා විශිෂ්ට ඝනයේ කැටයමින් පෝෂිත ගල් පුවරු කෙරෙහි නරඹන්නන්ගේ සිත් අලවයි. බිත්තියේ උඩින්ම ඇති එලකයෙහි යටිපැත්තෙහි ඉහළට හැරී නැවී ගිය පරාලවල නෙත්ති සේ ගල් කැටයමකි. බෝධිය රෝපනය කර ඇත්තේ මෙහි මධ්‍යයෙහි ය. රෝපිත බෝධියට වන්දනා කිරීමට පැමිණි සැදැහැවතුන් අව්වැසි සුළඟින් ආරක්ෂා කර ගැනීම සඳහා දැවමය වහලයක් ඉදිකර තිබු බවට සාධක වන්නේ එයවටා ශේෂ වී ඇති ගල්කණු 08 යි. එම කුලුනු ඉතා කුඩා ආකාරයට කැඩී ගොස් ඇති අතර කණු 04 ක් උස අඩි 06 ක ප්‍රමාණයෙන් ශේෂව ඇත. ඇතුළු මලුවෙහි ප්‍රදක්ෂිනා පථය මත දිග අඩි 03 පළල අඩි 02 ප්‍රමාණයේ සුමට ශෛලමය පූජාසන 03 ක් දක්නට ලැබෙයි.

මෙහි ගල් පුවරුවක අනුරාධපුර යුගයට අයත් එනම් ක්‍රි.ව. 08-09 සියවස්වලට අයත් අක්ෂර සහිත සෙල්ලිපියකි. එය බෝධිඝරයෙහි පදනම මත පිහිටුවා ඇත.

"මොනරගල් බුද්මී මේ දස ඇතුන් කරවා මහබොයි පිදූ පිනින් අනුත්තර සම්මා සම්බුදු ...."

"(මම) මොනරගල් බුද්ධ වෙමී. මේ දස ඇතුන් කරවා මහ බෝධියට පූජාකළ පිනින් සම්මා සම්බුදු බව ලබම්වයි"යනු ආචාර්ය සෙනරත් පරණවිතාන සූරීන්ගේ සෙල්ලිපි පරිවර්තනයයි. එතුමා විසින් රචිත පාලන වාර්තාවල සඳහන් සටහන එසේය. මෙහි පළමු මාලකයෙහි පිටත බිත්තිවල ඇති ඇත් රූ කැටයම් 105 න් 10 ක් නෙලා මහ බෝධියට පූජා කර සම්මා සම්බුදු බව පැතතුවා යන්න මෙයින් අදහස් වේ. එසේ ම මහ බෝධිය යුනවෙන් හඳුන්වා ඇත්තේ දෙවන මාලකයෙහි මධ්‍යයේ සිටුවන ලද බෝ වෘකෂයයි. මේ බෝ වෘකෂය එදා දෙවන පෑතිස් රජු දවස අනුරාධපුරයේ රෝපණය කළ ශ්‍රීමාබෝ ශාකාවෙන් හටගත් එලයකින් ඇති වු බෝ වෘකෂයක් බව ජනප්‍රවාදයේ එයි. තවද ප්‍රවිෂ්ඨ වන දොරටුවල උළුවස්සෙහි ඉහළ කොටසෙහි කැටයම්කර ඇති අශ්වයකු මත නැගි මිනිස් රුව මතුබුදු බව ලබා අභිනික්මනට සැරසුණ අයුරුත් පෙන්වයි.

අප්‍රකට ස්ථානයක පිහිටි ලෝ සුපතල නිල්ලන්ගම බෝධිඝරය නැරඹීමට බොහෝ දෙස් විදෙස් සංචාරකයෝ පැමිණෙති. අධ්‍යයන කටයුතුවල නිරත සිසුහු මෙහි ඓතිහාසික පුරාවිද්‍යාත්මක හා වාස්තු විද්‍යාත්මකව තොරතුරු සොයා මෙම ස්ථානයට පැමිණෙති.

පාලන වාර්තාවලට අනුව මෙම ස්ථානයට පුරාවිදු ඇස පළමුව යොමුවන්නේ 1895 වර්ෂයේ දීය. එවකට සිටි පුරාවිද්‍යා කොමසාරිස් එච්. සී. පී. බෙල් මහතා විසිනි. එතුමා එම ස්ථානය අධ්‍යයනය කර චිත්‍ර සහිත සුළු වාර්තාවක් සකසා ඇත. ඉන්පසුව 1954 වර්ෂයේ ජුනි මාසයේ දී එම ස්ථානයට පා තබන ආචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන් විසින් සුන්බුන් වූ බෝධිඝරය සංරක්ෂණය කිරීමට අවැසි වැඩ පිළිවෙළ සකස් කරන ලදී. ඒ අනුව 1954 වර්ෂයේ අගභාගයේදී දෙපාර්තමේන්තු සංරක්ෂණ වැඩ අධිකාරි හැරී ඒ. ගුණරත්න මහතාට මෙම කටයුත්ත භාරදී ඇති අතර එතුමා වාස්තු විද්‍යාත්මක රටාවන් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ ඇති ඉතා විශිෂ්ට ගනයේ සංරක්ෂිත එකම බෝධිඝරය බවට පත් කරන ලදී. 1965 මාර්තු මස 12 වැනි දින අංක 14342 දරණ ගැසට් නිවේදනය මගින් බෝධිඝරය සහිත භූමිය අක්කර 05 රූඩ් පර්චස් 03 වශයෙන් පුරාවිද්‍යා තහනම් ඉඩමක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව භාරයේ පවතින මෙම ජාතික උරුමය සුරැකීම සඳහා දැනට දීමනා රැකවල්කරුවකු පත් කර ඇත.

**ඒ. එම්. ආර්. සමන් කුමාරි**
වැඩබිම් කළමනාකාරිනි/ස්ථානභාර නිලධාරිනි
හත්තිකුච්චි පුරාවිද්‍යා ස්ථානය,
පඬුවස්නුවර පුරාවිද්‍යා කාර්යාලය.

# ලන්දේසීන් දුටු ඇඩම්ස්බර්ග් හෙවත් මුල්ගිරිගල





ලන්දේසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ සඳහා බලවතකු බවට පත් වූ ක්‍රි. ව. 1644 න් පසුකාලය මුල්ගිරිගල වඩාත් කාර්යක්‍ෂම වූ වකවානුව විය. දිවයින පුරා අන්‍ය ආගම් ඇදහීම සඳහා සීමා පැනවූ ලන්දේසීන් මෙසේ බෞද්ධාගමික මධ්‍යස්ථානයක් වෙත සුවිශේෂී අවධානය යොමු කිරීම සැළකිය යුතු කරුණකි. මෙහිදී පැහැදිලි වනුයේ ලන්දේසීන් මුල්ගිරිගල ස්වාභාවික පිහිටීම හේතුවෙන් නොමග ගොස් තිබූ බවකි.

එනම් ලන්දේසීහු මෙම ස්ථානය ඇඩම්ස්බර්ග් හෙවත් ශ්‍රීපාදස්ථානය වශයෙන් වරදවා වටහා ගැනීමත් එහි ආදම් සහ ඒවගේ සුසාන භූමිය ඇති බවට සලකා අතිශය ගෞරවාදර දැක්වීමත් මත ය. ලන්දේසි හමුදා නිලධාරියකු සහ රචකයකු වූ ඇල්බ්‍රෙෂ්ට් හර්ෆෝර්ට් මුල්ගිරිගල භූමියේ ආදම්ගේ පිළිරුව ඇඳී ඇති බැව් සටහන් කළේ ය. මෙයට අමතරව ලන්දේසි ආණ්ඩුකාරවරුන් ද වෙනත් නිලධාරීන් ද මෙම විශ්වාසයන් පදනම් කරගනිමින් ඉතා දිගු කලක් මෙම ස්ථානයට සියළු සත්කාරයන් ඉටු කළහ. ලන්දේසීන් විසින් ඔවුහු වඩාත් ඇලුම් කළ ස්ථාන සහ විශේෂිත සිදුවීම් සියල්ල සිතුවමට නංවා ඇත. මුල්ගිරිගල ද පහත පරිදි සිතුවමට නංවා ඇත.

ලන්දේසීන් මෙම ස්ථානයට ඇඩම්ස්බර්ග් යනුවෙන් ව්‍යවහාර කළ බව කොරනේලිස් ජාන් සීමන්ස් ආණ්ඩුකාරවරයාගේ අවධියේ (ක්‍රි. ව. 1703 - 1707) දී තහවුරු වී ඇත. එනම් ඔහු වෙත පී. ටී. හෙල්මොන්ට් නැමැත්තකු විසින් යොමු කරන ලද ලිපියක ඇඩම්ස්බර්ග් සඳහා මාතර සිට දින දෙකක් තුළ ගමන් කළ හැකි බවත් එම ස්ථානය තංගල්ල සහ දෙවුන්දර ආසන්න ප්‍රදේශයක පිහිටුවා ඇති බවත් සඳහන්ව තිබීමෙනි. මෙකල ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා සපයන ලද වැලන්ටීන් විසින් ද මුල්ගිරිගල පිළිබඳ විස්තර සපයා ඇත. ඔහු ද මුල්ගිරිගල ඇඩම්ස්බර්ග් ලෙසින් විස්තර කර ඇත. එසේම හයිඩ් විසින් ද ස්ථානය පිළිබඳ විස්තරයක් සහ සැලසුම් ද සහිතව මුල්ගිරිගල, ඇඩම්ස්බර්ග් ලෙසින් විග්‍රහකර ඇත. ලන්දේසි යුගයේ විශාල කාල පරිච්ඡේදයක් පුරා මෙසේ මුල්ගිරිගල නම් බෞද්ධ මධ්‍යස්ථානය පිළිබඳව ගෞරවය දැක් වූ ලන්දේසීහු පසුකාලීනව එම දුර්මතයන් ඉවත්කර ගත් බව පෙනේ. එනම් ක්‍රි. ව. 1766 දී මෙම ස්ථානයට පැමිණි ඉමාන් විලෙම් ෆ්ලැක් ආණ්ඩුකාරවරයා විසින් එම ස්ථානයේ වැඩසිටි භික්ෂූන්වහන්සේලා සමග සාකච්ඡා කොට මෙම දුර්මතයන් ඉවතලන ලදී.

මුල්ගිරිගල ක්‍රි. ව. 1845 බ්‍රිතාන්‍ය අවධියේ දී පවා මෙම ස්ථානය පෙර මෙන් ජනප්‍රිය ස්ථානයක් විය. මුල්ගිරිගලට පැමිණි මුල්ම බ්‍රිතාන්‍ය ජාතිකයා 1799 දී එහි පැමිණි ජේම්ස් කෝඩිනර් වශයෙන් සැළකේ. එකල මෙම ස්ථානයේ යන්ත්‍ර මන්ත්‍ර කටයුතු සඳහා ප්‍රසිද්ධව සිටි සාමණේර හිමිනමක් වැඩසිටි අතර විහාරාධිපති හිමියන්ගේ අනුදැනුමකින් තොරව එම කටයුතු සිදු කිරීමට උන්වහන්සේට අවසර නොවී ය. එම කටයුතු සම්බන්ධයෙන් උන්වහන්සේ අවස්ථා කිහිපයක දී ම අවවාද කරනු ලැබ සිටියේ ය. දිනක් මෙහි පැමිණි ඉංග්‍රීසි ආණ්ඩුකාර-වරයෙකු විසින් පැරණි විහාරයේ හෙවත් වෙසක් විහාරයේ ඇති මහනුවර යුගයට අයත් විශාල පිළිම වහන්සේ දැක 'උඹලගෙ බුදුහාමුදුරුවෝ මෙච්චර ලොකු මොකද?'යි විමසා ඇත. එහිදී විහාරාධිපති හිමියන් සඳහන් කරනු ලැබ ඇත්තේ 'උන්වහන්සේ මහා බල සම්පන්න බැවින් මෙසේ විශාලව නෙලා ඇතිබව' ය. මෙහිදී අශෝභන ලෙස පිළමය මත හිඳ ගනු ලැබූ ආණ්ඩුකාරවරයා 'උඹලගේ බුදුන්ගේ බලය බලන්ට ඕනෑ' යනුවෙන් ප්‍රකාශ කර ඇත. එම ප්‍රකාශයත් සමගින් අපහසුතාවයට පත් විහාරාධිපති හිමියෝ කුඩා සාමණේර හිමි කැඳවා 'තැනේ අර නරකත් දැන් හොඳ යැ'යි සඳහන් කර ඇත. ලද අවසරයෙන් ක්‍රියාත්මක වූ සාමණේර හිමියන්ගේ ගුරුකම් හේතුවෙන් විදේශීය නායකයා ලේ හලමින් සිහිසුන්ව ඇඳ වැටුණ බව පැවසේ. මෙහිදී ආණ්ඩුකාරවරයාගේ භාර්යාව සහ සෙසු පිරිස විසින් කරන ලද ආයාචනාවලින් පසුව විදේශිකයා නැවත ප්‍රකෘති තත්ත්වයට පත්කරන ලදි. මෙම සිදුවීමෙන් අනතුරුව විහාරය සම්බන්ධයෙන් පැහැදීමට පත් විදේශීය ආණ්ඩුකාරවරයා මෙම ස්ථානයට ලුණු සපයා ගැනීමට තිබූ දුෂ්කරතාවය හඳුනාගෙන මාසිකව හම්බන්තොට ලේවායේ සිට ලුණු සම්පාදනය කර ගැනීමට ක්‍රමයක් සකස්කරන ලදි.



මුල්ගිරිගල දේශීය බෞද්ධයන්ගේ මුඳුන්මල්කඩක් බඳු ඉතා ගෞරවනීය ස්ථානයකි. මෙම ස්ථානය අතීතයේදී 'මුහුන්ද්ගිරි' යනුවෙන් හඳුන්වන ලද බවට දොළොස්වන සියවසට අයත් ශිලා ලේඛනයක් සාක්ෂි දරයි. පසුව සමුද්දපබ්බත, මුහුදු ගිරි, ගිරිබාලෙන, දක්ඛිණපබ්බත නමින් හඳුන්වන ලද අතර ලන්දේසීන් ඇතුළු අනෙකුත් විදේශිකයින් විසින් ඇඩම්ස්බර්ග් ලෙසින් හඳුන්වා ඇත. ඒ අනුව අතීතයේ පටන් ජාති ආගම් භේදයකින් තොරව දෙස් විදෙස් බැතිමතුන්ගේ අවධානයට යොමු වූ පුරාවිද්‍යාත්මක වශයෙන් සුවිශේෂී වැදගත් කමකින් යුත් ස්ථානයකි මුල්ගිරිගල.

**එච්. එල්. තරංගා කුමාරි**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර,
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
ගාල්ල.

# සැඟවුණු පුවතක් හෙළිකරන කිතුල්ගොඩ ටැම් ලිපිය

පුරාණ පස්යොදුන් කෝරළයේ මහ පත්තුවේ පිහිටා තිබෙන කිතුල්ගොඩ ග්‍රාමය පිටිසර සිරියාවෙන් අලංකෘත සරුසාර කෙත් වතුවලින් වටවූවකි. කිතුල්ගොඩ නාමයෙන්ම දක්වන පරිදි පුරාණ සිංහලයන්ගේ සාර වෘක්ෂය වන කිතුල්වලින් ස්වයංපෝෂිතය. දියපත්තුගම බෙල්ලන ආදී පරිවාර ගම්වලින් සැදි බැවින් එය සංස්කෘතික වශයෙන් හුදකලා ගමක්ද නොවීය. එහි කඳුගැටයක පවතින පැරණි විහාරයකි. මෙහි ආරම්භය දෙහිපිටියේ විපුලතිස්ස නම් ස්වාමීන් වහන්සේ නමකගෙන්ය. කැකුළන්දොළ පාර්ශවයේ ගරුකටයුතු ස්වාමීන් වහන්සේ නමක් වූ එතුමෝ සංඝරාජ හිමියන් විසින් ඇරඹි ශාසනික පුනර්ජීවනය නිසා පහතරට භික්ෂු පරපම්පරා ඇරඹි බෝධිමළුවේ පාරිශුද්ධ කොම්මල සංඝරක්ඛිත යන මහනාහිමිවරුන් ගේ සෙවණේ දැඩිවුණු අගලවත්තේ මේධංකර නායක හිමියන් ගේ ශිෂ්‍ය වරයෙකුද වෙයි.

කිතුල්ගොඩ ගණේගොඩැල්ල පුරාණ විහාර සමීපයෙහි පවතින පැරණි ස්ථාන ත්‍රිත්වයකි. එයින් එකක් නම් පැරණි බෝධි වෘක්ෂයයි. දෙවැන්න නම් බුද්ධ මන්දිරයයි. තෙවැන්න නම් පැරණි ආවාස ගෘහයයි. මෙයින් තෙවැන්න වූ ආවාස ගෘහය ජරාවාසව නටබුන් වී ගිය හෙයින් එය ඉවත් කර ඇත. එහි ගල් අවශේෂ තැන තැන දක්නට තිබේ. බෝධි වෘක්ෂය පුරාණ ගම් සීමාවට මුහුණ ලා දොළ ඉස්මත්තේ ඉහත්තාවට වන්නට පිහිටා තිබේ. බුද්ධ මන්දිරය පැරණි ඕලන්ද ගෘහ නිර්මාණ ශිල්පයට නෑකම් කියන පරිදි නිමවූවක් විය. එහි තිබූ සිංහල උළු ඉවත් කර දැන් අභිනවයෙන් රට උළු සෙවිලි කර තිබේ. මෑතකදී එහි අභ්‍යන්තරයේ චිත්‍ර ප්‍රතිසංස්කරණයෙදී නුවර යුගයට අයත් ලෙසට සැලකෙන චිත්‍ර කීපයක් මතු වී තිබේ. එයට පසු කාලීන වුවද දහනම වන සියවසේ මුල් භාගයට අයත් යැයි සැලකිය හැකි මනා චිත්‍ර සමූහයක් බුදු මැදුර ඇතුලත පිහිටා තිබේ. එහි ඇති තවත් විශේෂයක් නම් කතරගම සහ විෂ්ණු ප්‍රතිමා ද්විත්වයයි. මෙම ප්‍රතිමාවන් හිඳි පිළිම වීමද මෙහිදි සැලකිල්ලට ගත යුතුය. නාථ මෛත්‍රී ප්‍රතිමා මෙන් ඉතා ශෝභමානව සකස් කර තිබෙන අතර බුදු මැදුර අභ්‍යන්තරයේ පැවතීමෙන් පෙනී යන්නේ



එහි ඇති පුරාණ බවයි. ප්‍රතිමා ද්විත්වයේම අත් සතරකි. විෂ්ණු දේව ප්‍රතිමාව නිල් පැහැයෙන් සායම් කර ඇති බැවින් පැරණි දේව සංකල්පයක් වන උපුල්වන් දෙවිඳු සිහිපත් වේ. මේ නිසා මේ බුද්ධ මන්දිරය දහඅට වන සියවසේ සිට දහනව වන සියවස දක්වා ක්‍රමිකව විකාශනයට පත් නිර්මාණයක් බවට ද හඳුන්වාදිය හැකිව තිබේ.

බුද්ධ මන්දිරය සහ විහාරස්ථානය පැරණි වුවද එහි අගය විමසන්නට කිසිවෙකුත් ඉදිරිපත් නොවීම පුදුමයකි. ගම් වැසි හුදී ජනයාගේ දුක් කම්කටුලුවල දී මේ දේව ප්‍රතිමා අභියස දී කළ බාර හාරයන් සඵල වීමෙන් එම ස්ථානය කෙරෙහි තිබෙන විශ්වාසයන් පරම්පරා ගණනාවක් තිස්සේ බලවත් වී තිබේ. එහෙත් මෙහි තිබෙන එක් වැදගත් ස්මාරකයක් පිළිබඳව අවධානය යොමු වූයේ ඉතා මෑතකදීය. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ බුද්ධ මන්දිරයේ චිත්‍ර මතුකර ගන්නට පියවර ගන්නා අවස්ථාවේදී බුද්ධ මන්දිරයට ඉදිරියෙන් මිදුලේ තිබූ ගල් ටැම් කැබැල්ලක් හමුවීමෙන් පසුව එහි ඇති පුරාණ කම වටහා ගෙන එය පිටපත් කර ගන්නට යෙදුණි. එහි ලියා තිබුණේ නමින් කරවූ වාසලයි යනුවෙනි. මෙම විහාරයේ තත් විහාරාධිපති පූජ්‍ය ඕවිටිගල විමලධම්ම ස්වාමීන් වහන්සේගෙන් මේ පිළිබඳ විමසන කල්හි උන්වහන්සේ ගේ මතකයට නැගුනේ කිතුල්ගොඩ ගමේ කිරිමැටිදොළ පදිංචිව සිටින වයෝවෘද්ධ පුද්ගලයෙකු පිළිබඳවයි. ඔහු නමින් කලන්ත්‍රිගේ ලූවිස් විය. මේ ගල් ටැම් කැබැල්ලේ සැඟවුණු ඉතිහාසයක් පවතින්නේ යැයි සැක කළ බැවින් ඔහු හමුවට පැමිණියෙමි. වයසින් අනූ විය ඉක්ම වූ නමුත් ඔහු ගේ මතකය පැහැදිලිය. ශ්‍රවණය මදක් දුර්වල නමුත් අප වෙතද කාරුණික විය. මේ ඔහු කියූ කතා පුවතයි.



'මහත්තයෝ පරාක්‍රමබාහු රජු දවස ඔහුගේ සෙන්පති ප්‍රතිරාජ අමාත්‍යවරයා පස්දුන් වළල්ලාවිටි කෝරළවල ගම් අස්වද්දන්නට යොදා තිබුණා. තැනින් තැන සංචාරය කරමින් ගම් ප්‍රධානීන් පත් කරමින් යන එන ගමන්වලදි වළල්ලාවිටි කෝරළයේ පිටිගල ප්‍රදේශයේ කළ රාජ්‍ය විචාරීමෙන් පසු එහි ගනේගොඩ නම් විහාරයක්ද කරවා එන ගමනේ මේ කිතුල්ගොඩ ග්‍රාමයේ කඳුගැටයක් උඩ නාගසක් සෙවණේ දහවල් භෝජනයට මදක් නැවතුණා. ඒ කාලයේ අමාත්‍යවරු ලැගුම් ගන්නා විට තාවකාලික වාසලවල් තනනවා. ඉතින් ඇමතිවරයා සමග ගිය සෙන්පතියෙක් ට මේ වාසල තැනීම භාරවුණා. ඔහු නමින් සෑගිරි තන්ත්‍රිනා වෙනවා. ගම දකුණේ. ඉතින් මේ වාසලේ මදක් විවේක ගත් ප්‍රතිරාජ අමාත්‍යවරයා සෑගිරි තන්ත්‍රිනා නොහොත් සෙන්පතියා කැඳවා ඔහුට ප්‍රසංශා කර කිතුල්ගොඩ ගම්වරය ඔහුට දෙමින් ආඥාවක්ද නිකුත් කළා. ගම් අස්වද්දන්නටත් ගම් වැසියන් පදිංචි කොට සශ්‍රීක කරන්නටත් ඔහුට භාරවූ රාජකාරියයි. ඉතින් ඔහු එහි නැවතී ඒ කාරිය කරවා වාසල පිහිටවූ තැන ටැම් ලිපියක් පිහිටවූවා. ප්‍රතිරාජ අමාත්‍යවරයා යළිත් ගම් බලන්නට එන අවස්ථාවලදී මේ ස්ථානයේ ලැගුම් ගන්නට ඇතැයිද විශ්වාස කරනවා.'

දඹදෙණිය, කෝට්ටේ යන යුග දෙකෙහිම මේ ප්‍රතිරාජ අමාත්‍ය යන නාමය භාවිතා වී තිබේ. දඹදෙණියේ දෙවනි පරාක්‍රමබාහු රජුගේ බෑනා වූයේ ශ්‍රී වර්ධන ප්‍රතිරාජ අමාත්‍යවරයාය. ඔහු පස්යොදුන් කෝරළයට පැමිණ කළුතර සිට බෙන්තර දක්වා පොල් උයනක්ද කරවූ බව සඳහන්ය. දෙවෙනිව සඳහන් වූ ශ්‍රී වර්ධන ප්‍රතිරාජ පළමු කී අමාත්‍යවරයාගේ මුණුපුරෙකි. ඔහුද පස්යොදුන් කෝරළය භාරව පැමිණ අගලවත්තේ කැකුළන්දොළ විහාරය තනවා ගම් බිම්අස්වද්දා මහත් සේවයක් කළ තැනැත්තෙකි. මෙම ලිපියේ සඳහන් කිතුල්ගොඩ විහාරයේ පවතින සැඟවුණු පුවතට සම්බන්ධ වන්නේ දෙවනුව කී ප්‍රතිරාජ අමාත්‍යවරයා බව නිසැකය. ටැම් ලිපියේ උඩ කොටස අස්ථානගතව තිබෙන නමුත් ලූවිස් මහතා ප්‍රකාශ කළ පරිදි එහි ඇත්තේ සෑගිරි තන්ත්‍රිනා නයිදේ නමින් කරවූ වාසලයි යන පාඨය අනුව මෙම ලිපිය පසලොස්වන සියවසට අයත් වෙයි. මෙම වාසල පසුකාලයේදී විශේෂයෙන්ම නුවර යුගයේදී විහාරස්ථානයක් බවට පත් වූ ආකාරය ද පැහැදිලිය.

මෙම ලිපිය සැකසීමේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මානෙල් දෙවිකා මහත්මිය ගෙන් ලද සහයෝගය අගය කරමි.

**මතුගම සෙනෙවිරුවන්**
ස්වාධීන පුරාවිද්‍යා ගවේෂක

# පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක විශේෂ ව්‍යාපෘති

පසුගිය වසර කිහිපය මුළුල්ලේ අඛණ්ඩව සිදුකරමින් පැවැත එන සංවර්ධන ව්‍යාපෘතීන් බොහොමයක් මේ වසරේ ද ක්‍රියාත්මක අතර, නීලගිරිය, යුධගනාව, දිඝවාපිය වැනි අතිවිශාල දාගැබ් මෙන්ම උතුරුමැද පළාතේ නවාගල සහ උණගලාවෙහෙර දාගැබ් සංරක්ෂණය සහ ඓතිහාසික රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානයේ සංරක්ෂණ කටයුතු, යාපනය කොටුව සංරක්ෂණ කටයුතු ද ඒ අතර වේ. ඉහත සංරක්ෂණ කාර්යන්ට අමතරව අවුකන සහ මාළිගාවිල වැනි සුවිශාල බුද්ධ ප්‍රතිමාවලට මෙන්ම පොළොන්නරුව තිවංක පිළිමගෙයට ආවරණ වහළ යෙදීම, මඩුවන්වෙල වලව්ව සහ නූපේ පැරණි ඕලන්ද වෙළඳසැල සංරක්ෂණය සහ එහි කෞතුකාගාරයක් ස්ථාපිත කිරීම, අනුරාධපුර නව සංචාරක බංගලාව ඉදිකිරීම ද ඉන් ප්‍රධාන තැනක් ගනී.

ඉහත සුවිශේෂී කාර්යන්ට අමතරව දෙපාර්තමේන්තුවේ ස්ථාපිත එක් එක් අංශ යටතේ පළාත් මට්ටමින් මධ්‍ය හා සුළු පරිමාණ ව්‍යාපෘති 500 ට ආසන්න ප්‍රමාණයක් සිදු කර ඇත.








## යාපනය ඕලන්ද කොටුව සංරක්ෂණය


යාපනය ඕලන්ද කොටුව සංරක්ෂණ කටයුතු වසර කිහිපයක් යටතේ අඛණ්ඩව පවත්වා ගෙන එනු ලබන අතර, පසුගිය වසරෙහි එහි වැඩබිම් අංක 11, 12 සහ 13 යටතේ අට්ටාලයේ කටයුතු සහ වැඩබිම් අංක 14 යටතේ කොටු බැම්මේ සහ ප්‍රවේශ මාර්ගයේ කටයුතු සිදුකරන ලදි. මේ සඳහා 2016 වසරේ වැය කරන ලද මුදල රු. මිලියන 16,907 කි. 2017 වසර සඳහා ද ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි.

## උණගලා වෙහෙර සහ නවාගල දාගැබ් සංරක්ෂණය

**"පිබිදෙමු පොළොන්නරුව"** සංවර්ධන වැඩසටහන යටතේ පොළොන්නරුවේ උණගලා වෙහෙර දාගැබ සංරක්ෂණ කටයුතු ද අතිගරු ජනාධිපතිතුමාගේ මග පෙන්වීම මත ක්‍රියාත්මකවේ. මේ වනවිට දාගැබ සංරක්ෂණ කටයුතු හා මළුව සකස් කිරීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර, කොත පැලැන්දවීමේ කටයුතු පමණක් සිදු කිරීමට ඇත. මේ සඳහා මූල්‍ය දායකත්වය ජනාධිපති ලේකම් කාර්යාලය මගිනි.

අනුරාධපුර තලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඓතිහාසික නවාගල ස්ථූපයේ සංරක්ෂණ කටයුතු මේ වනවිට සාර්ථකව සිදු කරමින් පවතින අතර, මෙමගින් සිදු කරනු ලබන්නේ මෙම ඉපැරණි චෛත්‍යය ප්‍රතිනිර්මාණය කිරීමකි. මේ සඳහා දැනට වැය කරන ලද මුදල රු. මිලියන 2.23 කි.

- **නැගෙනහිර පළාත් පුරාවිද්‍යා ගවේෂණය**
- ඉහත සුවිශේෂී කාර්යයන්ට අමතරව නැගෙනහිර පළාත් පුරාවිද්‍යා ස්ථාන වාර්තා කිරීමේ ව්‍යාපෘතිය සඳහා මේ වසරේ ප්‍රමුඛස්ථානයක් ලබාදී ඇති අතර, මේ වනවිට ගවේෂණ කණ්ඩායම් 06 ක් මඩකළපුව දිස්ත්‍රික්කයේ ගවේෂණ කටයුතු සිදු කරමින් පවතී. දැනටමත් පුරාවිද්‍යා ස්ථාන 3500ට කට ආසන්න ප්‍රමාණයක් වාර්තා කර ඇත. අම්පාර දිස්ත්‍රික් ගවේෂණ කටයුතු 2015 වර්ෂයේදී සිදුකරන ලද අතර, මඩකළපුව දිස්ත්‍රික් ගවේෂණය අවසන් කිරීමෙන් පසු නැගෙනහිර පළාතම ආවරණය වන පරිදි ත්‍රිකුණාමල දිස්ත්‍රික් ගවේෂණය ද ආරම්භ කිරීමට යෝජිතය. මීට සමගාමීව උතුරු නැගෙනහිර පුරාවිද්‍යා ස්ථාන මැණුම් කර, මායිම් ලකුණු කිරීම හා එම ස්ථාන ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු ද මේ වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
- **චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතිය**
- තව ද දිවයින පුරා විසිරී ඇති චංචල පුරාවස්තු ලේඛනගත කිරීම මෙම වසරේ සිට විධිමත් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකාවේ විවිධ ආයතන සහ පුද්ගලයන් සතු සියලුම චංචල පුරාවස්තු වාර්තාකරණය හා ඒ ඇසුරින් පරිගණක දත්ත බැංකුවක් සකස් කිරීම මෙහි මූලික අරමුණ වේ. ප්‍රාදේශීය මට්ටමින් තොරතුරු ඒකරාශි කිරීම මේ වනවිට ආරම්භ කර ඇති අතර, මෙහි මුල් පියවර ලෙස චංචල පුරාවස්තුවල හිමිකාරිත්වය දරන රාජ්‍ය ආයතන, පූජනීය ස්ථාන, කෞතුකාගාර, පෞද්ගලික ආයතන සහ පුද්ගලයන් සතු පුරාවස්තු ප්‍රමුඛතා අනුපිළිවෙලකට සකස් කිරීම සිදු කරන අතර, සෑම පුරාවස්තුවක්ම නියමිත අකෘති පත්‍රයකට අනුව, සැලසුම් සහ ඡායාරූප සහිතව වාර්තාගත කිරීම සිදු කරනු ලබයි.









■ **මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති**

පළාත් මට්ටමින් පුරාවිද්‍යා ස්ථාන රැසකම මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ සංරක්ෂණ කටයුතු ආරම්භ කර ඇත.

## මිහින්තලේ මහ සෑ මළුව සංරක්ෂණය

මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ යුධ හමුදා සහාය ද ඇතිව මිහින්තලේ මහ සෑ මළුව සංරක්ෂණ කටයුතු සාර්ථකව සිදුකරනු ලබන අතර, මළුවේ සංරක්ෂණ කටයුතු 65 % ක් පමණ අවසන් කර ඇත.

■ **පහත සඳහන් ව්‍යාපෘති ද මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 150කට වැඩි ප්‍රමාණයක් ද ක්‍රියාත්මක වේ.**

දීඝවාපී දාගැබ, නීලගිරි දාගැබ, යුධගනාව උඩ දාගැබ, යාපනය කොටුව, මිහින්තලේ සේල චෛත්‍ය මළුවේ ප්‍රාකාර බැම්ම, කොළඹ රාජකීය විද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ල,බුදුරුවගල ශෛලමය පිළිමගෙය, කෝට්ටේ කොටුබැම්ම, කොටහේන දීපදුත්තාරාමයේ පැරණි ආවාසගෙය, අත්තනගල්ල රජමහා විහාරය, වලල්ගොඩ ටැම්පිට විහාරය සංරක්ෂණය, බලවින්න පුරාණ ගංගාරාම විහාරය සංරක්ෂණය, මාම්පිටිය විහාරයේ ආවාසගෙය සංරක්ෂණය, සපුගස්කන්ද විහාරයේ පැරණි විහාරගෙය සංරක්ෂණය, කොටවාය රජමහා විහාරයේ ධර්ම ශාලාව සංරක්ෂණය, හියාරේ අශ්වාරාම විහාරයේ ධර්මශාලාව සංරක්ෂණය, වලස්මුල්ල අතුබෝදේ පුරාණ විහාරයේ විහාරගෙය සංරක්ෂණය, තෙල්වත්ත රන්පත් විහාරයේ ආවාසගෙය සංරක්ෂණය, මෝරගම්මන ආවාසගෙය සංරක්ෂණය, වට්ටාරම චෛත්‍ය සංරක්ෂණය, මීගමුව වෙඩි බෙහෙත් ගබඩාව සංරක්ෂණය, බොල්තුඹේ සමන් දේවාලය සංරක්ෂණය, ශිලා පොක්බරණී පුරාණ විහාරය සංරක්ෂණය, පරමධම්ම පිරිවෙන ශිෂ්‍ය නේවාසිකාගාරය අලුතෙන් සැකසීම, ගොමදියගාල පුරාණ විහාරය සංරක්ෂණය, කටුබලන්ද පුරාණ විහාරයේ වහල සංරක්ෂණය, ඉංගිරිය දීපාලෝක විහාරය සංරක්ෂණය, නාලන්දා ගෙඩිගේ සංරක්ෂණය, යාපනය සක්කෝට්ටේ ඕලන්ද පල්ලිය සංරක්ෂණය, දඹුල්ල රජමහා විහාරය සංරක්ෂණය, මඩහපොළ ටැම්පිට විහාරයේ බිතු සිතුවම් හා මූර්ති සංරක්ෂණය, පිළිකුත්තුව රජමහා විහාරයේ ලෙන් සිතුවම් සංරක්ෂණය, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ශෛලමය පුරාවස්තු සංරක්ෂණය, හැබැස්ස පිළිම සංරක්ෂණය, දාබරේ නිවස අලුත්වැඩියා කිරීම, හොරවඩුන්න ශ්‍රී සුදර්ශන ශෛලබිම්බාරාම විහාර පිළිමගෙය සංරක්ෂණය, පඬුවස්නුවර පුරාවිද්‍යා භූමියට වැටක් ඉදිකිරීම, යාපනය ශාන්ත ජේම්ස් දේවස්ථානයේ ප්‍රාකාර බැම්ම ප්‍රතිසංස්කරණය, වීදණ්ඩාවල විහාරයේ සංඝාවාසය සංරක්ෂණය, වෙලේකඩේ පැරණි වෙළඳපළ නඩත්තුව හා භූ දර්ශනය සකස් කිරීම.

# කන්දෙගෙදර ටැම්පිට විහාරයෙහි බුදු පිළිම සංරක්ෂණය අවසන් අදියරේ

**පී. කේ. සුජීවා ප්‍රියංගනී**
සංවර්ධන සම්බන්ධීකරණ නිලධාරී
ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් අංශය

කෑගල්ල දිස්ත්‍රික්කයෙහි දේවාලේගම පිහිටි මෙම ටැම්පිට විහාරය නුවර ශෛලියෙහි මූර්ති හා සිතුවම් දක්නට ලැබුණු ටැම්පිට විහාරයකි. කලක් වර්ෂාවට ලක්වීමෙන් අවාසනාවන්ත ලෙස විනාශයට පත් ව තිබූ මෙම විහාරයෙහි, වාස්තු විද්‍යාත්මක ප්‍රතිනිර්මාණ කටයුතු අවිස්සාවේල්ල ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයෙහි වාස්තු විද්‍යා සංරක්ෂණ අංශයෙන් සිදු කිරීමෙන් පසු එහි ප්‍රතිමා සංරක්ෂණ කටයුතු සබරගමුව පළාතෙහි රසායන සංරක්ෂණ අංශය විසින් සිදුකරනු ලැබේ. මෙම සංරක්ෂණ කටයුතු සඳහා ප්‍රතිපාදන සැපයීම මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සිදු කරනු ලැබේ.

කුඩා ටැම්පිට විහාරයක් වූ මෙහි ප්‍රධාන ප්‍රතිමාව හිඳි බුද්ධ ප්‍රතිමාවකි. ඊට ඉදිරිපසින් දෙපස හිටි බුද්ධ ප්‍රතිමා දෙකකි. මෙම ප්‍රතිමාවන්හි පිහිටීම හඳුනාගත හැකි වූයේ පැරණි ඡායාරූපවලින් පමණි. වහලය කැඩී දීර්ඝ කාලයක් වර්ෂා ජලයට තෙමීම නිසා බිත්ති හා ගෙබිමෙහි බදාම ස්ථර දිය වී ගොස් ඉතිරිව තිබුණේ විහාරයට ප්‍රවිෂ්ටය සැලසූ ප්‍රධාන දොරටුව හා පිටුපස බිත්තිය පමණි.



ප්‍රධාන හිඳි බුද්ධ ප්‍රතිමාවෙහි ආසනය හා පහත කොටස් කැඩී, ප්‍රතිමාවෙහි ඉතිරි කොටස ගැළවී ගොස් විනාශ වූ ගෙබිම මත තිබුණු අතර ප්‍රතිමාවෙහි ශේෂිත බදාම ස්ථර බෙහෙවින්ම දුර්වල වී තිබිණි. සියුම් සෙළවීමකදී පවා කැඩුණු ප්‍රතිමාවෙහි කොටස් මහත් ආයාසයෙන් තහවුරු කිරීමෙන් පසු පිළිමයෙහි සෙසු සංරක්ෂණ කටයුතු සම්පූර්ණ කරන ලදි.

හිටි බුද්ධ ප්‍රතිමා දෙකෙහි කොටස් කිහිපයක් පමණක් විහාරාධිපති හිමියන් විසින් සුරැකිව තබා තිබුණු හෙයින් උක්ත ප්‍රතිමා කොටස්හි ප්‍රමාණයන්ට හා ශෛලීන්ට අනුකූල වන පරිදි හා පැරණි ඡායාරූපයන්ට අනුව සංරක්ෂණ කටයුතු සිදු කරන ලදි. මේ වන විට අවසන් නිමැවුම් කටයුතු සිදු කරනු ලබන ප්‍රධාන ප්‍රතිමාවට වම් පස පිහිටි හිටි බුද්ධ ප්‍රතිමාවෙහි ප්‍රතිනිර්මාණ කටයුතු අවසන් කිරීමෙන් පසු ටැම්පිට විහාරයෙහි ඇතුළත ප්‍රතිමා සංරක්ෂණය අවසන් කෙරේ.

**ඩී. ඩබ්ලිව්. මංජුලා චාන්දනී ප්‍රේමරත්න**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
අවිස්සාවේල්ල පුරාවිද්‍යා කාර්යාලය

# 2016 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද මෙහෙවර

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන අතුරින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හිමිවනුයේ සුවිශේෂී ස්ථානයකි. ඒ මේ රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරනු ලබන සුවිශේෂී මෙහෙවර නිසාමය. භූමි ප්‍රමාණයෙන් කුඩා වූ දිවයිනක පිහිටා ඇති ලක්ෂ සංඛ්‍යාත පුරාවස්තු අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කරදීම එම මෙහෙවරේ එක් පැතිකඩකි. ප්‍රෞඩ ඉතිහාසයක සාඩම්බර හිමිකරුවන් බවට පත් වන්නට ශ්‍රී ලංකාවාසීන්ට නිරායාසයෙන් අත්වැල් සපයන, පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය කරමින් එය සුරක්ෂිත කිරීමේ අධිකාරී බලය සතු ප්‍රධානතම ආයතනය වනුයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවයි.**

**පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව උරුම කළමනාකරණය වඩාත් සක්‍රිය මට්ටමකට ගෙන ඒම වෙනුවෙන් සිය ආයතනික ව්‍යුහය විවිධ දිශානතීන් ඔස්සේ ස්ථාපිත කර ඇත. ගවේෂණ, කැණීම්, වාස්තු විද්‍යා, රසායන සංරක්ෂණ, ප්‍රකාශන ආදී ලෙස ශාස්ත්‍රීය සේවාවන් ආයතනය තුළ ස්ථාපිත කරමින් මහජනතාව වෙනුවෙන් සුවිශේෂ මෙහෙවරක් ඉටුකරයි.**

**2016 වර්ෂයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නැංවූ සුවිශාල ව්‍යාපෘති ප්‍රමාණය 600 ඉක්මවයි. යථෝක්ත දැවැන්ත ව්‍යාපෘති අතුරින් කිහිපයක් පමණක් පළාත් මට්ටමින් මෙලෙස පෙළගස්වමු.**

## බස්නාහිර පළාත

බස්නාහිර පළාත් පුරාවිද්‍යා කාර්යාලය මගින් කොළඹ, කළුතර, ගම්පහ යන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ, කැණීම්, වාස්තු විද්‍යා සංරක්ෂණ, රසායනික සංරක්ෂණ, නඩත්තු, කෞතුකාගාර, ප්‍රවර්ධන, අභිලේඛන හා නාණක විද්‍යා යන සියලු ශාස්ත්‍රීය අංශවල උපදේශකත්වයෙන් ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරන ලදි.

ගවේෂණ අංශය මගින් චංචල පුරාවස්තු ලේඛනගත කිරීම, කොට්ඨාස මට්ටමින් කෙරෙන ගවේෂණ, ඛනිජ නිස්සාරණ කටයුතු සඳහා ස්ථාන පරීක්ෂා කර නිර්දේශ ලබා දීම, දෛනික ස්ථාන පරීක්ෂා කිරීම, පැරණි ස්ථාන හා ස්මාරක ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කිරීම, ඇතුළු වැඩ කටයුතු රාශියක් සිදුකර ඇත. කොට්ඨාස මට්ටමින් කෙරෙන ගවේෂණ යටතේ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැලණි ගංගාවට මායිම් වන ග්‍රාම නිලධාරී කොට්ඨාස 20 කට ආසන්න ප්‍රමාණයක් ගවේෂණය කර ඇති අතර සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම සේවා වසම් දහයක් ආවරණය වන පරිදි සියලුම පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුක්ත ස්ථාන සහ ස්මාරකවල මූලික ගවේෂණයක් සිදු කරන ලදි. මෙම ලේඛනගත කිරීමට භාජනය වූ ස්ථාන හා ස්මාරක කීපයක් පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජනා කර ඇත.

චංචල පුරාවස්තු ලේඛනගත කිරීම යටතේ කඩවත පහළ කරගහඅමුණ ගස් වීදණ්ඩ පුරාණ රජමහ විහාරයේ චංචල පුරාවස්තු ලේඛනගත කිරීම සිදු කරන ලදී.

කැණීම් අංශය මගින් කෝට්ටේ නව ඉදිකිරීම් වෙනුවෙන් නිර්දේශ ලබාදීම සඳහා පර්යේෂණ කැණීම් පමණක් සිදු කර ඇත.

වාස්තු විද්‍යා සංරක්ෂණ යටතේ 2016 ආරම්භ කරන ලද උඩුතුත්තිරිපිටිය ශ්‍රී ආරියන්දාරාමයේ ආවාසගේ සංරක්ෂණය, ඇතගම ජයසුමනාරාමයේ පැරණි ආවාසගේ සංරක්ෂණය, බුදුගහගොඩ ජය සුමනාරාමයේ පිළිමගේ සංරක්ෂණය සහ රත්මලාන පරමධම්මචේතිය පිරිවෙන් විහාරයේ වර්ෂ 175 ක් පමණ පැරණි ආවාසගේ සංරක්ෂණ කටයුතු සම්පූර්ණයෙන් අවසන් කිරීම සිදු කර ඇත.

අපහසු බැවින් වාර්ෂිකව කොටස් වශයෙන් සිදුකරගෙන යනු ලබයි. ඒ අනුව මෙම වර්ෂයේ අලකේශ්වර පාරේ පිහිටි බැම්ම දික් අඩි 100 ක කොටසක් 18" x 12" x 8" කබොක් ගල් යොදා ගනිමින් සංරක්ෂණය කර ඇත. ඉංගිරිය දීපාලෝක විහාරය හා කොටහේන දීපදුත්තාරාමයේ පැරණි ආවාස ගෙය ද මේ ආකාරයටම සංරක්ෂණය කර ඇත. සියලුම සංරක්ෂණ ව්‍යාපෘති සඳහා සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන ලැබී ඇත.

දෙහිවල සුබෝධාරාම පුරාණ විහාරයේ පැරණි ආවාසගෙයි ඉතිරි කොටස, මීගමුව කොටුව, කැලණිය පෙතියාගොඩ ධර්මාකර විහාරය සහ උඩුවර ශ්‍රී බෙත්තාරාම විහාරයේ සීමාමාලක නිවස සංරක්ෂණ කටයුතු කිරීමට සූදානම් කර ඇත.

බස්නාහිර පළාතේ සියලුම රසායනික සංරක්ෂණ කටයුතු ප්‍රධාන කාර්යාලය මගින් සෘජු අධීක්ෂණය යටතේ සිදු කරනු ලබයි.



උඩුතුත්තිරිපිටිය අරියනන්දාරාමයේ ආවාසය සංරක්ෂණයට පෙර හා පසු



රත්මලාන පරමධම්මචේතිය පිරිවෙන සංරක්ෂණයට පෙර හා පසු

මීට අමතරව මීගමුව පැරණි බලකොටුව තුළ පිහිටි ලන්දේසි යුගයට අයත් වෙඩි බෙහෙත් ගබඩා ගොඩනැගිල්ල සංරක්ෂණය කර ඇත.

අත්තනගල්ල වටදාගෙයි ඇතුලත පිඟන් ගඩොල් ගෙබිම සංරක්ෂණය සඳහා කැණීම් කිරීමේ දී අනුරාධපුර යුගයට අයත් ශෛලමය සලපතල මළුව මතුකර ගැනීමට හැකි විය. ඒ අනුව පැරණි මළුව සම්පූර්ණයෙන්ම කැණීම් කර ගල් පුවරු සුදුසු පරිදි මට්ටම් කර නැවත පැරණි ආකාරයටම සංරක්ෂණය කිරීමට හැකිවීම තුළින් අත්තනගල්ල වටදාගෙයි පුරාවිද්‍යාත්මකව වැඩි වීමට හේතු වනු ඇත. කෝට්ටේ රාජධානියේ පෞරාණික කොටු පවුර විශාල වශයෙන් හානියට පත්ව ඇත. මෙහි සංරක්ෂණ කටයුතු එකවර සිදු කිරීමට

ස්ථාන 07 ක් රසායන සංරක්ෂණ කටයුතු සිදු කර ඇත.

නඩත්තු අංශය මගින් දිස්ත්‍රික්ක 03ක් ආවරණය වන පරිදි කලාප කාර්යාල 06ක් යටතේ වාර්ෂික නඩත්තු කටයුතු සිදු කරමින් ස්මාරක හා ස්ථාන නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි.

කෞතුකාගාර අංශය මගින් කෝට්ටේ කෞතුකාගාරය පවත්වාගෙන යාම හා ගොරකාන කන්ද පුරාණ විහාරයේ පුරාවිද්‍යා උරුමය පිළිබඳ පාසල් ළමුන් හා ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සිදු කර ඇත.

**මහින්ද කරුණාරත්න**
සහකාර අධ්‍යක්ෂ (බස්නාහිර)

## දකුණු පළාත

ජාතික උරුමය කළමනාකරණය කිරීමේ මහඟු කර්තව්‍යයට දායක වෙමින් 2016 වර්ෂයේදී දකුණු පළාත් පුරාවිද්‍යා කාර්යාලය මඟින් ගාල්ල, මාතර දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ව්‍යාපෘතීන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී.

2016 වර්ෂයේ ගවේෂණ අංශය යටතේ ස්ථාන පරීක්ෂාවන් හා ක්ෂේත්‍ර කටයුතු සිදු කරනු ලැබූ අතර ඒ යටතේ අනවසර කැණීම් 17ක්, කළුගල් නිස්සාරණ ව්‍යාපෘතීන් 214 ක්, ස්ථාන පරීක්ෂාවන් 69ක්, පුරාවස්තු විනාශයන් 14ක්, ආරක්ෂිත ස්මාරක ප්‍රකාශයට පත් කිරීම් 8ක් ආදී වශයෙන් ස්ථාන පරීක්ෂාවන් සිදු කොට වාර්තා ලබා දීම සිදු කර ඇත. එසේම චංචල පුරාවස්තු ලේඛණගත කිරීමේ ව්‍යාපෘතිය 2016/06/27 දින සිට 2016/11/17 වන දින දක්වා ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද අතර එහිදී 16,17,18 වැනි සියවස් වලට අයත් මාධ්‍යන්ගෙන් නිර්මිත වටිනා කෞතුක වස්තූන් රාශියක් වාර්තා ගත කිරීමට අවකාශය ලැබිණ.



චංචල පුරාවස්තු ලේඛනගත කිරීම

වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය යටතේ මෙම වසරේ ව්‍යාපෘතීන් 06ක් ක්‍රියාත්මක කරනු ලැබූ අතර ඉන් ව්‍යාපෘතීන් 05ක් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතීන් විය. මාතර මොටාගෙදර සුමංගලාරාම විහාරයේ විහාරගෙය, සංරක්ෂණ අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් සිදු කළ සංරක්ෂණයක් වූ අතර මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ මාතර උඩපීක්වැල්ල ගංගාරාම විහාරයේ විහාරගෙය, හක්මන ඇතිනිමලාරාමය විහාරයේ විහාරගෙය, බූස්ස සුදර්ශනාරාම විහාරයේ සංඝාවාසයේ ගෙබිම ආදිය සංරක්ෂණය කිරීමට පියවර ගන්නා ලදී.

එමෙන්ම හියාරේ අශ්වත්තාරාම විහාරයේ ධර්මශාලාව ඉතා අබලන්ව පැවති නිසා කඩිනමින් ඉටු කළ යුතු සංරක්ෂණ කාර්යයක් ලෙස සලකා එම ස්මාරකය පූර්ණ වශයෙන් සංරක්ෂණයට බඳුන් කරන ලදී. පසු කාලීනව මෙහි විහාරාංග වලට සිදු කරනු ලැබූ මැදිහත් වීම් නිසා විවිධ වෙනස්කම් වලට බඳුන්ව තිබූ යම් යම් වාස්තු විද්‍යාත්මක අංගයන් නැවතත් නිසි පරිදි ස්ථාන ගත කිරීමට පියවර ගැනීම ද මෙම සංරක්ෂණ කාර්යයන් හරහා සිදු කරනු ලැබූ තවත් වැදගත් කර්තව්‍යක් වූ අතර ජාතික පුරාවිද්‍යා දිනයට සමගාමීව තෙල්වත්ත රත්පත් විහාරයේ ආවාස ගෙය සංරක්ෂණය කිරීමට පියවර ගැනීම මඟින් ද අත්‍යාවශ්‍යව තිබූ බොහෝමයක් සංරක්ෂණ අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අවකාශ ලැබිණ.

එසේම ගාලු කොටුවේ නෙප්චූන් හා ට්‍රයිටන් මුර අට්ටාල අතර ගිලා බැස තිබූ ප්‍රාකාර බැම්ම සංරක්ෂණයට පියවර ගැනීම ද සිදු කරන ලදී. එහිදී ගිලා බැස ගිය ස්ථාන තවදුරටත් සේදී යාම වළක්වමින් එම ආරුක්කුවේ ගැලවී ගිය කොටස් සංරක්ෂණය කරන ලද අතර පස් කියුබ් 18ක් පුරවා ගිලා බැස ගිය කොටසේ සංරක්ෂණ කටයුතු සාර්ථක ලෙස නිමා කරන ලදි.



මාතර මොටාගෙදර සුමංගලාරාම විහාරය සංරක්ෂණය අතරතුර



හියාරේ අශ්වත්ථාරාමය සංරක්ෂණය කරන අතරතුර



වාඩුවැලිවිටිය ගංගාරාම විහාරය සංරක්ෂණය අතරතුර

මෙම වසරේ කැණීම් අංශය මඟින් මහගල්වැව මෙගලිතික කැණීම සිදු කරමින් මහාශිලා යුගයේ සුසාන සංස්කෘතිය සම්බන්ධව අනාවරණය කර ගනු ලැබූ තොරතුරු වාර්තා ගත කිරීම සිදු කරන ලදී.

රසායන සංරක්ෂණ අංශය මඟින් වාඩුවැලිවිටිය ගංගාරාමය, දොඩන්දූව ශෛලබිම්බාරාමය යන විහාරයන්හි බිතුසිතුවම් සංරක්ෂණය ද බූස්ස විහාරයෙහි ලීස්තර කොටස් මූර්ති සංරක්ෂණය කිරීම ද කරපුටුගල ජයසංහාරාම විහාරයේ ප්‍රතිමා ගෘහයෙහි සංරක්ෂණ අවශ්‍යතාවය සලකා සිතුවම් සහිත බිත්ති පිරිසිදු කිරීම සහ ගර්ත පිරවීම සිදු කරන ලද අතර තොටගමුව සුභද්‍රාරාම පුරාණ විහාරයේ සහ දික්වැල්ල ගල්කන්ද පුරාණ විහාරයේ ද මූර්ති ප්‍රකෘතිමත් කිරීම සිදු කරන ලදී.



පරවාහැර අම්බලම සංරක්ෂණයට පෙර



පරවාහැර අම්බලම සංරක්ෂණයට පසු

ප්‍රවර්ධන අංශය හරහා 2016 ජාතික පුරාවිද්‍යා සතිය නිමිති කොට ගෙන ගාල්ල, මාතර දිස්ත්‍රික්ක දෙක කේන්ද්‍ර කර ගනිමින් පාසල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. තෙල්වත්ත රත්පත් විහාරය සහ මාතර තාරකා කොටුව ආශ්‍රිත නගර වල මෙම ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර එහිදී පුරාවස්තු විනාශය, පුරාවස්තු පිළිබඳ දුර්මත ආදිය පිළිබඳ අත් පත්‍රිකා මඟින් දැනුවත් කිරීම සිදු කරන ලදී.



පාසල් සිසුන් සඳහා දේශන පැවැත්වීම


**ඒ. ඩී. එම්. ඩබ්. කේ. කේ. අලහකෝන්,**
ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ
(ගාල්ල/මාතර)

## සබරගමුව පළාත

ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය සමස්ත ශ්‍රී ලාංකීය ජනතාවගේම අයිතියකි. එබැවින් ඒවා ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම යනු රටේ මානව සංවර්ධනයේ ප්‍රධානතම අංගයක් ලෙස සැලකිය යුතු අතර, ඒවාට කිසියම් හානියක් සිදුවුවහොත් එය ප්‍රතිලෝමනය හා ප්‍රතිස්ථාපනය නොකළ හැකි සම්පතක්ය යන පදනම සැලකිල්ලට ගෙන ජාතික පුරාවිද්‍යා ප්‍රතිපත්තියකට අනුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සිය කාර්යභාරය ඉටු කරනු ලබයි.

සබරගමුව පලාත තුළ රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්ක දෙක සඳහා 2016 වර්ෂයේදී ද වෙනත් වර්ෂවලදී මෙන්ම ව්‍යාපෘති රාශියක්ම එක් එක් අංශවලට අදාලව ඉටු කරන ලදී. මේ සඳහා භාණ්ඩාගාරයෙන් ලැබෙන වාර්ෂික ප්‍රතිපාදන, විශේෂ ව්‍යාපෘති සඳහා ලැබෙන ප්‍රතිපාදන, මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලැබෙන ප්‍රතිපාදන සහ වෙනත් ආයතන මගින් ලැබෙන ප්‍රතිපාදන යොදවන ලදී.

ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශයේ 2016 වසරේදී ප්‍රධාන ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක වූ අතර, එයින් කෑගල්ල දිස්ත්‍රික්කයේ මහ-බෙලිගල පර්වත ගවේෂණය තුන්වන අදියර හා චංචල පුරාවස්තු වාර්තාකරණය සිදුකරන ලද අතර, රත්නපුර දිස්ත්‍රික්කයේ බුදුගල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ගවේෂණය වැදගත් වේ. මෙහිදී පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් ස්මාරක රැසක් ඡායාරූප, GPS කණ්ඩාංක සහ සැලසුම් සහිතව වාර්තාගත කිරීමට හැකිවිය. මීට අමතරව චංචල පුරාවස්තු ලේඛනගත කිරීම, ගල්තලා පරීක්ෂා කිරීම සහ කෑගල්ල, රත්නපුර දිස්ත්‍රික්කයන් හි ක්ෂේත්‍ර පරීක්ෂණ හා පසුවිපරම් කටයුතු, අනවසර කැණීම් පරීක්ෂා කිරීම, ඛනිජ නිස්සාරණය සඳහා නිර්දේශ සැපයීම ආදී විවිධ රාජ්‍ය ආයතනයන්ගෙන් සිදු කරන ලද ඉල්ලීම් සඳහා අවශ්‍ය රාජකාරිමය වගකීම් ඉටු කරන ලදී.



බුදුගල වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ආශ්‍රිත ගවේෂණය

කැණීම් අංශය යටතේ සබරගමුව පළාත තුළ ප්‍රධාන කැණීම් දෙකක් (2) සාර්ථකව අවසන් කිරීමට හැකිවිය. එම කැණීම් ද්විත්වයම රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වන අතර, මානව ක්‍රියාකාරකම් හේතුවෙන් දැඩි සේ විනාශ වීමේ තර්ජනයට ලක්වූ ප්‍රධාන මාර්ගය ආසන්නයේ හුදකලා වූ උඩගම දාගැබ හා විහාරස්ථාන භූමියක පැවති වෙහෙරගොඩැල්ල මේ අනුව සියලු දත්ත සහිතව කැණීමට ලක්විය.

2016 වසර සඳහා කෞතුකාගාර ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක වූ අතර, දැදිගම කෞතුකාගාරය පවත්වාගෙන යාම හා මඩුවන්වෙල කෞතුකාගාරය පවත්වාගෙන යාම සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන හිමි වූ අතර මඩුවන්වෙල කෞතුකාගාරයේ ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා පොදු තැන්පත් අරමුදල් යටතේ ප්‍රතිපාදන හිමිවිය. විශේෂ ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ මඩුවන්වෙල කෞතුකාගාරය හා තොරතුරු මධ්‍යස්ථානය සැලසුම් කිරීම තෙවන අදියර ක්‍රියාත්මක විය. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ උපදෙස් පරිදි අදියර කිහිපයක් යටතේ ශ්‍රී ලංකාවේ එකම හා පරිපූර්ණ වලව් කෞතුකාගාරය බවට මඩුවන්වෙල වලව්ව පරිවර්තනය කිරීම සඳහා මෙයින් ක්‍රියාකාරකම් කිහිපයක් සිදුවිය. ඒ යටතේ පැරණි වලව් ගෘහ භාණ්ඩ සැපයීම, සංචාරකයින් සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය මගින් තොරතුරු සැපයීමට අවශ්‍ය උපකරණ සැපයීම සිදුවිය.

වාස්තු විද්‍යා සංරක්ෂණය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. තෝලංගමුව ධර්මශාලාවේ වහලය, බිත්ති සංරක්ෂණය, බෙලිගම්මන ධර්මශාලාව සංරක්ෂණය, මෝරාගම්මන විහාරයේ ආවාසගෙය සංරක්ෂණය, මාම්පිට විහාරයේ ආවාසගෙය සංරක්ෂණය, වට්ටාරම විහාරයේ චෛත්‍ය සංරක්ෂණය, කෑගල්ල ජුබිලි අම්බලම සංරක්ෂණය, කන්දෙගෙදර ටැම්පිට විහාරයේ රසායන සංරක්ෂණ කටයුතු මේ යටතේ සාර්ථකව යෝජිත කොටස් අවසන් විය.

රත්නපුර දිස්ත්‍රික්කයේ බලවින්න පුරාණ විහාරයේ සංරක්ෂණ වැඩ අවසන් කිරීම, වලල්ගොඩ ටැම්පිට විහාරය සංරක්ෂණය, බුදුගල පැති බැම්ම සංරක්ෂණය, මඩුවන්වෙල වලව්ව සංරක්ෂණ වැඩ අවසන් කිරීම, බොල්තුඹේ සමන් දේවාලයේ සංරක්ෂණය ආදිය සිදු කරන ලදී.

කන්දෙගෙදර ටැම්පිට විහාරයේ වහලය, බිත්ති සහ ඇතුලත ප්‍රතිමා ශීඝ්‍ර ලෙස විනාශ වෙමින් පැවති අතර කඩිනම් වාස්තු විද්‍යා සංරක්ෂණ කාර්යයක් සේ සලකා මෙම විහාරය සංරක්ෂණය කරන ලදී. එහිදී එහි



ටැම්පිට විහාරය සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

ඇතුළත පිහිටි දැඩි ලෙස දිරාපත්ව පැවති බුද්ධ ප්‍රතිමාව ආරක්ෂා කර ගනිමින් සංරක්ෂණය සිදු කිරීම අභියෝගයක්ව පැවතුණි. නමුත් නිලධාරීන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කැපවීම මත එම අභියෝගය ජය ගනිමින් සංරක්ෂණ කාර්යයේ 100% ක පමණ ප්‍රමාණයක් මේ වන විට අවසන්ව ඇත. වටකණු යෙදීම, බීරලු රාමු යෙදීම, උළු සෙවිලි කිරීම, පේකඩ යෙදීම, වරිච්චි යෙදීම, සිවිලිම, ගේට්ටුව, ප්‍රධාන දොර යෙදීම ආදිය සිදුවිය.

2016 වසර තුළ සබරගමුව පළාතේ රසායන සංරක්ෂණ කටයුතු සඳහා ව්‍යාපෘති 05ක් ප්‍රධාන වශයෙන් ක්‍රියාත්මක වූ අතර, හදිසි රසායන සංරක්ෂණ කටයුතු ද සිදුවිය. අරම පැරණි බුද්ධ ප්‍රතිමාව සංරක්ෂණය, ලෙනගල රජමහා විහාරයේ සිතුවම් සංරක්ෂණය කැපී පෙනේ.

සබරගමුව පළාත් පුරාවිද්‍යා ස්ථාන නඩත්තු කටයුතු වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වෙන්ව තිබූ අතර, ඒ යටතේ පළාතේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පුරාවිද්‍යා ස්ථාන නඩත්තුව, තහවුරු කිරීම, ආරක්ෂාව සහ පවත්වාගෙන යාමේ කටයුතු සඳහා යොදවන ලදී.

ප්‍රවර්ධන අංශය යටතේ 2016 වසරේදී පාසල් පුරාවිද්‍යා සංගම් පිහිටවූ පාසල්වල මෙන්ම පුරාවිද්‍යා සංගම් නොවූ පාසල්වල ද ජාතික උරුමය, පුරාවිද්‍යාව හා ප්‍රාග් ඉතිහාසය සම්බන්ධයෙන් දේශන පැවැත්වීම සිදුකරන ලදී. ඉතිහාසය නව විෂය නිර්දේශය අනුව ඇතුළත් වන පුරාවිද්‍යාත්මක කරුණු පිළිබඳ පාසල් ගුරුවරුන් මෙන්ම ශිෂ්‍යයින් ද මනා දැනුමක් මෙම දේශන තුළින් ලබා ගන්නා ලදී. මෙ පාසල් පුරාවිද්‍යා සංගම් පිහිටුවන ලද පාසල් පුස්තකාල සඳහා පුරාවිද්‍යා ප්‍රකාශන කට්ටලය බැගින් පරිත්‍යාග කරන ලදී.

පුරාවිද්‍යා ප්‍රවර්ධන වැඩසටහන් අතුරින් කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ දේශන පවත්වන ලදී.

**එම්. ඒ. එස්. ටී. කේ. මදුරප්පෙරුම**
සහකාර අධ්‍යක්ෂ (කෑගල්ල/රත්නපුර)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
අවිස්සාවේල්ල.

## මධ්‍යම පළාත

මහනුවර, මාතලේ, නුවරඑළිය යන දිස්ත්‍රික්ක ත්‍රිත්වයෙන් සමන්විත මධ්‍යම පළාත් පුරාවිද්‍යා බල ප්‍රදේශය තුළ 2016 වසරේ සිදුකරන ලද ගවේෂණ, කැණීම්, කෞතුකාගාර, රසායන සංරක්ෂණ, වාස්තු විද්‍යා සංරක්ෂණ, නඩත්තු සහ ප්‍රවර්ධන යන අංශයන් ප්‍රධාන කොට ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාවට නංවන ලදී.

ගවේෂණ අංශය මඟින් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගවේෂණය හා කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පෞරාණික විහාරස්ථාන 5 ක් ගවේෂණය කිරීම සිදුකරන ලදී. චංචල පුරාවස්තු ලේඛනගත කිරීම යටතේ හුරිකඩුව ගල්පිහිල්ල විහාරය හා අත්තරගම රජමහ විහාරය ලේඛනගත කිරීම සිදුකෙරිණ. තව ද ස්ථාන පරීක්ෂාව හා ගල් බිඳුම් ස්ථාන පරීක්ෂාව මෙන්ම නීති කටයුතු හා හානි ඇගයුම් ද සිදු කෙරිණ.

කැණීම් අංශය මඟින් ගම්පොළ සිංහපිටිය මාලිගාගොඩැල්ල, විල්ගමුව සෝනුත්තර විහාරයේ දාගැබ කැණීම හා හඟුරන්කෙත කොට්ටල වලව්ව කැණීම සිදුකරන ලදී. කෞතුකාගාර අංශය යටතේ ගඟවට කෝරළේ මහනුවර කෞතුකාගාරය පවත්වාගෙන යාම, මහනුවර කෞතුකාගාරය ප්‍රතිසංවිධානය සහ නාලන්ද ගෙඩිගේ තොරතුරු මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සිදු කෙරිණ.

වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය මඟින් ගලේවෙල මීවලපතහ චෛත්‍යවර්ධනාරාම විහාරයේ දාගැබ සංරක්ෂණය හා පාතහේවාහැට සගම විහාරයේ විහාරගේ සංරක්ෂණය සිදුකෙරිණ. රසායන සංරක්ෂණ අංශය යටතේ යටිනුවර දියකෙළිණාවල විහාරය සිතුවම් හා මූර්ති සංරක්ෂණය, කොත්මලේ පුසුල්පිටිය විහාරය සිතුවම් හා මූර්ති සංරක්ෂණය, උඩුනුවර ඇම්බැක්ක දේවාලයේ සිතුවම් හා මූර්ති සංරක්ෂණය සිදුකරන ලදී.



නඩත්තු අංශය මඟින් මධ්‍යම පළාත් නඩත්තු කලාප 11 ට අදාළ ව කලාප පවත්වාගෙන යාම වසර පුරා සිදුකරන ලදී. ඊට අමතරව සීගිරිය ක්ෂේත්‍ර නිවාසය අලුත්වැඩියාව, මැදවල විහාරයේ වාහල්කඩ නඩත්තු කිරීම, ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම, කැටපිටිය විහාරයේ විහාරගේ වහලය සහ සොල්දරය නඩත්තු කිරීම සිදුකරන ලදී. එමෙන්ම මාර්ග සංඥා පුවරු 25 ක් සිටුවීම ද සිදුකරන ලදී.

තවද පල්ලේපොල ශ්‍රී වේළුවනාරාම විහාරයේ පැරණි අටුවේ වහල අලුත්වැඩියා කිරීම, මහනුවර නාගවිමාන විහාරස්ථ බුදු මැදුරේ වහලය නඩත්තු කිරීම, මහනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ වහල නඩත්තු කිරීම, ඇම්බැක්ක දේවාලයේ සිංහාසනය නඩත්තු කිරීම, ගඩලාදෙණිය විහාරයේ විහාරමළුවේ ගල් ඇතිරීම, ගනේගොඩ දේවාලයේ වහල නඩත්තු කිරීම, කඩුගන්නාව ධර්මසර විහාරයේ සංඝාවාසයේ වහලය නඩත්තු කිරීම යන ව්‍යාපෘතීන් කාර්ය අනුමැතිය පමණක් ලබාගෙන සිදුකරන ලදී.

ප්‍රවර්ධන අංශය යටතේ ව්‍යාපෘතීන් කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. මෙහිදී මාසික ශාස්ත්‍රීය දේශන මාලාව ඇස්තමේන්තුව යටතේ, කාර්යාල නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන්, බාහිර ආයතන නිලධාරීන් (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සංස්කෘතික නිලධාරීන්, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල සහ පුරාවිද්‍යා විෂයට කැමැත්තක් දක්වන පුද්ගලයන් ඉල්කක ගත කරමින් විවිධ තේමාවන් ඔස්සේ මසකට එක බැගින් දේශන 12 ක් පවත්වන ලදී. පුරාවිද්‍යා සම්මන්ත්‍රණ වැඩසටහන ඇස්තමේන්තුව යටතේ මධ්‍යම පළාතේ තෝරාගත් පාසල් 20 කින් සිසු සිසුවියන් 200 ක් වෙනුවෙන් පුරාවිද්‍යා සම්මන්ත්‍රණ වැඩසටහනක් මහනුවර ශ්‍රී දළදා මාලිගා ශ්‍රවණාගාරයේ දී පවත්වන්නට යෙදුණි. 2016 පුරාවිද්‍යා සතියට සමගාමීව මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම සිදුකරන ලදී. එහිදී කන්ද උඩරට පුරාවිද්‍යා උරුමය මැයෙන් අත් පත්‍රිකා 10000ක් මුද්‍රණය කර බෙදාහැරීමට ද කටයුතු කෙරිණ. ඊට අමතරව බාහිර ආයතනවලින් (ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සංස්කෘතික මධ්‍යස්ථාන, පාසල්, පොලීසි, වෙළඳ, වාණිජ හා සංචාරක කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, කලාප අධ්‍යාපන කාර්යාල) ලැබෙන ආරාධනාවන්ට අනුව සම්පත් දායකත්වය ලබාදීම ද සිදුකෙරිණ.

**එල්. එම්. ගුණතිලක බණ්ඩා**
සහකාර අධ්‍යක්ෂ (මධ්‍යම)
පුරාවිද්‍යා පළාත් කාර්යාලය,
මහනුවර.

## උතුරුමැද පළාත

කැණීම් දත්ත විශ්ලේෂණ අංශය මඟින් වැලිවතුරේගම විහාරයේ පැරණි ගොඩනැගිල්ලේ කැණීම් කටයුතු සඳහා රු. 75000 ක ඇස්තමේන්තු ගත මුදලක් වෙන් කරවාගෙන කාර්ය ආරම්භ කරන ලද අතර එහි ප්‍රගතිය 95 % ප්‍රතිශතයකින් ඉතා සාර්ථකව නිම කරන ලද අතර එම කැණීම මගින් අදාළ විහාරස්ථානයේ ශේෂව පැවති ගොඩනැගිල්ල මතු කරගනිමින් එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය යන අංශ දෙකම ඉතා විශිෂ්ට ප්‍රතිපල ලබා ගනිමින් අවසන් කළ අතර එහිදී නිලධාරීන්ගේ මනා කැපවීම හා උත්සාහය මගින් සුවිශේෂී ජයග්‍රහණයක් කරා එම කටයුතු රැගෙන යාමට හැකි විය.

අනුරාධපුර ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ ගවේෂණ අංශය මඟින් 2016 වර්ෂයේදී අනුමත කර ගන්නා ලද ව්‍යාපෘති යෝජනා අතර සුවිශේෂී ව්‍යාපෘතිය වශයෙන් ක්‍රියාත්මක කරන ලද චංචල පුරාවස්තු ලේඛන ගත කිරීම ව්‍යාපෘතිය මූල්‍ය හා භෞතික ප්‍රගතිය 100% කින් අවසන් කරන ලද අතර එම ව්‍යාපෘතිය මගින් පොළොන්නරුව කලාප තුනේ සියලුම පුරාවස්තු ලේඛන ගතකොට අවසන් වාර්තා සකස් කොට එම ව්‍යාපෘති වාර්තා ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය වෙත භාර දී ඇත. මේ වන විට පොළොන්නරුව කලාප සියල්ලටම අයත් පුරාවස්තුවල සවිස්තරාත්මක වාර්තාවක් ඡායාරූප සහිතව අප දෙපාර්තමේන්තුව සතුව ඇත.

වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය මඟින් මෙම වර්ෂයේදී මිලියන 2.63 ක දෙපාර්තමේන්තු ගත මුදලින් නවාගල චෛත්‍ය සංරක්ෂණ කටයුතු අවසන් කරන ලද අතර ඉතා සාර්ථක සංරක්ෂණ කටයුත්තක් සිදු කරන ලදී. 2016 වර්ෂයට අදාළව අනුරාධපුර දිස්ත්‍රික්කය මගින් ක්‍රියාත්මක කරන ලදී.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සියලුම පුරාවිද්‍යා ස්ථාන කලාප 13 කට බෙදා නඩත්තු හා ප්‍රවර්ධන කටයුතු හා පවත්වාගෙන යාම සිදු කරනු ලැබේ.

අනුරාධපුර කලාප 13 අතරින් ඉතා සුවිශේෂ කලාපය වශයෙන් අනුරාධපුර විශේෂ කලාපය හැඳින්විය හැකි අතර ඇතුල්නුවර විශේෂ ආරක්ෂිත කලාපයද මෙම කලාපයට අයත්ය. අනුරාධපුර පූජා නගරයේ සියළුම කටයුතු ද මෙම කලාපයට අයත් වන අතර එමගින් පූජා නගරයේ පූජනීයත්වය හා පෞරාණිකත්වය ආරක්ෂා කර ගනිමින් පවත්වාගෙන යාමේදී නොයෙක් අසීරුතාවයන්ට මුහුණපාමින් ප්‍රගතිය කරා ගමන් කිරීමට හැකි විය.

2016 වර්ෂය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ සුවිශේෂී ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කළ අතර ඒ අතර පූජා නගරයේ





නොයෙක් ස්ථානවල අපිළිවෙළට රථවාහන ගාල් කිරීම අඩු කිරීමේ අරමුණින් භික්ෂු විශ්ව විද්‍යාලය ආසන්නයේ සිට රුවන්වැලිසෑය දක්වා මාර්ගය දෙපස රුපියල් මිලියන 0.55 ක වියදමින් ආරක්ෂිත කණු සකස් කර ඒවා මේ වන විට මාර්ගය දෙපස සිටුවා අවසන් කොට ඇත.

එමෙන්ම නව සංචාරක බංගලාවේ අඩුපාඩු සියල්ල සම්පූර්ණ කිරීමේ කටයුතු ද මේ වර්ෂයේ අවසන් කාර්තුවේදී සිදුකළ අතර 2017 වර්ෂයේදී එය විවෘත කොට පරිශීලනයට ගත හැකි අයුරින් සියලු කටයුතු අංග සම්පූර්ණ කළ හැකි විය.

විජයාරාමය පුරාවිද්‍යා ස්ථානය ශුද්ධ පවිත්‍ර කොට පවත්වාගෙන යාම සඳහා විශාල සේවක පිරිසක් හා පිරිවැයක් දැරිය යුතු අතර මිලියන 0.5 ක මුදලක් වැය කරමින් එම ව්‍යාපෘතියද ඉතා හොඳින් අවසන් කිරීමට හැකි විය.

මිහින්තලය මහසෑයේ සලපතල මළුව සංරක්ෂණ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන අතර එම සංරක්ෂණ කටයුතු ද ඉතා සාර්ථක අන්දමින් අවසන් වෙමින් පවතී.

ප්‍රවර්ධන අංශයට අදාළ සුවිශේෂී වූ ව්‍යාපෘතිය 2016 වසරේදී සිදුවිය. එනම් පුරාවිද්‍යා දිනයට සමගාමීව අනුරාධපුර ඇතුල්නුවර අනවසර පදිංචි කරුවන් නිසා සිදුවන පුරාවස්තු හානිය හා එමගින් සිදු වන අති විශාල හානිය හා මෙමගින් භූමියට සිදු වන හානිය පිළිබඳව ගෙන් ගෙට ගොස් මහජනතාව දැනුවත් කිරීම හා පුරාවස්තු හානියක් සිදුකිරීමෙන් ලැබිය හැකි දඬුවම් පිළිබඳව පෞද්ගලිකව ජනතාව දැනුවත් කිරීමට ලැබීම තුළින් ප්‍රායෝගිකව ප්‍රගතියක් අත්පත් කරගත හැකි විය.

උතුරුමැද පළාතට අයත් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුළ පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සුවිශාල සංවර්ධන කටයුතු රාශියක් සිදු වන අතර එම ව්‍යාපෘතිය මගින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොළොන්නරු දිස්ත්‍රික්කයට අදාළ සංවර්ධන ව්‍යාපෘති රාශියක් ද එමගින් ආවරණය කරනු ලබයි. උණගලා වෙහෙර චෛත්‍ය සංරක්ෂණ කටයුතු සඳහා මෙම වර්ෂයේදී රු. මිලියන 30 ක් ලැබුණු අතර එම මුදලින් චෛත්‍යයේ ගර්භය දක්වා සංරක්ෂණය කළ අතර මේ වන විට එහි ගර්භයේ නිධන් වස්තු තැන්පත් කිරීමද අවසන් කර ඇත.

පොළොන්නරු දිස්ත්‍රික්කයට අදාළව කලාප 03 ක් පවතින අතර එම කලාප මගින් පුරාවිද්‍යා භූමි හා ස්මාරක නඩත්තු කර පවත්වාගෙන යාම ප්‍රශස්ත මට්ටමකින් සිදුකරනු ලබන අතර එහි ප්‍රගතිය ද ඉතා ඉහළ ප්‍රතිශතයකට පැමිණ තිබේ.

**ඩී. එම්. බී. ජේ. බී. දිසානායක**
ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ
(අනුරාධපුර - පොළොන්නරුව)

## ඌව පළාත

අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඌව පළාත් පුරාවිද්‍යා කාර්යාලය මගින් 2016 වර්ෂය තුළදී පළාතේ ජාතික උරුමයන් ආරක්ෂා කර ගැනීමෙහිලා සුවිශේෂී වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී. එම වැඩසටහන් මාලාවේදී අතීත උරුමයන් හඳුනා ගැනීම, ලේඛනගත කිරීම හා විනාශ වෙමින් පවතින පුරාවිද්‍යාත්මක ස්ථාන හඳුනාගෙන ආරක්ෂාව සඳහා පිළියම් යෙදීම ඇතුළුව පළාතේ ජාතික උරුමයන් අනාගත පරපුර උදෙසා ආරක්ෂා කර ගැනීමට සමගාමීව මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී ජනවාරි මාසයේ සිට මැයි මාසය දක්වා සියලුම වැඩසටහන් පළාතක් වශයෙන් බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්ක දෙකම ඒකාබද්ධව සිදු කරනු ලැබීය. මැයි මාසයෙන් පසුව පළාතේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තු කාර්යයන් පරිපාලනයේ පහසුව තකා මොනරාගල හා බදුල්ල වශයෙන් ප්‍රාදේශීය කාර්යාල දෙක ස්ථාපිත කර ඉදිරි කටයුතු පවත්වා ගෙන යන ලදී.

එහිදී ගවේෂණ අංශය මගින් ඌවේ අතීත උරුමයන් හඳුනාගැනීම සහ ලේඛනගත කිරීමේ කාර්යයේදී චංචල පුරාවස්තු ලේඛනගත කිරීම, පුරාවිද්‍යා භූමි සහ පුරාවස්තු සොරකම් වාර්තා කිරීම හා පළාතේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සමගාමීව සිදුකෙරෙන පුරාවිද්‍යා හානි ඇගයීම්, ගල් බිඳුම් හා ඛනිජ කැණීම් ස්ථාන පරීක්ෂා කර නිර්දේශ ලබාදීම යනාදී කාර්යයන් රැසක් සිදු කරන ලදී.

ඌව පළාතේ නඩත්තු අංශය මගින් බදුල්ල දිස්ත්‍රික්කයට අදාළ වූ නඩත්තු කලාප තුනක් යටතේ ප්‍රධාන වැඩබිම් පවත්වාගෙන යාමට අමතරව කලාප මට්ටමින් පුරාවිද්‍යා ස්මාරක භූමිවල නඩත්තු කටයුතු ක්‍රියාත්මක කර එම ස්මාරකවල ආරක්ෂාව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත සිදු කරන ලදී.

ඌව 01 කලාපය පවත්වාගෙන යාම යටතේ නාගදීප රජමහා විහාරයේ ස්වාභාවික හේතූන් නිසා හායනයට පත්ව තිබූ සෙල්ලිපි ආවරණය විශේෂ පන්තියේ දැව යොදා නඩත්තු කටයුතු සිදු කිරීම, ගිරාඳුරුකෝට්ටේ පාසල් භූමියේ නටබුන් පොයින්ට් කර නඩත්තු කටයුතු සිදු කරන ලදී.



ගිරාඳුරුකෝට්ටේ ස්තූපය



නාගදීප සෙල්ලිපි ආවරණය

දිස්ත්‍රික්කයේ ඇති සංචාරක බංගලා අතරින් නාගදීප සංචාරක බංගලාව පවත්වාගෙන යාම යටතේ බංගලාවේ වාර්ෂිකව සිදු කළ යුතු නඩත්තුව සිදු කර ආගන්තුකයින්ගේ සිත්ගන්නා සුළු ස්ථානයක් බවට පරිවර්තනය කිරීමට හැකි විය.

ඌව 02 කලාපය පවත්වාගෙන යාමේ ව්‍යාපෘතිය යටතේ බෝගොඩ රජමහා විහාර භූමියේ වූ පැරණි ආවාසගෙයි වහලය හා ගොඩේගෙදර රජමහා විහාරයේ පැරණි පිළිමගෙයි වහලය නඩත්තුව ඇතුළුව රාවණාඇල්ල රජමහා විහාරයේ පැරණි පිළිමගෙයි ගෙබිම නඩත්තු කර නව ඉදිකිරීම් ඉවත්කර පිළිමගෙය විධිමත් කිරීම සහ කලාපයේ සංරක්ෂිත ගොඩනැගිලි වහලවල නඩත්තු කටයුතු සිදු කිරීම 2016 වසර තුළ සිදු කරන ලදී.



ගොඩේගෙදර රජමහා විහාරය

මීට අමතර වශයෙන් ඌව 02 කලාපයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඇටම්පිටිය පැරණි අම්බලම ප්‍රදේශයේ සුමිතුරු ග්‍රාම සංවර්ධන සමිතියේ ද්‍රව්‍ය සැපයීම මත පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ශ්‍රම දායකත්වයෙන් ස්මාරකයේ නඩත්තු කටයුතු විධිමත් පරිදි සිදු කර පරිහරණයට සුදුසු අයුරින් සකස් කරන ලදී.

ඌව 03 කලාපය පවත්වාගෙන යාමේ ව්‍යාපෘතියට අනුව සොරතුණේ දේවාලයේ පත්තිනි දේවාලයේ වහලයේ ඉතිරි කොටස නඩත්තු කිරීම හා කැප්පෙටිපොල පැරණි බලකොටුවේ බැම්ම නඩත්තුව සහ දියතාව සංචාරක බංගලාවේ භූ දර්ශනය සකස් කිරීමත් සිදු කරනු ලැබීය.



ඇටම්පිටිය අම්බලම නඩත්තුවට පෙර




ඇටම්පිටිය අම්බලම නඩත්තුවට පසු

බදුල්ල දිස්ත්‍රික්කයේ දියතලාව සංචාරක බංගලාව නඩත්තු ව්‍යාපෘතියට අදාළව බංගලාවේ පැරණි අගුපිළ ඉවත්කොට නව අගුපිළ සැකසීම ඇතුළු බංගලාවේ වාර්ෂික නඩත්තු කටයුතු සිදු කිරීමෙන් ස්ථානය ආකර්ෂණීය සංචාරක බංගලාවක් බවට පරිවර්තනය සඳහා කටයුතු කරන ලදී.

මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ වැලිමඩ කළුබුලුලන්ද විහාරයේ වහලය නඩත්තු කටයුතු සහ වෙළේකඩේ වෙළඳපළේ වහලය නඩත්තු කිරීම සහ භූ දර්ශනය සැකසීම සිදු කරනු ලැබීය.

බදුල්ල ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ ප්‍රවර්ධන අංශය මඟින්ද සුවිශේෂී කාර්යභාරයක් පුරාවස්තු ආරක්ෂා කර ගැනීමෙහිලා ඉටු කරනු ලැබීය.

එහිදී පාසල් සිසුන්, රාජ්‍ය නිලධාරීන් සහ සාමාන්‍ය ජනතාව අතර ප්‍රදේශයේ ඓතිහාසික පුරාවිද්‍යාත්මක ස්මාරක පිළිබඳව අවබෝධය ලබාදීම සඳහා ජංගම ප්‍රදර්ශන පුවරු සකස් කර ගැනීමට හැකිවීම අප විසින් සිදු කරන ලද සුවිශේෂී කාර්යය අවශ්‍යතාවයකි.

**ඉනෝකා බාලසූරිය**
ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ (බදුල්ල)

## අම්පාර - මඩකලපුව දිස්ත්‍රික්ක

අම්පාර පුරාවිද්‍යා කාර්යාලය මගින් අම්පාර හා මඩකළපු දිස්ත්‍රික්කවල ප්‍රධාන ව්‍යාපෘති 09ක් ක්‍රියාත්මක කරනු ලැබිණි. එනම්, දීඝවාපි දාගැබ සංරක්ෂණය, නීලගිරි දාගැබ සංරක්ෂණය, ඕවාගිරිය දාගැබ ප්‍රතිසංස්කරණය, මඟුල් මහා විහාරයේ පෙත්මං සැකසීම, කොටවෙහෙර මළුව සැකසීම පුරාවිද්‍යා ස්ථානය සඳහා මායිම් කණු සකස් කිරීම, ඕවාගිරිය පුරාවිද්‍යා ස්ථානයට විදුලිය ලබා ගැනීම, මඩකළපු කලාප කාර්යාලයේ අලුත්වැඩියා කිරීම, ප්‍රාදේශීය කාර්යාලයේ ක්ෂේත්‍ර නිවාසය අලුත්වැඩියා කිරීමයි.

අම්පාර දිස්ත්‍රික්කයේ සුප්‍රකට විහාරස්ථානයක් ලෙස දීඝවාපි රාජ මහා විහාරස්ථානය හඳුන්වාදිය හැකි ය. මෙහි විද්‍යමාන රියන් 185ක උසකින් යුත් දාගැබ ක්‍රි.පූ. 2 වන ශතවර්ෂය දක්වා දිවෙන ඉතිහාසයකට උරුමකම් කියන්නකි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් දාගැබේ කැණීම් කටයුතු හා සංරක්ෂණ කටයුතු 1970, 1978, 2010, 2013 වර්ෂවල දී සිදුකොට තිබේ. දීඝවාපි දාගැබේ සංරක්ෂණ කටයුතු සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් මිලියන දහයක් ද දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මිලියනයක් ද වෙන් කෙරිණි.

අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි නීලගිරි දාගැබ නැගෙනහිර පළාතේ සුවිශාලත්වයෙන් යුතු දෙවන දාගැබයි. නීලගිරිය වූකලී කාලයාගේ



ඇවෑමෙන් කැලයට යට වූ විහාර සංකීර්ණයකි.

නීලගිරි දාගැබේ කැණීම් හා සංරක්ෂණ කටයුතු 1979, 1983, 1998, 2012, 2014, 2015 වර්ෂවල සිදුවිය. දාගැබේ ජේසාව සහ ගර්භය සකස් කිරීම 2016 දී ආරම්භ කරන ලදී. ඒ අනුව ගරාවැටුණු කොටස් ඉවත්කොට චෛත්‍ය පාදා ගැනීම ආරම්භ කෙරිණි. චෛත්‍යයේ ජේසාව නිමකොට ගර්භයේ අඩි 5 ක් පමණ වැඩ වර්ෂාවසානය වනවිට නිම කරනු ලැබී ය. මේ සඳහා රු. ලක්ෂ 80ක ප්‍රතිපාදන වෙන්විය.

අම්පාර දිස්ත්‍රික්කයේ පොල්වත්ත ග්‍රාමයේ පිහිටා ඇති ඕවාගිරිය සුන්දර මෙන් ම අගනා පුරාවිද්‍යා ස්ථානයකි. අනුරාධපුර යුගයට අයත් යැයි සැලකිය හැකි ආරාම සංකීර්ණ ලක්ෂණ මෙහි ඇති පුරාවිද්‍යාත්මක සාධකවලින් විද්‍යමාන වෙයි. පාරිසරික සාධක හේතුවෙන් මෙහි දාගැබේ ගඩොල් ගැලවී යෑම සිදුවිය. 2016 සැප්තැම්බර් මස 19 දින දාගැබේ ගැල වී තිබූ ගඩොල් කොටස් ඉවත්කොට නව ගඩොල් සහ බදාම යොදා පිළිසකර කිරීම සිදුකෙරිණි. දාගැබේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු. 50,000 ක් වැය වී ඇති අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිපාදන ලබාදෙන ලදී.

අම්පාර දිස්ත්‍රික්කයට අයත් ලාහුගල මඟුල් මහා විහාරය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණයට ලක් වූ පුරාවිද්‍යා ස්ථානයකි. ධාතුසේන රජතුමා විසින් ඉදිකළ"රුහුණු මහ වෙහෙර" මෙයයි. සොළීන් විසින් මෙම මහාවිහාරස්ථානය විනාශ කෙරිණි. පසු ව ගම්පොළ කාලයේ දී පරාක්‍රමබාහු නම් රජවරුන්දෙදෙනාගේ අගමෙහෙසිය වශයෙන් සිටි විහාරමහාදේවී නම් රැජිනක විසින් මෙය පිළිසකර කරන ලදී.

මෙහි පෙත්මං සකස් කිරීම 2016 වර්ෂයේ දී සිදුකරන ලදී. පුරාවිද්‍යා ස්ථානයේ ඇතුළු මළුවේ තිබූ අක්‍රමවත් මාර්ග සියල්ල වසාදමා බොරළු යොදා ක්‍රමවත් ලෙස පෙත් මං සැකසිණි. මේ සඳහා වැය කෙරුණු මුදල රු. 75000කි.

ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති තවත් මහාර්ඝ පුරාවිද්‍යා ස්ථානයකි කොටවෙහෙර. ලාහුගල කොටවෙහෙර දාගැබේ ආරක්ෂාව සඳහා ගල් ප්‍රාකාරයක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම යටතේ මීට පෙර ඉදිකොට තිබිණි. ඊට අවශ්‍ය පස් පිරවීම ඉකුත් වර්ෂයේ දී ආරම්භ කෙරිණි.

2016 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ නඩත්තු අංශය මඟින් කලාප 7ක් යටතේ ප්‍රධාන වැඩබිම් පවත්වාගෙන යෑම, පුරාවිද්‍යාස්ථානය සඳහා මායිම් කණු සකස් කිරීම, ඕවාගිරිය පුරාවිද්‍යාස්ථානයට විදුලිය ලබා ගැනීම, මඩකළපුකලාප කාර්යාලයේ අලුත්වැඩියා කිරීම, ප්‍රාදේශීය කාර්යාලයේ ක්ෂේත්‍ර නිවාසය අලුත්වැඩියා කිරීම ආදිය ද සිදුකරන ලදී.

ගවේෂණ අංශය මඟින් පුරාවිද්‍යා ස්මාරක දත්ත වාර්තා කිරීම, ඛනිජ කැණීම්වලට අදාළ ව ස්ථාන පරීක්ෂාකිරීම, නීති කටයුතු සිදුකිරීම, පුරාවස්තු විනාශයන් වාර්තා කිරීම සිදුකරනු ලැබී ය.

ප්‍රවර්ධන අංශය මඟින් පුරාවිද්‍යා සතියට අදාළ ව වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කෙරිණි. ඒ අනුව අම්පාර දිස්ත්‍රික්කයේ හා මඩකළපු දිස්ත්‍රික්කයේ පාසල් තෝරා ගෙන සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පාසල් සිසුන් දැනුම්වත් කිරීම සඳහා දේශන මාලාවක් පැවැත්විණි.

**එච්. බී. ඒ. කේ. නිල්මල්ගොඩ**
සහකාර අධ්‍යක්ෂ (අම්පාර - මඩකළපුව)
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
අම්පාර.

## වයඹ පළාත

කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවලින් සමන්විත වයඹ පළාත තුළ 2016 වර්ෂයේ දී ලැබුණු ප්‍රතිපාදන අනුව ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරන ලදී. එම ව්‍යාපෘති ගවේෂණ, කැණීම්, කෞතුකාගාර, වාස්තුවිද්‍යා සංරක්ෂණ, නඩත්තු, ප්‍රවර්ධන හා රසායන සංරක්ෂණ අංශ යටතේ ක්‍රියාත්මක විය.

2016 වර්ෂය තුළ ගවේෂණ අංශය මගින් ස්ථාන පරීක්ෂාව හා ක්ෂේත්‍ර කටයුතු ව්‍යාපෘතිය වාර්ෂිකව ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී අනවසර කැණීම් ස්ථාන, පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන කළුගල්, වැලි, බොරළු ආදී ඛණිජ නිස්සාරණ ස්ථාන පරීක්ෂා කර වාර්තා ලබාදීම කර ඇත. එමෙන්ම චංචල පුරාවස්තු ලේඛණගත කිරීම ව්‍යාපෘතිය මගින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොටවෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩවලගෙදර සුළුගුළු විහාරය, හළඹගල විහාරය, තිඹිරියාව නාගල විහාරය, වාරියපොල නෑටිය නුවර කන්ද පුරාණ විහාරය, ශ්‍රී විශුද්ධාරාම බෞද්ධ මධ්‍යස්ථානය, නිකවැරටිය බුදුමුත්තාව විහාරය, පඬුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යායේගෙදර සුමංගලාරාමය, විල්බාගෙදර විහාරය, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උයන්වත්ත මේධංකර විහාරය හා මැද්දේපොල පුරාණ විහාරය වැනි ස්ථානවල විසිරී තිබූ චංචල පුරාවස්තු විශාල ප්‍රමාණයක් ලේඛන ගත කිරීම නිම කර ඇත. ඊට අමතරව විශේෂ ගවේෂණ ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක විය. ඒ යටතේ ක්‍රියාත්මක වූ විශේෂිතම කාර්යය වූයේ ශ්‍රී ලංකාවේ පැරණිතම හා විශාලතම ජාතික වනෝද්‍යානය ලෙස සැලකෙන විල්පත්තුව වනෝද්‍යානයේ වයඹ කලාපය තුළ පිහිටි කුදිරමලය හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ පුරාසාධක හඳුනාගැනීම සඳහා කරන ලද ගවේෂන කාර්යයයි. ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් කාලපරිච්ඡේදයක් තුළ සැඟවුණු පුරාසාධක මෙමඟින් අනාවරණය කරගත හැකි විය. එහිදී පුරා ස්ථාන 68ක් පමණ වාර්තා විය. ඒ අතර පලගතුරේ, කොල්ලන් කනත්ත, කුදිරමලේ යන පුරාසාධක සහිත ස්ථාන ගවේශනයට ලක්විය.

මෙම වර්ෂයේ දී සිදුකරන ලද තවත් විශේෂිත ගවේෂණයක් වූයේ කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුරුක්කුවටවන ගල්ලෙන රජමහා විහාරයේ පැරණි ස්මාරක සාධක සහිත භූමිය ගවේෂණය කිරීමයි. මෙම භූමියෙහි අනුරාධපුර මුල් යුගයට අයත් සාධක හා එතැන් සිට මහනුවර යුගය දක්වා විකාශය වූ ලක්ෂණ විරල වශයෙන් ද හඳුනාගැනීමට හැකි වී ඇත. මෙම භූමියේ කටාරම් ලෙන්, චෛත්‍ය ගොඩැලි, ශිලා ලේඛන, නටබුන් ගොඩනැගිලි සාධක ආදිය විසිරී ඇති බවට අනාවරණය වී ඇත. එමෙන්ම සංචාරක අමාත්‍යාංශය මගින් ලබා දෙන ලද ප්‍රතිපාදන යටතේ පුත්තලම, පල්ලම නවවංගු නන්දිමිත්‍ර විහාර භූමියේ ගවේෂණය ද පසුගිය වර්ෂයේ දී සිදුකරන ලදී.





හත්ටිකුච්චි පුරාවිද්‍යා ස්ථානයේ පර්වතය මත පොකුණ අසළ ගොඩනැගිල්ල කැණීම කරන ලද අතර මෙම ගොඩනැගිල්ලේ වාස්තු විද්‍යාත්මක නිර්මාණ සාධක හඳුනාගැනීම සඳහා මෙම කාර්ය ඉවහල් විය.

වාර්ෂික ව්‍යාපෘති වශයෙන් සිදුකරන යාපහුව, පඬුවස්නුවර හා පුත්තලම කෞතුකාගාර පවත්වාගෙන යාම යටතේ දෛනික නඩත්තු කටයුතු ඉටුකරන ලදී. වාස්තු විද්‍යා අංශය මගින් ස්මාරක 05ක සංරක්ෂණ කටයුතු නිම අර ඇත. මෙහිදී කුරුණෑගල වදුරාගල නොගොල්ල විහාරයේ ඉපැරණි බෝධි ප්‍රාකාරය සංරක්ෂණය කරන ලද අතර මෙම කාර්යයට අවශ්‍ය සියලුම සංරක්ෂණ ද්‍රව්‍ය විහාරස්ථානය මගින් සපයා දෙන ලදී. දෙපාර්තමේන්තු සේවකයන් යොදවා ගනිමින් මෙම කාර්යය නිමකරන ලදී. ඊට අමතරව වයඹ පළාතේ විශේෂිත පුරාවිද්‍යා ස්ථානයක් වන පනාවිටිය අම්බලමේ සංරක්ෂණ කාර්යය දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මත සිදුකර ඇත. මේ මගින් අම්බලමේ යට දැව රාමුවේ දිරාගිය දැව යෙදීමත්, කැටයම් සහිත දැව කණු ශක්තිමත් කිරීමත් වහළය ගෙබිම සැකසීම ද එම භූමියේ භූ දර්ශන සැකසීමේ කටයුතු ද අවසන් කර ඇත.

මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ වීදණ්ඩාවල සංඝාවාසය සංරක්ෂණය නිම කිරීමට හැකිවිය. එහි දී බෙහෙවින් හායනයට ලක්ව පැවති සංඝාවාසයේ බිත්ති, වහළය හා ගෙබිම සකස් කරන ලදී. ඊට අමතරව කරුවලගස්වැව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මුරුක්කුවටවන ගල්ලෙන් විහාරයේ කැණීම් කරන ලද ස්තූපය සංරක්ෂණය නිමකරන ලදී. මෙම කාර්යයට අවශ්‍ය සියලුම ප්‍රතිපාදන පොදු තැන්පත් ශීර්ෂය යටතේ විහාරස්ථානය මගින් සපයා දීම විශේෂිත කරුණකි. කුරුණෑගල - උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශිලාකේබරණී විහාරයේ ප්‍රතිමා ගෘහය සංරක්ෂණය කිරීමේ කාර්යය ද මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන යටතේ සිදුකරන ලදී.



නඩත්තු අංශය ව්‍යාපෘති 18ක් ක්‍රියාත්මක කළ අතර මූලික වශයෙන් ස්ථාන පවත්වාගෙන යාමේ කාර්යය සිදුවිය. මෙහිදී කලාප අංක 01 සිට 09 දක්වා ස්ථිර වැඩබිම් හා අනෙකුත් පුරාවිද්‍යා ස්ථානවල මායිම් පවිත්‍ර කිරීම, පෙත් මං සැකසීම, බැම් නඩත්තු කිරීම ආදී කාර්යයන් සිදුවිය. නඩත්තු අංශය මගින් ලැබුණු රු. 140,000.00 ප්‍රතිපාදන මත යාපහුව සංචාරක නිවාසය හා වැඩබිම් කාර්යාලය අලුත්වැඩියා කිරීමේ කාර්යය අවසන් කර ඇත. එමෙන්ම මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන මත පන්නල හොරවඩුන්න ශ්‍රී සුදර්ශන ශෛලබිම්බාරාම විහාරයේ පිළිමගෙය නඩත්තු කටයුතු අවසන් කර ඇත. මේ සඳහා අවශ්‍ය දැව විහාරස්ථානය මගින් සපයා දෙන ලද අතර වහළය, බිත්ති හා ගෙබිම අලුත්වැඩියා කිරීම මේ යටතේ සිදුවිය.

වෙනත් වර්ෂවල දී මෙන්ම පසුගිය වසරේ දී ද පුරාවස්තු විනාශය අවම කිරීමේ අරමුණින් ප්‍රජාව දැනුවත් කිරීම් වැඩසටහන් මාලාවක් සංවිධානය කෙරුණි. ඒ යටතේ කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක දෙක ආවරණය වන පරිදි තෝරාගත් පාසල් 20ක එම වැඩසටහන් ක්‍රියාත්මක විය.

මේ අනුව 2016 වර්ෂයට වෙන් වූ ප්‍රතිපාදන සීමාව තුළ ජාතික උරුමයන් ආරක්ෂා කිරීම් කාර්යයට දායකවීමෙහි ලා වයඹ පළාත් කාර්යාලයට සුවිශේෂ කාර්යභාරයක් ඉටුකිරීමට හැකියාව ලැබිණි.

**සමින්ද පෝරඹගේ**
සහකාර අධ්‍යක්ෂ
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
පඬුවස්නුවර.

## මොණරාගල දිස්ත්‍රික්කය

ඌව පළාතට අයත් මොණරාගල දිස්ත්‍රික්කය වෙනම පුරාවිද්‍යා ප්‍රාදේශිය කාර්යාලයක් තුළින් ඊට අවැසි නිලධාරි සේවක ගොනුවක් තුළින් ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙල 2016. 05. 02 දිනයෙන් ආරම්භ කරන ලදී.

දිස්ත්‍රික්කය තුළ විහිදී ගිය පුරාවිද්‍යා කලාප හතරකින් යුතුව පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණ, නඩත්තු කාර්යයන් ක්‍රියාත්මක කරනු ලබන අතර අනෙකුත් විෂයානුගත කාර්යයන් ද (ගවේෂණ, කැණීම්, අභිලේඛණ, වාස්තු විද්‍යා සංරක්ෂණ, රසායන සංරක්ෂණ) සිදු කරනු ලබයි. වෙට්ටඹුගල ලෙන් සිතුවම් ආරක්ෂා කර ගැනීමටත්, එවැනි හානි කිරීමට ඇති ඉඩකඩ



අසුරා දැමීමට කටයුතු සංවිධානය කෙරේ. මේ වනවිටත් එහි ඇති ශිලා ලේඛන පිටපත් කොට අවසන් කර ඇත.

බුත්තල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ රහතන් කන්ද ගවේෂණය යෝජිත ප්‍රමාණ ඉටු කිරීමට හැකි විය. යෝජිත මානාහරණ විහාර ප්‍රාකාර බැම්මේ කැණීම් ද සිදු විය. බුදුරුවගල ක්ෂේත්‍ර නිවාසයේ හා කෞතුකාගාරයේ වහලය ගලවා නැවත ඉදිකිරීම ද සිදු විය.

මොණරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටි පුරාවිද්‍යා ස්මාරක, ආරක්ෂිත ස්මාරක, පුරාවිද්‍යා රක්ෂිත ස්ථානවල පවතින බොහෝ පර්වත ලිපි, ලෙන් ලිපි, අභිලේඛණ ශිල්පීන් පිටපත් කර ප්‍රකාශයට පත් කර ඇති මුත් එසේ ප්‍රකාශයට හා ස්පර්ශ පිටපත් ගෙන නොමැති අභිලේඛණ පිටපත් කර ප්‍රකාශයට පත් කිරීමේ කාර්යය 2016 වසර මෙන්ම 2017 වසර මුල් කාර්තුවල සිදු කළහ.

දිස්ත්‍රික්කය තුළ පුරාවිද්‍යා ස්ථාන හැඳින්වීමේ පුවරු හා මාර්ග සංඥා පුවරු යෙදීමේ කාර්යය ආරම්භ කර මේ වන විට යම් ප්‍රමාණයකට පුවරු ස්ථාපනය කර ඇත. මෙම වසර තුළ අනෙකුත් ස්මාරක ස්ථාන සඳහා පුවරු යෙදීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත.



ප්‍රවර්ධන අංශය මගින් යෝජිත ප්‍රවර්ධන කාර්යය අනුව පුරාවස්තු ආරක්ෂා කර ගැනීම පුරාවස්තු විනාශය වැලැක්වීම හා ජාතික උරුම ආරක්ෂා කර කළමනාකරණය යන තේමා යටතේ පාසල් ගුරු ශිෂ්‍ය දැනුවත් කිරීමේ දේශන ප්‍රදර්ශන හා වැඩමුළු පැවැත්වීම 2016 වසර හා 2017 වසර තුළ ක්‍රියාකාරීව ඉටු කර ඇත.

මෙවර පුරාවිද්‍යා දින සැමරුම් සති වැඩසටහනට සමගාමීව යෝජිත පාසල් ළමුන් දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම ඉදිරි යෝජිත කාර්යයක් වේ.

**එන්. බී. කරවිගහංග**
ප්‍රාදේශිය සහකාර අධ්‍යක්ෂ
මොණරාගල දිස්ත්‍රික්කය.

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ මේ වනවිට පුරාවිද්‍යා ස්ථාන කීපයක සංරක්ෂණය සිදුවෙමින් පවතී. ඒ අතර වෙල්ගම්වෙහෙර පුරාවිද්‍යා ස්ථානයේ පිතට ප්‍රාකාර බැම්ම සංරක්ෂණය, කුච්චවේලි ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මසන්වැව දාගැබ සංරක්ෂණය, සේරුවිල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ දෙහිවත්ත සිරිවඩ්ඩන විහාරයේ චෛත්‍ය සංරක්ෂණය සිදු කරමින් පවතී.





**ඩබ්. එච්. ඒ. සුමනදාස**
ප්‍රාදේශිය සහකාර අධ්‍යක්ෂ
ත්‍රිකුණාමලය.

# මඩකලපු දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා ගවේෂණ කටයුතු අවසන් අදියරේ...


උතුරු නැගෙනහිර පළාතේ ස්මාරක ලේඛන ගත කිරීම වෙනුවෙන් ගවේෂණ ව්‍යාපෘතියක් මේ වසර මුලදී ඇරඹූ අතර එහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන් ගවේශනය කොට අවසන් කිරීමයි.

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ ගවේශන කටයුතු 2013 - 2014 වසර වලදී සිදු කෙරුණි. 2015 - 2016 වසරවල ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කොටසක් ගවේශනය කෙරුණු අතර 2017 වසර මඩකලපු දිස්ත්‍රික්කය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි ගවේශන කණ්ඩායම් හතරක් යොදවා ප්‍රාදේශීය කොට්ඨාශ මට්ටමින් ගවේශනයක් ඇරඹුනි. ඒ යටතේ මඩකලපු දිස්ත්‍රික්කයේ විශාලත්වයෙන් මෙන්ම දුෂ්කර බවින් වැඩිම ප්‍රදේශයන්හි මුලින්ම ගවේශනය සිදු කෙරුණි. ඒ අනුව කිරාන්, වෙන්කලඩි ප්‍රදේශවල 95% ක් පමණ පුරාවිද්‍යා ගවේශන අවසන් කර ඇත.

එමෙන්ම ඔට්ටමාවඩි, වාලච්චේන, එරාවූර් ප්‍රදේශීය බල ප්‍රදේශයේ ගවේශන අවසන් කොට ඇත. වාකරේ පුරාවිද්‍යා ගවේශනවලින් හතරෙන් එකක් පමණ අවසන් කර ඇත. මඩකලපුව නගර සීමාවේ ගවේශන කටයුතු ද සියයට හැත්තෑ පහක් පමණ අවසන් කොට ඇත. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදේශකත්වය හා මග පෙන්වීම මත සිදු කෙරෙන මෙම දැවැන්ත ගවේශන ව්‍යාපෘතිය වෙනුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ගවේශන අංශයේ නිළධාරීන් ප්‍රමුඛ පළාත් කාර්යාල රැසක කාර්ය මණ්ඩලය එක්ව සිටී. මේ වන විට වාර්තා ගත කර ඇති ස්ථාන සංඛ්‍යාව 350 ඉක්මවයි.

## මොණරාගල දිස්ත්‍රික්කයේ

# ඓතිහාසික හැබැස්ස පුරාවිද්‍යා භූමිය





ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝන්කැටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ඓතිහාසික හැබැස්ස පුරාවිද්‍යා භූමිය කුඹුක්කන් ඔයට යාබඳව යාල වන රක්ෂිතයේ පිහිටා ඇත.

ප්‍රාග් කේම්බ්‍රීය අවධියේ නිර්මිත විජයානු ශ්‍රේණියට අයත් පාෂාණවලින් කලාපය නිර්මාණය වී ඇත. වියළි කලාපීය මෝසම් වනාන්තර කාණ්ඩයට අයත් ස්වභාවික වෘක්ෂලතාවලින් සමන්විත වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යාල කලාපයේ රක්ෂිත ප්‍රදේශයක් ලෙස ද මෙම ප්‍රදේශය නම් කර ඇත.

මොණරාගල නගරයේ සිට කුඹුක්කන හංදියෙන් ඔක්කම්පිටිය නගරයට පැමිණ ඔක්කම්පිටිය නගරයේ සිට බෝගස් හංදියට පැමිණ කුඹුක්කන් ඔයේ පැරණි වැල් පාලම අසලින් එගොඩ වී කිලෝ මීටර් 06 ක් පමණ ආසන්න දුරක් දුෂ්කර මාර්ගයකින් ගමන් කර මෙම ස්ථානය වෙත ලඟා විය හැකිය.

විශේෂයෙන්ම වන අලින්ගෙන් හා අනෙකුත් වන සත්ත්වයින්ගෙන් ගහණ ප්‍රදේශයක් වන බැවින් මනා සංයමයකින් යුක්තව අදාළ පරිශ්‍රය වෙත ළඟා විය යුතු අතර සාමාන්‍ය වාහනයකින් පරිශ්‍රය වෙත ළඟා වීම දුෂ්කරය.

මෙම පුරාවිද්‍යා ස්ථානයේ ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක පසුබිම පිළිබඳව සඳහන් කිරීමේ දී ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ මහා නාග රාජ්‍ය කාලයේ දී ඉදි කරන ලද ස්ථානයක් ලෙස සඳහන් කළ හැකිය.

හැබැස්ස පුරාවිද්‍යා භූමිය ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකි පුරාවිද්‍යාත්මක අංගයන් ලෙස පැරණි නටබුන් වූ සැතපෙන බුදු පිළිමය, කටාරම් කෙටූ ලෙන්, ශිලා ලේඛන, පැරණි චෛත්‍යය, පැරණි සිතුවම්, නටබුන් වූ ගොඩනැගිලි, ප්‍රාකාර බැමි යනාදී වූ පුරාවිද්‍යාත්මක අංග රාශියක් නිරීක්ෂණය කළ හැකි වේ. පවතින පුරාවිද්‍යාත්මක සාධක අනුව අනුරාධපුර යුගයට අයත් ආරාම සංකීර්ණයක් ලෙස හඳුනා ගත හැකි අතර ඒ බව තවදුරටත් තහවුරු කළ හැකි වන්නේ ආරාම සංකීර්ණයේ ඇති ලෙන් ලිපි මගිනි. ඓතිහාසික ලේඛන හා විද්වත් මතයන්ට අනුව අතීතයේ මෙම ස්ථානය “නාග පබ්බත විහාරය” ලෙස හැඳින් වූ බව ද සඳහන් වේ.

ස්ථානීය ඓතිහාසික පසුබිම පිළිබඳව සඳහන් කිරීමට ඇති එක් පුරාවිද්‍යාත්මක සාධකයක් ලෙස හැබැස්ස ගිරි ලිපිය හඳුන්වා දිය හැකිය. අතීත මිනිසා ශ්‍රේෂ්ඨ සංස්කෘතියක් ලියා තබන්නට තෝරා ගත්තේ දිගු කලක් සුරැකිව පවතින රළු ගලකි.

### හැබැස්ස ගිරි ලිපිය

හැබැස්ස ගිරිලිපියේ පෙළ මෙවැන්නකි. "සිමධ වහබ මහ රජහ මරුමනෙකෙ උතර මහ රජහ පුතේ. උවරජ නෙකෙ දිනේ උලිබිකල අලිව මත වියව අභය වියව ගවිඩ වියව උලිබිකල නක මහ විහරෙහි භිකු සඝ හට දිනි."

### අර්ථය මෙලෙසිනි

උත්තකර රජුගේ පුත්‍රවූ ද, වසභ රජුගේ මුනුබුරු වූ ද නාග නම් උප රාජයා විසින් උලිබිකල නම් ඇල සහ එයින් දිය ගෙන වැඩ කරන මත විය, අභය විය, ගවිඩ විය යන නම් දරන කුඹුරු ද උලිබිකල නාග මහ විහාරයෙ හි භික්ෂු සංඝයාට දෙන ලදී.

වර්තමානය වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ රසායන සංරක්ෂණ අංශය මගින් පිළිමය සංරක්ෂණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මෙයට අමතරව ගවේෂණ කටයුතු, කැණීම් කටයුතු හා නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත.



එමෙන්ම පුරාවිද්‍යා උරුම කළමනාකරණ ක්‍රියාවලියට මහජන සහභාගීත්වය යන සංකල්පය යොදා ගනිමින් භික්ෂූන් වහන්සේ, රාජ්‍ය ආයතන, ආරක්ෂක අංශ, මහජනතාව සහභාගී කර ගනිමින් ස්ථානීය නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ.

මොණරාගල දිස්ත්‍රික්කයේ සංචාරක ආකර්ෂණය ඇති කළ හැකි ප්‍රධානතම පුරාවිද්‍යාත්මක ස්ථාන අතුරෙන් එක් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස මෙම හැබැස්ස පුරාවිද්‍යා ස්ථානය හඳුන්වා දිය හැකි අතර විශේෂයෙන්ම ඓතිහාසික සංචරණය, වනාන්තර ආශ්‍රිත සංචරණය, කෘෂි සංචරණය, ත්‍රාසජනක සංචරණය යන සංචරණ අංග කිහිපයකට ම යොදා ගත හැකි හා රටේ ආර්ථික සංවර්ධනය උදෙසා විදේශ විනිමය උපයාගත හැකි ස්ථානයක් ලෙස ද මෙම ස්ථානය හඳුනාගත හැකිය. කුමන සංචරණ ක්‍රියාවලියක් සිදු කළ ද ස්ථානීය ඓතිහාසික හා පෞරාණික උරුමයකට හානියක් නොවන ලෙසට හා දේශීය සභ්‍යත්වයට හා පුරාවිද්‍යාත්මක අනන්‍යතාවයට ද හානියක් නොවන ලෙස මෙම සංචරණය සැලසුම් කිරීම කාලීන අවශ්‍යතාවයක් වේ. මාර්ග පද්ධතියේ සිට අනෙකුත් යටිතල පහසුකම් දක්වා වූ සුදුසු සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවයක් වන අතර ස්ථානය වෙත සුදුසු නියමු සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කිරීම තුළින් කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගු කාලීන ප්‍රතිලාභ ළඟා කර ගත හැකි වන අතර පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර ගනිමින් මෙම කටයුතු සිදු කිරීම ද කාලෝචිත වේ.

සංචාරකයන් ලෙස ස්ථානය නැරඹීමට පැමිණෙන ඔබ ඔබගේ පා සටහන් පමණක් ඉතිරි කර ඔබ රැගෙන ආ සියලුම දෑ රක්ෂිත භූමිය තුළින් පිටතට ගෙන යාමට කටයුතු කරන ලෙස ද ශ්‍රී ලාංකික උරුමය මතු පරපුර උදෙසා දායාද කර දීමට හැකි දායකත්වය ලබා දීම ද සිදු කරන ලෙස සියලු ශ්‍රී ලාංකේය හා ලෝකවාසී ජනතාවගෙන් ඉල්ලා සිටිමි.

**ඩී. එම්. සුදර්ශන**
කලාප භාර නිලධාරි
බුදුරුවගල සහ මාලිගාවිල





## "එතූ පිළි මැවූ අපූර්ව සළුපිළි රටා"

# ශ්‍රී ලාංකික ඇඳුම් රටාවේ

### හැඳින්වීම

සළුපිළි රටා යනු රටක සංස්කෘතිය, සම්ප්‍රදාය ප්‍රකට කරන අතීතය, වර්තමානය සහ අනාගතය තුන්කාලයම ප්‍රත්‍යාවර්තනය කළ හැකි අගනා පුරාවිද්‍යාත්මක මෙවලමකි. අනුරාධපුර යුගයෙන් ආරම්භ වන ශ්‍රී ලාංකික වංශ කථාව කැටයම්, මූර්ති, ගෘහ නිර්මාණ සහ බිතුසිතුවම් සහ සැරසිලි රටා අනුසාරයෙන් ඉතා විද්‍යානුකූලව පුරාවිද්‍යාත්මක නිර්නායක මත පිහිටා ගොඩ නැංවීමට හැකියාව තිබේ. ඉතා සරල උදාහරණයක් ලෙස ගත්විට සඳකඩ පහන නම් විශිෂ්ට කලා නිර්මාණය පාදක කොට ගෙන පුරා විද්‍යාත්මකව ඉතිහාසය විකාශනය කළ හැකිය. අනුරාධපුර රත්න ප්‍රාසාදයේ ඇති සඳකඩ පහණ එහි කැටයම්වල ස්වභාවය, පොළොන්නරු යුගයේ දී සහ සෙසු පසුකාලීන යුගවලදී ක්‍රමික වෙනස්වීම්වලට භාජනය වූ ආකාරය දේශපාලනික, සමාජයීය සහ සංස්කෘතික විචලනයන් ඔස්සේ විස්තර කළ හැකිය. එමගින් ඉතා පැහැදිලි ලෙස යුගකරණය සනිටුහන් කර ගත හැකිය. වාස්තු විද්‍යානුකූලව මෙන්ම බිතු සිතුවම් සහ සැරසිලි රටා අනුව ද එසේ ඉතිහාසය ප්‍රති නිර්මාණය කළ හැකිය. නමුත් බොහෝ ඉතිහාසඥයින්ට මෙන්ම පුරා විද්‍යාඥයන්ට ද ඔවුන්ගේ මානයෙන් මග හැරුණු අංශයක් ලෙස සළුපිළි රටා (රෙදි සහ ඇඳුම් විලාසිතා) හඳුන්වා දිය හැකිය. මේ නිසා අදවන විට ශ්‍රී ලාංකික ඇඳුම් රටා සහ එහි හැඩතල (Shapes & Forms) පදනම් කරගෙන එහි ක්‍රමික විකාශය අනුසාරයෙන් පුරා විද්‍යාත්මකව හෝ ඓතිහාසික වශයෙන් ඉතිහාසය ගොඩනැංවීමට දුෂ්කර වී ඇත. මෙම ලිපියේ අරමුණ වන්නේ හුදෙක්ම ඉහත කී කාරණාව ප්‍රත්‍යක්ෂ කරවීම නොවේ. එම කාරණාව සාක්ෂාත් කිරීමට ප්‍රථම අප හඳුනාගත යුතු ප්‍රධානම සාධකය වන්නේ ශ්‍රී ලාංකික ඇඳුමේ අනන්‍ය ලකුණ සොයා යාමයි. එම නිසා මෙම ලිපිය ලිවීමේ දී මූලාශ්‍ර කොට ගන්නේ දැනට ශේෂව පවතින කැටයම්, මූර්ති, විහාර බිතුසිතුවම් සහ ද්විතියක මූලාශ්‍ර වන මුද්‍රණද්වාරයෙන් ප්‍රකාශයට පත් කර ඇති ශාස්ත්‍රීය ග්‍රන්ථ, පර්යේෂණ පත්‍රිකා සහ වංශකථා මූලාශ්‍රයන් පමණකි.

### ඇඳුම විලාසිතා කලාවක් බවට පත්වීම

ශරීරය විලිවසා ගැනීම සඳහා යම් ආවරණයකින් වසා ගත් කල එය ඇඳුමක් බවට පත්වන අතර කාලයාගේ ඇවෑමෙන් සමාජ, සංස්කෘතික, ආර්ථික සහ දේශපාලන ප්‍රවාහයන්ගේ විචලනයන් අනුව නිරන්තර වෙනස්වීම්වලට භාජනය වී යම් ලෙසකින් බොහෝ සේ සිත් රංජනය කරන්නා වූ පරිදි යම් ආරකට (The most admired style) පත්වීම විලාසිතා නම් වේ.

මේ අයුරින් ගත් කල විකාශය වන සළුපිළි රටාවන් හි කතෘත්වය හිමිවන්නේ සමාජයේ ඉහළම ස්ථරයේ සිටින පාලක ප්‍රභූන්ටයි. ජෝර්ජ් සිමෙල් නම් සමාජ විද්‍යාඥයාට අනුකූලව විලාසිතා හඳුන්වා දෙන්නේ මේ ප්‍රභූ පැළැන්තියයි. ඔවුන් වටා සිටින අනෙකුත් ප්‍රභූහු මෙම රටා අනුකරණය කරමින් අනුගමනය කරති. විලාසිතා රැල්ලක් මවන්නේ මේ පිරිසයි. සමාජයේ පහළම ස්තරවලට විලාසිතා වැස්සීම සිදුවේ. ඒවා අන්ධානුකරණයෙන් වැළඳගැනීම සෙසු තලවල ජනයා සිදු කරයි.

### ශ්‍රී ලාංකික ඇඳුමේ අනන්‍ය ලකුණ මතු කිරීම

ශ්‍රී ලාංකික ඇඳුමේ අනන්‍ය ලකුණ සෙවීමේ පුරෝගාමී මෙහෙවරක යෙදුනේ 'ආර්ට්ස් ඇන්ඩ් ක්‍රාෆ්ට් ඔෆ් ඉන්දියා ඇන්ඩ් සිලෝන්' (Arts and Crafts of India and Ceylon 1913) නම් කෘතිය රචනා කළ 20 වෙනි සියවසේ දකුණු ආසියාවේ බිහි වූ විශිෂ්ටතම විද්වතා ලෙස විරුදාවලී ලත් ආචාර්ය ආනන්ද කුමාරස්වාමිය. මෙම කෘතියේ පිටු අංක 195 හි ඔහු සඳහන් කරන්නේ ඉන්දු ශ්‍රී ලංකා ඇඟලුම් අඟලා ගැනීමේ මහත් වූ කලාවක් ඇති බවයි. එසේ පවසන්නේ, එම ඇඳුම් කිසිම මැස්මකින් අල්පෙනෙත්තකින්, ගැටයකින් තොරව එකට යාකර ඇති බවකි. මේ මතය විමර්ශනය කරන්නේ නම් එයින් විශද වන්නේ ඇඳුම් විලාසිතාවක් නිම කිරීමට උවමනා කරන රෙදි එකට එකතු කිරීම හෝ මූට්ටු යොදා එකට හා කිරීම (Fastened) කිරීම වෙනුවට ඇඟ වටා නිශ්චිත රෙදි ප්‍රමාණයක් දැවටීම හෝ එතීමෙන් (Wrapping) එම කාර්යය කළ ඇති බවකි. මෙසේ නිශ්චිත රෙද්දක් (යම් ප්‍රමාණයක්) ශරීරය වටා ක්‍රමානුකූලව ඔතා යම්කිසි හැඩතලයක් මතු කරගැනීම ශ්‍රී ලාංකික ඇඳුමේ අනන්‍ය ලකුණ ලෙස අර්ථ දැක්විය හැකිය. වැඩිදුරටත් මෙසේ විග්‍රහ කරන්නේ නම් නිශ්චිත රෙදි ප්‍රමාණයක් ඇඟ වටා දවටා අවසන් වනතුරු එම ඇඳුමේ හැඩය අවබෝධ කර ගැනීමට හෝ දෘශ්‍යපථයට ග්‍රහණය කර ගැනීම අවිනිශ්චිතය. සරලව විමසා බැලුවහොත් පෙනෙන්නේ එක් තනි දිග රෙද්දක් අවසාන හැඩතලය/රටාව අනුමාන කිරීම අවිනිශ්චිත බවයි.

අද වන විට ශේෂව පවතින විහාර බිතු සිතුවම්, මූර්ති සහ කැටයම් අනුසාරයෙන් කරන ලද විද්‍යාත්මක නිරීක්ෂණයේ දී ප්‍රධාන සංකල්ප හතරක් ඔස්සේ ශ්‍රී ලාංකික ඇඳුමේ හැඩතල මතුකර ඇති බව ප්‍රත්‍යක්ෂ වේ.

සංකල්ප අංක 01 - රෙදි වේලීම /දැවටීම/ එතීමේ ක්‍රමවේද - Wrapping Method

සංකල්ප අංක 02 - රෙදි පොටවල් වශයෙන් නැවීමේ ක්‍රමවේදය - Folding Method

සංකල්ප අංක 03 - රෙදි ගැට ගැසීමේ ක්‍රමවේද - Knotting method

සංකල්ප අංක 04 - රෙදි රැළි කිරීමේ ක්‍රමවේද - Pleating Method

සංකල්ප අංක 05 - රෙදි ලොච්චි කිරීමේ ක්‍රමවේද - Frilling Method

ධනවත් බව, ප්‍රභූත්වය, රාජකීයත්වය, බලය සන්නිවේදනය කිරීමේ ප්‍රධානතම භාණ්ඩය වූයේ ඇඳුමයි.



# අනන්‍ය සලකුණ සෙවීම



දූලිවල කැණීමෙන් ලද ඉපැරණි රෙදි කැබැල්ල

ඇඳුමේ බාහිර හැඩය අත්‍යන්තයෙන් විශාල කර පෙන්වීම මහනුවර යුගයේ ප්‍රභූන්ගේ කුජ්පොට්ටි ඇඳුමේ ප්‍රබල ලක්ෂණයක් වූ අතර, අමතර රෙදි වර්ග කීපයක් වෙන් වෙන් වශයෙන් බඳවටා එතීම ප්‍රධාන ලක්ෂණය විය. (Extravagant Body Silhouette) මෙම තුප්පොට්ටි හෙවත් මුල් ඇඳුම නිලමේ ඇඳුම ලෙස වර්තමානයේ භාවිතා වෙයි. මේ ඇඳුම දෙමුහුන් ලක්ෂණ ප්‍රකට කරන අපූර්ව සැකැස්මකි. (Hybrid Formation) එනම් බඳවටා ඔතා තනන ලද අධිකතර (Extravagant) ස්වරූපයේ පිරුණු කෙසෙල් මුවයක හැඩය ගත් උඩ කොටස සහ එයට යටින් අඳින ලද දිග කපු කලිසම (Pantaloon) මෙම සැකැස්ම සඳහා පාදක වී ඇත. ඔතන ලද ගැට දැමූ උඩ කොටස දේශීය ලක්ෂණ සමී මිශ්‍රණය වීමෙන් නිම වූ අතර යටින් හැඳි දිග කලිසම කපා මසන ලද ආකාරයෙන් තනාගැනීම නිසා යුරෝපීය ලක්ෂණ සම්මිශ්‍රණය වීමෙන් නිමවා ඇත. මේ නිසා දේශීය මෙන්ම යුරෝපීය සමලංකෘත ලක්ෂණ ප්‍රකට කරන නිසා දෙමුහුන් ලක්ෂණ ගැබ්ව ඇති බව පැහැදිලි කළ හැකිය.

## අනුරාධපුර, පොළොන්නරු සහ දඹදෙණි යුගය ආශ්‍රිතව හමුවන එතුපිළි රටා



කුට්ටම් පොකුණ තඹ රූපය



පොළොන්නරු විෂ්ණු දේවාලය නාට්‍යාංගනා රූපය (කොළඹ කෞතුකාගාරය)



දඹදෙණි යුගයේ ලියවූ චුල්ලවග්ග පුස්කොළ පොත පිටකවරය (කොළඹ කෞතුකාගාරය)



යාපහුව දළදා මාළිගාව

ගඩලාදෙණි විහාරය - ගම්පල යුගය

රෙදි එතීමේ සංකල්පය ප්‍රායෝගික කරණයේදී ස්ත්‍රී පුරුෂ ශරීරාංග මතුවන සේ හැඩය ගොඩනගා ඇති බව පැහැදිලි වෙයි. විශේෂයෙන් නාටක, නාට්‍යාංගන රූපයන්හි යටිකය ඇඳුම ඉතා තදින් වෙලා ඇති බවත්, නර්තනයට උචිත ආකාරය බඳට වන්නට, තද වන්නටත්, බඳ වටා අමතර නරු දිගට යෙදීමෙන් දැකිය හැකිය. රාජකීයන්ගේ ඇඳුම් ද ජෝතියක් ආකාරයෙන් බඳවටා ඔතා, අතිරේක රැලි, නරු අවශ්‍ය පරිදි යොදාගෙන නිමවූ බව පැහැදිලිය.



රෙදි පොටවල් ලෙස නැවීමේ සංකල්පය බොහෝ විට රැජිණියන්ගේ යටිකය ඇඳුම් සඳහා යොදාගෙන ඇත. මහනුවර යුගයේ දී ඉතාම ජනප්‍රිය විලාසිතාවක් වූ මෙය විවිධාකාරයෙන් මතුකර ඇති බව විහාර චිත්‍ර අනුසාරයෙන් ප්‍රත්‍යක්ෂ වෙයි. ඉදිරිපස ඉනේ වම් පස සිට දකුණු පසට වන්නට පොට දෙකට නවා ලම්බක ආකාරයට පෙන්වීම කාන්තා ශරීරයේ උස වැඩිකර පෙන්වීමේ උපක්‍රමයක් විය. එසේම උකුල දෙපසට වන්නට විකර්ණාකාර ලෙසට නමා ඔතන ලද දෙපොට ද ස්ත්‍රීත්වය මතු කිරීමට ගත් තවත් එක් උත්සාහයකි.

තනි දිග රෙද්ද බඳවටා එතීමේදී එය රඳවා ගැනීමට යෙදූ උපක්‍රමය වූයේ කුඩා ගැටයකින් රෙද්දේ දෙකොන සම්බන්ධ කිරීමයි. ඇඳුම ගොඩනැංවීමේ මූලික අඩිතාලමේදී මෙලෙස සරල ගැටයක් භාවිතා වුවද ගැට ක්‍රමය ඇඳුමේ අත්‍යාවශ්‍ය අලංකරණ අංගයක් ලෙස වර්ධනය වූ සංකල්පයක් ලෙස විග්‍රහ කළ හැකිය. රජවරු, රැජිණියන්, ප්‍රභූන්, නාටක නාට්‍යාංගනාවන්ගේ ඇඳුම් රටා මෙලෙස ගැට මගින් අලංකාර කර ගත් බව පැහැදිලිය.

ක්‍රමානුකූල අතින් සකසන ලද කුඩා රැලි රැජිණියන්ගේ යටිකය දෝතයෙහි විශේෂ ලක්ෂණය විය. සමමිතික ආකාරයට ක්‍රමානුකූලව සැකසූ රැලි ලම්බක ආකාරයට නාභියට පහල සිට පාදාන්තය දක්වා දිවෙන නිසා ශරීරයේ උස තීව්‍ර කර පෙන්වයි. තට්ටු වශයෙන් ක්‍රමානුකූලව පරිමාණය වෙනස් කරමින් යොදා ඇති රැලි තට්ටු සඳහා අමතර රෙද්දක් භාවිතා කරන්නට ද ඇති බව උපකල්පනය කල හැකිය. මෙම රැලි තට්ටු පාද චලනය වන අතර වාරයේ, පාද මදක් ඈත්කර හිඳගන්නා විට ඇඳුමට අමතර අවකාශයක් ලබා දීමට සමත්වන අතර, ඇඳුමේ ක්‍රියාවලිය පහසු කිරීමටත් හැකියාව ලැබේ. ඇඳුමේ කාර්යභාරය (Particular Task of Dress) පහසු කිරීමටත් ල තීව්‍ර කිරීමටත් මෙවැනි සංකල්ප යොදාගත් බව ප්‍රත්‍යක්ෂ වේ.

රැජිනියන්ගේ, රාජකීයන්ගේ සහ නාට්‍යාංගනාවන්ගේ පිළිරටාවන්හි විවිධාකාරයේ ලොවිච්චි යොදා ඇත. පොළොන්නරු යුගයේ ත්‍රිවංක පිළිම ගෙයි හමුවන පුරුෂ රූපයක යටිකය ඉදිරිපසට වන්නට පහලට එල්ලෙන සේ යෙදූ කවාකාර ලොවිච්චිය (Circular Frill) යම්කිසි ආකාරයක වෙනස් හැඩයක් එක් කළ අංගයක් බව එය පසුකාලීනව විකාශය වූ ආකාරය අනුව පැහැදිලි වෙයි.

කෝට්ටේ යුගයේදී රජුන්ගේ ඇඳුමෙහි මූලිකවම දක්නට ලැබූ ඇඳුමේ හැඩතල අතර මෙම කවාකාර ලොවිච්චියට සුවිශේෂී ස්ථානයක් හිමි වූ බව පැහැදිලි වේ. ප්‍රමාණයෙන් විශාල වීමත් එය පසුව එක් උකුල් ප්‍රදේශයක් වැසෙන අකාරයට යටිකය ඇඳුමේ පාදාන්තය දක්වාම දික්වූ ආකාරයත් ඇත්ද, මංජුසාවේ ඇති රාජකීය රූපය, සහ ප්‍රභූ රූපයකින් පැහැදිලි වෙයි. ගම්පල උඩ අලුදෙනිය රඹාව, නම් දැව ද්වාරයේ හමුවන කෝට්ටේ යුගයේ යැයි ප්‍රත්‍යක්ෂ කර ඇති රාජ රුවේ යටිකය ඇඳුම මෙවැනි දැවැන්ත කවාකාර ලොවිච්චියක් හමුවන එකම ස්ථානයයි.

26 පිටුවට....



**ආචාර්ය විරාජිනී මැදගෙදර කරුණාරත්න**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය, පේෂකර්ම සහ ඇගළුම් තාක්ෂණ විද්‍යා දෙපාර්තමේන්තුව,
ඉංජිනේරු පීඨය,
මොරටුව විශ්ව විද්‍යාලය.

## මහනුවර යුගයේ සිතුවම් සම්ප්‍රදාය නව මගකට යොමු කළ

# පිළිකුත්තුව විහාරයේ සිතුවම්



පිළිකුත්තුවෙහි ඉතිහාසය ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා ඈතට දිව යයි. පිළිකුත්තුවෙහි ඇති ලෙන් අතර මනෝරම්‍ය නමින් නම් කළ බ්‍රාහ්මී අක්ෂරයෙන් යුත් ලිපි සහිත ලෙන් පැවතීම ඊට හේතුවයි.

මහනුවර යුගයට අයත් පහතරට සම්ප්‍රදායේ සිතුවමින් පෝෂණය වූ කලාගාරයක් ලෙස පිළිකුත්තුව විහාරය හැඳින්විය හැකිය. ලෙන් විහාරයේ බුදු මැදුර ඇතුලතත් ඉදිරිපස මණ්ඩප කොටසේත් උඩත් සිතුවම් ඇඳ ඇත. බුදු කුටිය ඇතුළත ලෙන් ගල උඩු වියනක් ලෙසින් සලකා වියන් චිත්‍ර ඇඳ ඇත. දහසක් පද්මයන් නිරූපනය කෙරෙන චිත්‍ර වටා අලංකාර ලියවැල් මෝස්තරයක් සහිත දීප්තිමත් වර්ණ සුසංයෝජනයකින් එය නිර්මාණය කර තිබේ.

දකුණතින් මලක් ගත් එකම ආකාරයේ රහතුන් වහන්සේලාගේ ලෙන වටා ඇතුළතින් සිතුවම් කර ඇත්තේ ප්‍රධාන විසල් සැතපෙන බුදු පිළිමයට වන්දනා මාන කරන අයුරිනි. මෙලෙස නිරූපිත රහත් රූප ප්‍රමාණය 19 කි. එහි රහත් භික්ෂුණීන් වහන්සේ දෙදෙනෙකුගේ රූප ද වෙති. ඒ අනුව සියලුම භික්ෂු භික්ෂුණී රූප 51 කි. ඉන් හතරක් භික්ෂුණී රූප වීම විශේෂත්වයකි.

බුදුගෙයි ඇතුළු කොටසේම සැතපෙන බුදු පිළිමයේ සිරිපා පිහිටි පැත්තේ දකුණු පස දොරටුව සමීපයෙන් හිටි බුදු පිළිමයට දෙපසින් ඉර හඳ රූප නිවමා ඇත. රහතුන් වහන්සේලා දක්වා ඇති තීරු අතර ඉහළින් ගහකොළ හා මාල ගිරා, සැලලිහිණි වැනි පක්ෂීන්ගේ අලංකාරවත් සිතුවමින් විචිත්‍රව ඇත.

පිළිකුත්තුව විහාරයේ බුදුගෙට ඇතුළු වන දොරටුව දෙපස ඇඳ ඇති අඩි හතරක් පමණ උස අලංකාර රූප දෙක සිතුවම් කර ඇත්තේ පෘතුග්‍රීසි හේවායකුගේ විලාශයෙනි. මහනුවර යුගය තුළ වූ වර්ණ සංකලනය ඒ තුළින් මනාව පිළිබිඹු වේ. මුරකාර රූප දෙක සහිත ඉදිරිපස බරාඳය මුළුමනින්ම පාහේ සිතුවමින් අලංකාර කර ඇත. එහි ඉදිරිපස උඩ තරමක් වක් වූ ලී සිවිලිමෙහි පවා සිතුවම් කර තිබේ. එම චිත්‍රවලින් ඉතා අලංකාරව ලග්න සංකේත දොළහ නිරූපිතය. "කලා කෘතියකින් සමකාලීන සමාජය නිරූපනය වේ" යන සඳහනට අනුව මේ ලග්න රූප වලින්ද හෙළිවන්නේ ඒ යුගයේ මේ ප්‍රදේශවාසීන් නක්ෂත්‍රය කෙරෙහි උනන්දුවක් දක්වා තිබූ බවය. අහසේ ඇති ග්‍රහ තාරකාවන්ගේ පිහිටීම මිනිසාට විවිධාකාරයෙන් බලපාන බව ජ්‍යොතිෂ ශාස්ත්‍රයෙහි දැක්වෙයි.

මේ ලෙන් විහාරයේ සිතුවම් අතර ජාතක කතා තුනක අවස්ථා නිරූපිත සිතුවම් ඉතා වැදගත් තැනක් ගනී. එහි ඇඳ තිබෙන්නේ වෙස්සන්තර, මහා කණ්හ හා ධර්මපාල යන ජාතක කථා තුනේ විවිධ අවස්ථා ගණනාවකි. චිත්‍ර ශිල්පියකුගේ ඇඟිලි තුඩකින් කිති කැවුණු පිංසල මවන නෙක රූ රටා සමගින් නිහඬ සංවාදයක යෙදෙන නැණවත් සහෘදයකුට කලාකරුවාගේ අරමුණ වටහා ගැනීම එතරම් අපහසු නොවනු ඇත. බෞද්ධ සාහිත්‍යයේ එන 550 කට ආසන්න ජාතක කථා අතුරින් චිත්‍ර ශිල්පියා මෙම ජාතක කථා තුනම තෝරා ගැනීමට බලපාන හේතු විමසිය යුතුය.


සැදැහැතියන්ගේ සිත් ජාතක කථාව හා හි අන්තරගතය වෙත යොමු කරවීමට චිත්‍ර ශිල්පියා උත්සාහ දරා තිබේ. එහිදී ඔහු යොදා ගත් මාධ්‍යයේ ස්වභාවය නිසාම ඔහුට විවිධ සීමාවන්ට ලක්වීමට සිදුව තිබේ. ඔහුට ත්‍රිමාන රූප ඇඳ දැක්වීමට අවකාශ නැත. මිනිස් මුහුණු මගින් හැඟීම් දැනීම් ප්‍රකාශ කළ නොහැකිය. ඔහුට ඇත්තේ රේඛා කර්මය හා වර්ණ සංකලනය යන විධි නියම දෙක පමණි. මහනුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදාය නැමැති රාමුව තුළ සිටිමින්ම කලාකරුවකු වශයෙන් තමා සතු කාලීන වගකීමක් ඉටු කිරීමට පිළිකුත්තුව විහාරයේ ජාතක කතා සිතුවම් තුළින් කලාකරුවා උත්සාහ දරා ඇත.

මහ කණ්හ ජාතකයේ තෝරාගත් අවස්ථා මගින් චිත්‍ර ශිල්පියා මූලිකවම සංඝයා වහන්සේගේ හැසිරීම හා ක්‍රියා කලාපය විෂයෙහි බුදු දහමට අනුගතව පණිවිඩයක් ලබා දෙන අතර අනිත් අතට වෙස්සන්තර ජාතකය මගින් ගිහියන්ට වැදගත් පණිවිඩ රැසක් ලබා දෙයි. ඒ යුගයේ රාජ්‍ය කරවූ රාජසිංහ රජු දානමානාදිය තහනම් කරද්දී පෙර රජවරුන් දන් දුන් ආශ්චර්යවත් බව හඟවන වෙස්සන්තර රජතුමා දුගී මඟී යාචකාදීන්ට දන් දෙන ආකාරය අතිශයින් චමත්කාර ජනක ලෙස ඇඳ දක්වා තිබෙයි.

ඉතා සුළු අවකාශයක් තුළ වුව සංයත බව බිඳ වැටුණු සිතුවම් මගින් අනවශ්‍ය පරිදි රසික හැඟීම් අවුස්සාලීමක් සිදු වෙයි. මේ සංයමය වඩාත් ලෙහෙසියෙන්ම බිඳ වැටීමට ඉඩ ඇති මාධ්‍ය චිත්‍ර මාධ්‍යයයි. පිළිකුත්තුව විහාරයේ චිත්‍ර ශිල්පියා තම අරමුණ වෙතම එක එල්ලේ රැඳී සිටිමින් හැම විටම සංයත බව කෙරෙහි සැලකිලිමත් වී තිබීම ඔහුගේ සමස්ථ සිතුවම් කෙරෙහිම කැපී පෙනෙන සුවිශේෂී ලක්ෂණයකි. ස්ත්‍රී රූප ඇඳීමේදී මේ සංයත බව කදිමට පසක් වෙයි. මුළුතැන්ගෙයි සිටින ස්ත්‍රීන්ගේ උඩුකය හැමවිටම නග්නව දක්වා ඇත. කුමන හෝ වැස්මක්වත් උඩුකයෙහි නැත. එහෙත් පියයුරු පෙන්වීමට චිත්‍ර ශිල්පියා මැලි වූ සෙයකි. සිරුරේ අතපය ආදී අවයවයකින් හෝ බාහිර අංගයන්ගෙන් හෝ වැසෙන සේ රූප ගැලපීම මගින් පියයුරු දැක්වීමෙන් වැලකී ඔහු පෙන්වන සංයමය පුදුම එලවන සුළුය. උඩුකය වැස්මක් සහිත ස්ත්‍රී රූප වලද පියයුරු මතුකර නොපෙන්වයි.

යුගයේ අවශ්‍යතාව හැඳිනගෙන එය නිර්මාණාත්මකව සමාජය වෙත එළි දැක්වීමට තරම් අභීත වූ නිසග කලා කෞශල්‍යයෙන් හෙබි චිත්‍ර ශිල්පියකු ලෙසද මහනුවර සම්ප්‍රදායේ සිතුවම් දක්නට ලැබෙන ස්ථාන ලෙස ගැනෙන දඹුල්ල, දෙගල්දොරුව ආදියෙන් පමණක් නොව කැළණිය වැනි විහාරස්ථාන වල චිත්‍ර වලින්ද වෙනස් මගක් ගත් සුවිශේෂී සිතුවම් කලාවක් ලොවටම දායාද කිරීමට පිළිකුත්තුව ලෙන් විහාරයේ සිත්තරුවා සමත්ව ඇත.





**කේ. සෂීමා රාජිනී**
පුරාවිද්‍යා සහායක
පිළිකුත්තුව කලාප කාර්යාලය,
බස්නාහිර.

# මීගමුව වෙඩිබෙහෙත් ගබඩාවේ සංරක්ෂණ කටයුතු අවසන්

මීගමුව බන්ධනාගාර පරිශ්‍රය තුල පිහිටා ඇති ඉපැරණි වෙඩි බෙහෙත් ගබඩාව ලන්දේසි යුගයට අයත් වෙයි. මෙම ගබඩාව මීගමුව කොටුවේ ආරක්ෂක කටයුතු සඳහා අවශ්‍ය වෙඩි බෙහෙත් තැම්පත් කර තිබූ ස්ථානයයි.

කොටුවට බටහිර දිශාවේ කලපුව ඉදිරිපස උස් භූමියක මෙම ගොඩනැගිල්ල පිහිටා ඇත. අවට භූමිය තැනිතලා වුවත් මෙම සීමාව පමණක් පස් පුරවා උස්ව සිටින සේ පොළව සකසා, එනම් අවට පිහිටි පොළව මට්ටමේ සිට අඩි 9 ක් පමණ උසින් මෙම ගබඩාව ඉදිකර ඇත. මෙයින් පෙනී යන්නේ මෙම ගොඩනැගිල්ල තුළ යම් උෂ්ණත්වයක් පවත්වාගෙන ආයුධ තැම්පත්කර තිබූ බවයි.

දිගින් අඩි 16.50 සහ පළලින් අඩි 14 ක් වන ගොඩනැගිල්ලේ ප්‍රධාන ප්‍රවේශ දොරටුව උතුරු දිශාවට ඇති අතර සමුපූර්ණයෙන් ආරුක්කුමය හැඩයක් ගනී. ප්‍රමාණයෙන් තරමක් විශාල වූ ගඩොල් භාවිතා කර හුණු මිශ්‍ර වැලි බදාමයෙන් නිර්මාණය කර ඇත. දෙපස බිත්ති දෙක සඳහා ආධාරක කුළුණු යොදා තිබේ. ගොඩනැගිල්ලේ අත්තිවාරම අඟල් 08 ක් පමණ උසකින් යුක්ත වන අතර කළු ගලින් යොදා තිබේ. ඒ මත අඟල් 17 ක් පළලින් යුතු දෙපස බිත්ති දෙක ඉදිකර ආරුක්කුමය හැඩැති ගඩොල් වහලය නිර්මාණය කර ඇත. වහලයේ ආරුක්කුමය කොටස දෙපස බිත්ති වල සිට ගඩොල් වරි 05 කින් ආරම්භ කර උපරිම ව්‍යුහය දක්වා ගෙවී යන ආකාරයට මට්ටම් කර යොදා ඇත. ගොඩනැගිල්ලේ පිටුපස සහ ඉදිරිපස බිත්ති සඳහා අඩි 01 ක් උස සහ අඟල් 03 ක් පළල හුළං කවුළු තබා ඇත. මේවායින් ඇතුලත සහ පිටත නොපෙනෙන ආකරයට සහ ගොඩනැගිල්ල තුලට සිසිල් සුළඟක් පැමිණෙන ලෙස මනාව සකස් කර ඇත. මෙම කවුළු වලින් ගොඩනැගිල්ල තුළට උෂ්ණත්වය මැනවින් පාලනය කර ඇති බව දක්නට හැකි වේ.



සංරක්ෂණයට පෙර



සංරක්ෂණයට පසු

පිටත බිත්ති කපරාරු කර සිමෙන්ති කොලපු මැද ජල නිරෝධක ආලේප කර ඇති අතර ඇතුලත බිත්ති හුණු, වැලි කපරාරු යොදා හුණු කොලපු මැද ඇත. ගොඩනැගිල්ලට යොදා ඇති අකුණු සන්නායකය අඟල් 02 ක් පළල, අඟල් 01 ක් ඝණකම යකඩ පට්ටමකි. ගෙබිමට කුස්තුර පොයින්ට් කරන ලද ගඩොල් ඇතුරුමක් පැරණි ආකාරයටම යොදා ඇත.

සංරක්ෂණයේදී ගොඩනැගිල්ලේ සිට අඩි 10 ක් පිටතින් 9"x 9" කොන්ක්‍රීට් කණු සහ ඒ හරහා කොන්ක්‍රීට් තලාදයක් ද කළුගල් බැම්මක් ද බැඳ වටා පස් පුරවා තණ පිඩලි අතුරු ගොඩනැගිල්ල වටා ශක්තිමත් කර ඇත.

ඉදිරිපස ප්‍රවේශ දොරටුව දැවයෙන් නිර්මාණය කර ඇති අතර අපගේ සංරක්ෂණයේදී දොර පියන වෙනුවට ඇතුලත නැරඹිය හැකි ආකාරයට යකඩ ගේට්ටුවක් යොදන ලදී.

මෙම ගොඩනැගිල්ලේ බිත්ති වල විශාල ගස් මුල් වර්ධනය වී බිත්ති පුපුරා තිබූ අතර 2017 වර්ෂයේ පෙබරවාරි මාසයේ අවසාන වන විට සියළුම සංරක්ෂණ වැඩ ඉතා සාර්ථකව නිම කරන ලදී.

**සුභාෂිණී චන්ද්‍රසෝම**
බස්නාහිර කාර්යාලය.

## හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලීය පුරාවිද්‍යා සංගමයේ

# තවත් විශිෂ්ට සමාජ මෙහෙවරක්

පුරාවිද්‍යාත්මක උරුමය අනාගත පරම්පරාව වෙත දායාද කිරීමේ ප්‍රමුඛම අරමුණ පෙරදැරිව ලංකාව පුරා පුරාවිද්‍යා සංගම් පිහිටුවීම ඇරඹුණි. විශ්වවිද්‍යාල, පිරිවෙන්, පාසල් සහ රාජ්‍ය ආයතන කේන්ද්‍ර කොට ගනිමින් පුරාවිද්‍යා සංගම් පිහිටුවීම මීට කලකට පෙර ඇරඹුණු අතර පාසල් මට්ටමින් පුරාවිද්‍යා සංගම් පිහිටුවීම කාලෝචිත පියවරක් විය.

හංවැල්ල රාජසිංහ ජාතික පාසලේ සිරිපාල ගමගේ ගුරුතුමාගේ පූර්ණ උපදේශකත්වයෙන් ක්‍රියාවට නැගෙන පුරාවිද්‍යා සංගමය පසුගිය වසර කිහිපය ඇතුළත ප්‍රශස්ත මට්ටමේ අරමුණු කිහිපයක් සපුරා ගෙන ඇත. ඒ අතුරින් පුරාවිද්‍යා ප්‍රදර්ශන පැවැත්වීම, දේශණ, සම්මන්ත්‍රණ, වැඩමුළු සංවිධානය කිරීමත් ප්‍රමුඛය. සීතාවක උරුමයට අදාළව තොරතුරු දත්ත එක්රැස් කොට අනාගත පරපුරට දායාද කිරීමත්, හෙළයේ විශිෂ්ඨයින් ස්මරණය කරමින් උත්සව සංවිධානය කිරීමත් කැපී පෙනේ.



ලංකාව පුරා පිරිවෙන් සඳහා වටිනා අගනා පොත් කට්ටල පරිත්‍යාග කිරීමේ වැඩ සටහනක් එම සංගමය විසින් 2016 වසරේ සිට අරඹා ඇත. 2017 වසරේ ඇරඹී ඇත්තේ එහි තුන්වන අදියරයි. මේ වනවිට පිරිවෙන් 73ක් උදෙසා පොත් කට්ටල පරිත්‍යාග කර ඇත. "සම්බුද්ධ භාෂිත සද්ධර්ම පුස්තක පූජාභිවන්දනා" ලෙස නම් කොට ඇති එම වැඩ සටහන සඳහා "දායාද" සඟරාව ද එක් කොට ගැනීම බෙහෙවින් අගය කළ යුතුය. එම සංගමයේ උපදේශකවරයා අප වෙත එවා ඇති ස්තුති පූර්වක ලිපියෙන් කොටසක් මෙලෙස පළ කරමු.

*"උක්ත පුණ්‍යකර්මයට සමගාමීව ඔබ තුමන් විසින් දායාද සඟරාව ලබා දීම පිළිබඳව කෘතඥ වෙමි. කොළඹ, කෑගල්ල, රත්නපුර, ත්‍රීමලේ, අනුරාධපුර මුලතිව්, වවුනියා දිස්ත්‍රික්ක සහ මැයි 18, 19 දින අම්පාර දිස්ත්‍රික්කයේ සියලු පිරිවෙන් වෙත සද්ධර්ම පුස්තක පූජා කරන අතර තුර අගනා වටිනා දායාද සඟරාව ද තිළිණ කළෙමි. එම සඟරාව සියලු පිරිවෙන් ගෞරවයෙන් පිළිගත් බව ද සඳහන් කරනු කැමැත්තෙමි...."*

කොළඹ අග නගරයෙන් එහා ඈත එපිට දෙහිඅත්තකණ්ඩිය, සිරිපුර, සඳුන්පුර මෙන්ම වවුනියාව, මුලතිව් වැනි ප්‍රදේශ කරා යමින් ඔවුන් සිදුකරන මෙම කාර්යය ජාතික මෙහෙවරකි. එම පුරා විද්‍යා සංගමයට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

# ලංකාව පුරා ශිලාලේඛන රැසක් පිටපත් කෙරේ...



2016 වසරේ පිටපත් කරන ලද සෙල්ලිපියක්

ශ්‍රී ලංකාව තුළ ඇති අභිලේඛන හා කාසි ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම අභිලේඛන හා නාණකවිද්‍යා අංශයේ මෙහෙවරයි. මෙකී මෙහෙවර ඉටු කිරීමේ දී අංශය මගින් 2016 වසරේ දී ව්‍යාපෘති හයක් ක්‍රියාත්මක කරන ලදී.

මේ අනුව ශිලාලේඛන පිටපත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ නව ශිලාලේඛන 157 ක් පිටපත් කර ඇති ලංකාව පුරා විසිරී ඇත. මෙවැනි ශිලාලේඛන පිටපත් කර ඒවා කියවා පර්යේෂණයට භාජනය කිරීම අංශයේ කාර්යභාර්යකි. සෙල්ලිපිවලින් හෙළි වන තොරතුරු මගින් ශ්‍රී ලාංකේය ඉතිහාසයට නව තොරතුරු එක් වන අතර ඓතිහාසික තොරතුරු තතු පිළිබඳ පර්යේෂණය කරන්නා වූ පර්යේෂකයින්ට, විද්වතුන්ට මෙකී ශිලාලේඛන මහඟු මූලාශ්‍රයක් වේ.

ශිලාලේඛන පරිවර්තන නාම පුවරු යෙදීමේ ව්‍යාපෘතිය යටතේ ශිලාලේඛන 22 ක් සඳහා පරිවර්තන නාම පුවරු යොදන ලදී ඇත. පරිවර්තන නාමපුවරු යෙදීමේ දී එකී ශිලාලේඛනයේ ඓතිහාසික වැදගත්කම ස්ථානීය වැදගත්කම යනාදිය කෙරේ ප්‍රමුඛතාව දක්වනු ලැබේ. ශිලාලේඛනයේ ආරක්ෂාව ද, ශිලාලේඛනය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ද මෙමගින් අපේක්ෂිත ය.

2016 වසරේ දී අභිලේඛන හා නාණකවිද්‍යා අංශය මගින් ගම්පහ, උඩුගම්පොල ශ්‍රී සද්ධර්මගුප්ත පිරිවෙනේ පුස්කොළ පොත් 111 ක් සුචිගත කරන ලදී. ඓතිහාසික අභිලේඛන





ගම්පහ, උඩුගම්පොල ශ්‍රී සද්ධර්මගුප්ත පිරිවෙනේ සුචිගත කරන ලද පුස්කොළ පොත් කිහිපයක්

සුචිගත කිරීමේ ව්‍යාපෘති යටතේ මෙය සිදු කළ අතර ධර්ම ග්‍රන්ථ, වෛද්‍ය ග්‍රන්ථ පුස්කොළ පොත් සංචිතය අතර විය.

කාසි සුචිගත කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2016 වසරේ දී දිස්ත්‍රික්ක දෙකක් ආවරණය වන සේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය. ඒ අනුව කුරුණෑගල පඬුවස්නුවර හා යාපහුව කෞතුකාගාරවල තිබූ කාසි ද මහනුවර දිස්ත්‍රික්කයේ නුවර කෞතුකාගාරයේ තිබූ කාසි ද සුචිගත කරන ලදී. මෙහි දී කාසි 633 ක් සුචිගත කළ අතර ඉංග්‍රීසි කාසි, VOC කාසි, රෝම කාසි, මධ්‍යකාලීන කාසි, චීන කාසි ඒ අතර විය.

ශිලාලේඛන සුචිගත කිරීමේ ව්‍යාපෘතිය 2016 වසරේ ක්‍රියාත්මක වූ අතර පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශිලාලේඛන 32 ක් සුචිගත කරන ලදී. දෙයියන්ගේ කන්ද, වෙහෙර වැව, අලුත් හල්මිල්ලෑව, බුද්ධංගල රජමහා විහාරය, බොරළු කන්ද, මොණරාගල, වෙහෙරගල ආදී ස්ථානවල ශිලාලේඛන මේ අතර වේ.

අංශය මගින් පිටපත් කරනු ලබන නව ශිලාලේඛන කියවා, අර්ථ නිරූපණය සිදු කරමින් පර්යේෂණාත්මක ලිපි සම්පාදන කිරීමේ ව්‍යාපෘතිය අභිලේඛන පර්යේෂණ සංග්‍රහය




සුචිගත කරන ලද කාසියක්

ප්‍රකාශයට පත් කිරීමේ ව්‍යාපෘතියයි. මේ ව්‍යාපෘතිය ද සෑම වර්ෂයකම ක්‍රියාත්මක වන අතර බොහෝ විට මෙතෙක් අනාවරණය වී නොමැති ඓතිහාසික තතු මෙවැනි පර්යේෂණවලින් හෙළිකර ගැනීමට හැකි වී ඇත.



2016 අභිලේඛන පර්යේෂණ සංග්‍රහය

අභිලේඛන හා නාණක විද්‍යා උරුමය ආරක්ෂා කිරීමේ කාර්යභාරය සාක්ෂාත් කිරීමේ දී ඉහත ව්‍යාපෘති 2017 වසරේ දී ද අඛණ්ඩ ව ක්‍රියාත්මක වේ. මීට අමතරව 2017 වසරේ දී Epigraphically Notes නමින් නව ව්‍යාපෘතියක් ද ක්‍රියාත්මක වෙමින් පවතී.

**කේ. ඒ. එස්. නාමල් කොඩිතුවක්කු**
අධ්‍යක්ෂ,
අභිලේඛන හා නාණක විද්‍යා

**ධම්මිකා ප්‍රියදර්ශනී ගමගේ**
අභිලේඛන හා නාණක විද්‍යා නිලධාරී

## මහනුවර ජනාධිපති මන්දිරයේ

# පැරණි සිතුවම් සංරක්ෂණය කෙරේ









මහනුවර ජනාධිපති මන්දිරයේ ආලින්දයේ ප්‍රදර්ශනයට තබා ඇති විශාල ප්‍රමාණයේ සිතුවම් හතරක් සංරක්ෂණය කර ගැනීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් ලැබුණි.

මධ්‍යම පළාත් රසායන සංරක්ෂණ අංශය මගින් එම සිතුවම් සංරක්ෂණය කිරීම 2017.02.14 සිට 22 දක්වා ක්‍රියාත්මක කරන ලදී.

උසින් සෙන්ටි මීටර් 330 සහ පළලින් සෙන්ටි මීටර් 217 යුත් සිතුවම් හතරක් අපගේ සංරක්ෂණ කටයුතු සඳහා යොදාගන්නා ලදී. මින් සිතුවම් දෙකක් ප්‍රධාන ආලින්දයේ වම්පසින් සහ අනෙක් සිතුවම් දෙක දකුණු පසින් සිටුවා තිබුණි.

මෙම සිතුවම් කිනම් වර්ෂයක කවුරුන් විසින් අඳින ලද සිතුවම් ද යනාදී තොරතුරු ලබාගත නොහැකි විය. එසේ වුවත් වසර සියයකට ආසන්න ඉතිහාසයකට හිමිකම් කියන බවත් කැන්වස් රෙද්දක් මත කෘත්‍රිම ආලේපන භාවිතයෙන් නිමවා ඇති බව හඳුනාගත හැකිය.

සිතුවම් මත තුනී දූවිලි තට්ටුවක් බැඳී පැවතීම සහ වට ආධාරකයෙහි පතුරු ගැලවීම් විශේෂ ගැටළු වශයෙන් හඳුනාගන්න ලදී.

මෙම සිතුවම්
1. හත්වැනි එඩ්වඩ් රජතුමා
2. ඇලෙක්සැන්ඩ්‍රා බිසව
3. ජෝර්ජ් රජතුමා
4 මේරි බිසව යන රාජකීයන්ගේ ජීවමාන ප්‍රමාණයේ සිතුවම්ය.

සිතුවම්වලට විශේෂ හානියක් සිදුව නොමැති බැවින් සුමුදු බුරුසු භාවිතයෙන් පිරිසිදු කිරීම පමණක් ඉටුකරන ලදී. සිතුවම් සහිත කැන්වසය රඳවා තිබූ දැව ආධාරකයේ (Wood Frame) පළුදුවීම් සහ හානි වූ ස්ථාන පිළිසකර කර වර්ණ ගලපන ලදී. හානි වූ ස්ථාන පිරවීම සඳහා පැරිස් බදාමය යොදාගන්නා ලදී. වර්ණ ගැන්වීම සඳහා ඇක්‍රලික් වර්ණක කොපර් පැහැය සහ රන් පැහැය භාවිතා කරන ලදී.

**මනුර ජයසුන්දර**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
මහනුවර පුරාවිද්‍යා කාර්යාලය

## මිනින්දෝරු සිතියම තුළට ගැසට් කරන ලද පුරාවිද්‍යා ස්ථාන ඇතුළත් කිරීමේ වැඩපිළිවෙලක්

මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ලංකාවේ පරිපාලන මායිම් නැවත නිරවුල් කිරීමට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සෑම දිස්ත්‍රික්කයකට අදාළව සිතියම් සකස් කරමින් පවතී. ඒ අනුව එම ව්‍යාපෘතිය හා ඒකාබද්ධව ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරන ලද පුරාවිද්‍යා ස්ථාන එම සිතියමට ඇතුළත් කිරීමට අපේක්ෂිතය. ඒ අනුව මේ වන විට ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනට අදාළව ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරන ලද පුරාවිද්‍යාස්ථාන අදියර කිහිපයක් යටතේ භූගෝලීය දත්ත මඟින් ස්ථාන සලකුණු කිරීම සිදු කෙරේ. එහිදී එම දත්ත Google earth pro මෘදුකාංගයට ඇතුළත් කිරීම මගින් ස්ථාන ලකුණු කිරීම සිදු කරනු ලබයි. එම දත්ත මිනින්දෝරු දෙපාර්තමේන්තුවට ලබා දීමෙන් පසු අදාළ සිතියම් තුළට පුරාවිද්‍යා ස්ථාන ඇතුළත් කිරීම සිදු කෙරේ.

**අරමුණ :-**
මෙහිදී මෙම ව්‍යාපෘතිය මගින් අදාල ප්‍රදේශයේ පරිපාලන මායිම නව තාක්ෂණික ක්‍රමවේද අනුව නිරවුල් වන අතර එම ප්‍රදේශයට අදාළ පුරාවිද්‍යා ස්ථානවල පිහිටීමේ අනන්‍යතාවය යාවත්කාලීන වේ.

## ජාතික පුරාවිද්‍යා සමුළුවට සමගාමීව ග්‍රන්ථ රැසක් නිකුත් කෙරේ....

ජාතික පුරාවිද්‍යා සමුළුවට සමගාමීව ග්‍රන්ථ රැසක් එළිදැක්වීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු යොදා තිබේ. ඒ අනුව උතුරු පළාතේ යාපනය අර්ධද්වීපයේ පුරාවිද්‍යා උරුමයට අදාළව ත්‍රිභාෂාවෙන් ලියැවුණු ග්‍රන්ථය ප්‍රමුඛ වෙයි. යාපනයේ පුරාවිද්‍යාත්මක වටිනාකමින් ඉහළ ස්ථාන අතුරින් තෝරා බේරා ගත් පුරාවිද්‍යා ස්ථාන රැසක් පිළිබඳ විස්තර එහි අඩංගුය. මෙරට වෙසෙන සිංහල, දමිළ මුස්ලිම් කාහටත් පරිශීලනය කිරීමට හැකි එම ග්‍රන්ථය ආචාර්ය මාලිනී ඩයස්, සුනිල් බණ්ඩාර කෝරළගේ, කල්ප අසංග යන අයගේ රචනා දායකත්වයෙන් නිමැවුණකි.



මෙම සමුළුවේ දී පුරාවිද්‍යා දිස්ත්‍රික් පොත් රැසක් එළිදැක්වීමට ද යෝජිතය. ඒවායින් සමහරක් නවතම කෘතිවන අතර අනෙක්වා යළි මුද්‍රණය කිරීමකි. මීට අමතරව ජාතික පුරාවිද්‍යා සමුළුව වෙනුවෙන් පර්යේෂකයින් විසින් ඉදිරිපත් කළ පර්යේෂණ පත්‍රිකා අඩංගු කොට සැකසූ ග්‍රන්ථය ද එදින එළි දකී.

## 2017 'දායාද' සඟරාව වෙනුවෙන් ලිපි ලේඛන හා නිර්මාණ සැපයුවෝ

'දායාද' පුරාවිද්‍යා පුවත් අටුවාව වෙනුවෙන් එය පරිශීලනය කරනු ලබන විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තිකයින් සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අදාළ විශාල පිරිසක් ලිපි ලේඛණ සපයති. ලිපි ලේඛණවල ඇති නිර්මාණාත්මක බව මෙන්ම පුරාවිද්‍යා ක්ෂේත්‍රයට ඇති අදාළ භාවයත් සඟරාවේ ඇති ඉඩකඩ ප්‍රශ්ණයත් අනුව ඒවා පල කිරීමට තෝරා ගැනේ. ලිපි ලේඛන සැපයූ බොහෝ දෙනා අතුරින් කිහිප දෙනෙකුගේ නම් පහත පරිදි වේ.

ආර්.ජී. ජයතිලක-ප්‍රාදේශීය නඩත්තු කළමනාකරු, එස්.ඩී.පී.ජී. සන්දනායක, බන්දුල විජයරත්න කුමාර, ඩබ්.එම්.යූ. බණ්ඩාර, ඊ.වී. ඉන්ද්‍රානි කුසුමලතා, සිරිපාල ගමගේ යන මහත්ම මහත්මීහු ද කීර්ති සේනාධීර ද සිල්වා රණපනාද විශ්‍රාමලත් පුරාවිද්‍යා සහකාර අධ්‍යක්ෂකතුමන්ට ද අපගේ ස්තූතිය පිරිනැමේ.

21 පිටුවෙන් - එතු සළුපිළි මැවූ....

**තුප්පොට්ටි ඇඳුම**

මහනුවර රාජධානියේ විසූ ප්‍රභූන්ගේ (ELITE) ප්‍රධාන ඇඳුම් විලාසිතා රටාව වූයේ තුප්පොට්ටි නොහොත් නිලමේ ඇඳුමයිග ප්‍රභූහු නිලමේවරු ලෙස හැඳින්වූ අතර ඔවුන්ගේ ඇඳුම නිලමේ ඇඳුම ලෙස වර්තමානයේ භාවිතා කරයි. තුප්පොට්ටිය යන ඇඳුමට යෙදූ නාමය නොවන අතර, එම සුවිශේෂී ඇඳුම සාදා ගැනීමට භාවිතා කළ රෙද්ද තුප්පොට්ටිය, නම් විය. තුප්පොට්ටි බද්ද නමින් මෙම රෙද්ද සඳහා කෝට්ටේ යුගයේ සිට මහනුවර යුගය දක්වා බදු මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදයක් ද තිබූ බව ලිඛිත මූලාශ්‍ර වල සඳහන් වේ.

**උඩරට වෙස් ඇඳුමේ යටිකය ඇඳුම නිර්මාණය කිරීම**

මහනුවර ප්‍රදේශයේ ඉතා ප්‍රචලිත කොහොඹායක් කංකාරිය සඳහා නර්තනයේ යෙදෙන ශිල්පියා භාවිතා කරන වෙස් ඇඳුම් කට්ටලය අපූර්ව නිර්මාණයකිග ඉතිහාස කථා අනුව මලය දේශයේ සිට පැමිණි මලය රජුගේ රජ ඇඳුම අනුසාරයෙන් නිමවූවායි සැලකෙන උඩරට වෙස් ඇඳුමේ යටිකය ඇඳුම නිර්මාණය කිරීම සඳහා විවිධාකාර නම්වලින් හඳුන්වන විවිධ ප්‍රමාණයේ ල විවිධ මතුපිට සහිත වයනයන් ඇති කපුරෙදි වර්ග කිහිපයක් භාවිතා කරයි.

පනාවිටිය අම්බලමේ ඇති නාට්‍යකරුවා ඉන දෙපස ඇති දෙවල්ල ඉතාම කලාත්මක ලෙස තම අභිමත රංගනයට දායක කරගත් ආකාරය කැටයමින් මතු කර ඇත. අධික භ්‍රමණය හමුවේ ශිරීරාංගවලට සිදුවිය හැකි අභ්‍යන්තරික හානි අවම කරනු වස් පොත්පොට නම් රතු පැහැති මීටර් 6 ක පමණ දිග කපු රෙද්ද ජනනේන්ද්‍රිය ආරක්ෂා වන පරිදි කකුල් දෙක අතරින් ඉහලට ගෙන වට කීපයක් වෙලා ගනී.

උඩරට මෙන්ම පහතරට සම්ප්‍රදායේ ද මෙලෙස බෙර කරුවන්ගේ යටිකය ඇඳුම තනි දිග රෙද්දකින් නිම කරගනීග යාර 10 පමණ දිග එම රෙද්ද ඉතාම ක්‍රමානුකූලවල නියමිත හැඩයන් අනුව ඇඟවටා වෙලීම නිසා අපූර්වත්වයෙන් යුත් ඇඳුමක් බිහි වේ.

ශ්‍රී ලාංකික ඇඳුම් අනන්‍ය සලකුණ රැඳී ඇත්තේ රෙද්ද ක්‍රමානුකූලව හසුරුවීමෙන් හැඩතල මවන නිසාවෙනි. ඇඳුමේ බාහිර හැඩය තීරණය කිරීමෙහිලා යොදාගන්නා මූලික සංකල්ප පහ අතිශයින් තීරණාත්මක සාධකයෝ වන බව පැහැදිලි කරුණකි. ඇඳුමේ විශ්වාසනීයත්වය, (Validity) ගොඩ නැංවීම සඳහා යොදාගත් යාන්ත්‍රණය මූලික සංකල්ප ඔස්සේ දියුණු වූ බව පැහැදිලි වේ. අද වන විට ලෝක විලාසිතාවේ නැගීගෙන එන අංශයක් වන තිරසාර විලාසිතා (Sustainable fashion ) සංකල්පයේ හඳුනාගෙන ඇති වැදගත් සංකල්පයක් වන අවම වශයෙන් රෙද්දක් කපා ඇඳුමක් නිර්මාණය කිරීම, ( Pre-Consumer Zero Waste fashion) තනි රෙද්දකින් ඇඳුමක් එතීමෙන්, ගැට ගැසීමෙන් සහ ලොව්විච් යොදා සාදාගත් පසු නැවත එය තිබූ තත්වයටම (තනි රෙදෙද්ක් ලෙසට) ගැලවීමට හැකිවීම (Design for disassembly) වැනි සංකල්ප අප සංස්කෘතියේ මුල්කාලීන සිටම පුරුදු පුහුණු කරමින් ඒවා උපයෝගී කර ගනිමින් අනන්‍යතාව ගොඩනගා ගත් ආකාරය ඉතා ප්‍රශංසනීය වේ.

# දැදිගම ඇත් පහණේ තාක්ෂණික හැඩරුව

පුරාණ ශ්‍රී ලංකාවේ ක්‍රිස්තු පූර්ව තෙවන ශතවර්ෂයේ සිට මනාව ස්ථාපිත වූ ද්‍රව ව්‍යුහාත්මක සංවර්ධන ක්‍රියාදාමයන් 12 වන සියවස දක්වා තරමක් සංකීර්ණ අයුරින් ද ඉන්පසුව සාමාන්‍ය අයුරින්ද පැවත තිබේ. ජලාශ ඉදිකිරීම, ස්වභාවික ජලමූලාශ්‍ර මානව මැදිහත්වීමෙන් පාලනය කිරීම, ජලය බෙදහැරීම, ඇලමාර්ග ඉදිවීම, සොරොව් හරහා ජල පාලනය, බිසෝකොටුව මගින් වැවෙහි පීඩන ජලය වැව් බැම්ම හරහා ඉදිවූ ආවරණ නල මාර්ග මගින් ගොවි බිම් වෙත රැගෙන යාම, වැනි ක්‍රියාදාමයන් දේශීය ඉංජිනේරුවන් විසින් ද්‍රව තාක්ෂණය යොදගන්නා ලද මහාපරිමාණ මැදිහත්වීම් ය. එලෙස යොදගන්නා ලද ද්‍රව තාක්ෂණයන්ගේ විද්‍යාත්මක සොයාබැලීම් හා පර්යේෂණයන් මේවනවිට විවිධ පර්යේෂණ ආයතන විසින් සිදුකර තිබේ. මීට අමතරව ක්ෂුද්‍ර ලෙසින් භාවිතයට ගන්නා ලද දේශීය ඉංජිනේරුවන්ගේ දක්ෂතාවයන්ගේ පුදුම සහගත බව වර්තමාන විද්‍යාඥයින්ට ද මහත් කුහලකි. මේ අතරින් ක්ෂුද්‍ර තාක්ෂණික ක්‍රියාදාමයන් රැසක් රැදි දැදිගම ඇත් පහන ලාංකීය පුරාණ ඉංජිනේරුවන්ගේ විශිෂ්ඨත්වය මැනවින් පිළිබිඹු කරනු ලබන සුවිශේෂී පුරාවස්තුවකි.

වර්ෂ 1951 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතාගේ මූලිකත්වයෙන් සිදුකරන ලද පර්යේෂණ කැණීම් මගින් දැදිගම කොටවෙහෙර ස්මාරකයේ කරුණු රැසක් අනාවරණය වන්නට විය. පසින් වැසීගිය මෙම ස්මාරකය කුඩා ස්ථූපයක් කේන්ද්‍රකර ගනිමින්, අර්ධ ගර්භයෙන් යුතු කොටවෙහෙරක සවරූපයෙන් ගොඩනගා ඇතිබව කැණීම් මගින් පැහැදිලි කරගෙන තිබේ.

ඒ අනුව කැණීමත් සමඟ විවර කරන ලද පලමු නිධන් ගර්භයේ තිබූ ඇත්පහන් දෙකට හිමිවන්නේ ඉහල අගයකි. මෙලෙස හමුව ඇති



පහණ කොටස් කීපයකින් සමන්විතය. එහි ඉහල සිට පහලට පිළිවෙලින්, එල්ලීමට භාවිතයට ගන්නා නයි පෙණයක හැඩැති කොක්ක, බෙරවයන්නන්ගේ හා නැට්ටුවන්ගේ රුව සහිත එල්ලා තබන දම්වැල, අලියා මත අලංකාර කැටයම් සහිතව නිර්මාණය වූ මකර තොරණ, ඇතා මත වාඩිවී සිටින ඇත්ගොව්වා, අභ්‍යන්තර කුහරය සහිතව විශේෂයෙන් නිර්මාණය වූ පිරිපුන් ඇතා, පහන් දැල්වීමට හා තෙල් රැඳීම සඳහා යොදගත් තැටිය මෙහි ප්‍රධාන කොටස් ය.

පහන් දැල්වීම සිදුවන තැටිය තෙල්රැඳීම සඳහා භාවිතකර තිබේ. තෙල් ගබඩාවීම සිදුව ඇත්තේ අලියාගේ කුසතුලය. පහන් දැල්වීමෙන් නිමවන තෙල් පිරවීම සිදුව ඇත්තේ ස්වයංක්‍රීය යාන්ත්‍රණයකිනි. එහිදී අලියාගේ කුසට තෙල් පුරවා ඇත්තේ ඉදිරි දකුණු පාදයේ වූ නලයකිනි. එම නලය කුස තුලට තෙල් පුරවා අනෙක් පසට හැරවූ පසු නැවත තෙල් ගලානොයන උසකින් නිමවී තිබේ. පහනේ තෙල් දැවීමෙන් ඇතිවන අඩුව පිරවීම ඇතාගේ ලිඟුව හරහා ඇති නලයකින් සිදුවේ. මෙම ලිඟුව හරහා ඇති නලයෙන් සැමවිටම තෙල් වැගිරීමක් ද සිදු නොවේ. පහනේ ඇති විශේෂත්වය එයයි. ඉදිරි දකුණු පාදයේ වූ සිදුරේ පහල කෙලවර තැටියේ තෙල් මගින් ආවරණය වී ඇති කාලසීමාවේදී තෙල් වැගිරීම සිදුනොවේ. පහන දැල්වීමෙන් තැටියේ තෙල් අඩුවූ අවස්ථාවේ එම ඉදිරි පාදයේ නලය විවරවීම සිදුවනවාත් සමඟ එම නලය මගින් ඉහලට ඇදීයන වායුධාරාවේ පීඩණය මතින් ලිඟුව හරහා තෙල් වැගිරේ. තෙල් ගලාවීම සිදුවන්නේ දහන වේගය මතයි. එලෙස අඛණ්ඩව ගලාගෙන එන තෙල් මගින් පහනේ තැටිය ඉදිරි පාදයේ සිදුර දක්වා තෙල් මගින් පිරුණු පසු යලිත් තෙල් වැගිරීම ඇන හිටින්නේ කුසතුලට ගලායන වායු ධාරාව නවතින නිසාය. තෙල් අවශ්‍ය ප්‍රමාණයට ගලා ඒමෙන් පසුව ස්වයංක්‍රීයව වායු පීඩන තාක්ෂණයෙන් නවතින ලෙසින් සකස්කර ඇත්තේ කුටිය අභ්‍යන්තරයේ ඇති ඔක්සිජන් සියල්ලම දහනය වන තෙක් තෙල් පැවතිය යුතු නිසාය.

මෙම ක්‍රියාවලිය සරල බවකින් පෙනුනද සිදුවන විද්‍යාත්මක යාන්ත්‍රණය ඉතාමත් ගැඹුරු හා නියමයන් භෞතික විද්‍යා මූලධර්මයන් කීපයක එකතුවකින් නිර්මණය වී තිබේ. විශේෂයෙන්ම මෙම ඇත් පහන තුල භෞතික විද්‍යා මූලධර්මයන් වූ බොයිල්ගේ නියමය, ජල ගතික විද්‍යාව, ද්‍රවස්ථිතික විද්‍යාව යන නියමයන් ක්‍රියාත්මකවීම නවීන විද්‍යාඥයින් ද පුදුමය පලකරයි. එම තත්ත්වයන් වායුනියමයන් යටතේ හඳුනාගතයුතු සංකීර්ණ විද්‍යාත්මක ක්‍රමවේදයන් ය. මෙහි අගය හා විද්‍යාත්මක පසුබිම වටහාගන්නා ලද ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය මගින් මෙම ඇත් පහනේ ආකෘතියක් තනා ක්‍රියාකාරීත්වය සජීවී ලෙසින් දැකගැනීමට සලස්වා තිබීම පැසසුම් හිමිවිය යුතුය.

**එච්. එම්. සමන් කුමාර**
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
සීතාවක.

# වාරි පුරාවිද්‍යාව හඳුනාගැනීම සහ එහි පරමාර්ථ



පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් වන අතුරු ප්‍රධාන විෂයක් වන වාරි පුරාවිද්‍යාව (Irrigation Archaeology) මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකරනු ලබන්නේ පුරාතන සමාජයන්හි ජීවත් වූ ජනතාව කෘෂි කර්මාන්තය ප්‍රධාන කොටගත් තම විවිධ වූ අවශ්‍යතාවයන් සඳහා වාරි ජලය සම්පාදනය කර ගැනීමට අනුගමනය කළා වූ නොයෙකුත් ජල සම්පාදන ක්‍රමවේදයන් සම්බන්දයෙනි. පුරාතන වාරි කර්මාන්තය හා සමාජය පිළිබඳ ව සෘජු අවධානයන් එමගින් යොමු කරනු ලැබේ.

මෙකී ජල සම්පාදන ක්‍රමවේදයන් පොදුවේ හඳුන්වනු ලබන්නෙ වාරි කර්මාන්තය යනුවෙනි. වාරි ජල සම්පාදන ක්‍රියා මාර්ග පුරාතන ලෝකයෙහි විවිධ ස්වරූපයෙන් යුතුව ඉදිරිපත් වී ඇත. ප්‍රධාන වශයෙන් ඒ සඳහා බලපා තිබෙන්නේ එම මානව ශිෂ්ඨාචාර බිහි වූ කලාපයේ පැවති භූ භෞතික පරිසරය හා දේශගුණයයි. භූමියට හා දේශගුණයට අනුගතව තම ජීවන රටාව සකසා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස වාරි ජල සම්පාදන ක්‍රමවේදයන් ගොඩනගා ගත් බව සිතිය හැකි ය. අනාදිමත් කාලයක සිට මිනිසා හා පරිසරය අතර පවතින දැඩි සබඳතාව තුළ මිනිසාත්, ජලයත් අතර පවතින සම්පතාව ඉතා ඈත අතීතයේ තෙක්ම විහිද යන බවට සාක්ෂි ලොව පැරණි ජන සමාජ ඇසුරින් හඳුනා ගැනීමට පුළුවන. විවිධ ජල මූලාශ්‍රයන් ස්වාභාවික උරුම ඝනයට අයත් වුවත් ඒවා විවිධ මානව අවශ්‍යතා සඳහා උපයෝගි කර ගැනීමේ ක්‍රියා මාර්ග තුළ ඒ හා බැඳුනු සංස්කෘතික උරුමයන් ගොඩනැගී තිබේ. නයිල්, ඉන්දු, යුප්‍රටීස් ටයිග්‍රිස්, හොවැංහෝ, ඇතුළු බොහෝ පැරණි ශිෂ්ඨාචාර ආශ්‍රිත ව ජලය හා බැඳුනු සංස්කෘතීන් ගොඩනැගුණු බවට සාක්ෂි පවති. මායා, ඉන්කා වැනි කඳුකර ප්‍රදේශ ආශ්‍රිත ශිෂ්ඨාචාරවල එම පරිසරයට ආවේණික සුවිශේෂී වූ වාරි ජල සම්පාදන ක්‍රම ගොඩනගාගෙන තිබෙන බවට සාක්ෂි මෙයට තවත් නිදසුනකි.

මනුෂ්‍ය සමාජයේ ප්‍රභවය හා විකාශනය සමග අත්වැල් බැඳගන්නා වූ ප්‍රධානම ක්ෂේත්‍රය වන්නේ තාක්ෂණයයි. තාක්ෂණය නොමැතිව කිසිදු මානව සමාජයක වර්ධනයක් සිදුවී නොමැත. ඒ අනුව තාක්ෂණය යනු සමාජයේ ප්‍රගමනය තීරණය කරනු ලබන වැදගත් සාධකයක් බවට පත්වී තිබේ. වාරි කර්මාන්තය ද මිනිසාගේ ජීවන පැවැත්මට සම්බන්ධ වූ වැදගත් තාක්ෂණික ක්‍රියාවලියක් ලෙස හඳුනාගැනීමට පුළුවන. ඒ අනුව පුරාතන වාරි කර්මාන්තය සමග සම්බන්ධ වූ එකී තාක්ෂණික ක්‍රියාවලිය විද්‍යාත්මක ලෙසින් අනාවරණය කර ගැනීම වාරි පුරාවිද්‍යාවේ කාර්ය භාරය වේ.




වාරි පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ පැරණි වාරි කර්මාන්ත සම්බන්ධයෙන් පවතින භෞතික සාක්ෂි පිළිබඳ ව ය. මූලාශ්‍රයන් හී සඳහන් තොරතුරු වලින් ඔබ්බට ගොස් ගවේශන, කැනීම් වැනි පර්යේෂණ ක්‍රියාමාර්ග මගින් එකී සාධක අනාවරණය කර ගැනීම, විද්‍යාත්මක ලෙසින් තාක්ෂණික ක්‍රියාවලිය සහ ශිල්ප ක්‍රම අධ්‍යයනය කිරීම, එවැනි ස්ථාන අනාගත පරපුර උදෙසා සංරක්ෂණය කොට ආරක්ෂා කර ගැනීම වාරි පුරාවිද්‍යාව විෂයෙහි ප්‍රධාන පරමාර්ථ අතර වේ.

ශ්‍රී ලංකාවේ පුරාණ වාරි කර්මාන්තය යනු මෙරටට ම ආවේණික වූ අපගේ ජාතික උරුමයකි. ශ්‍රී ලංකාවට සුවිශේෂී වූ අනන්‍යය ලක්ෂණ රැසක් මෙරට පැරණි වාරි කර්මාන්ත ඇසුරින් හඳුනා ගැනීමට පුළුවන. ප්‍රධාන වශයෙන් වැව්, අමුණු හා ඇළ මාර්ග පදනම් කර ගනිමින් ගොඩනැගුණු මෙරට පැරණි වාරි කර්මාන්තය තුළ සුවිශේෂී දේශීය තාක්ෂණික අංග රාශියක් දක්නට ලැබේ. බිසෝ කොටුව සොරොව්ව, කැට සොරොව්ව, රළපනාව ආදි තාක්ෂණික අංග මෙයට නිදසුන් වේ.

කෙසේ වෙතත්, මෙරට පුරාණ වාරි කර්මාන්ත පිළිබඳ සාක්ෂි ඉතාමත් වේගයෙන් විනාශය කරා ගමන් කරමින් දැයට අහිමිව යමින් පවතී. වාරි කර්මාන්තය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ පැරණි වාරි උරුමය පිළිබිද සාක්ෂි ආරක්ෂා කර ගනිමින් නව ප්‍රතිසංස්කරණ සිදුනොවීම, පැරණි වාරි තාක්ෂණය බැහැර කරමින් කටයුතු කිරීම, වෙනත් මානව ක්‍රියාකාරකම් සහ ස්වාභාවික ව්‍යසන මෙරට පැරණි වාරි කර්මාන්තය විනාශයට හේතු වී තිබේ.


ශ්‍රී ලංකාවේ වාරි උරුමයන් හඳුනාගෙන විනාශකාරී තත්ත්වයන්ගෙන් මුදවාගෙන අනාගත පරපුර වෙත දායාද කිරීම වාරි පුරාවිද්‍යාව විෂයය ක්ෂේත්‍රයේ ප්‍රධාන පරමාර්ථය විය යුතුය. එවැනි ස්ථාන සම්බන්ධයෙන් විධිමත් පර්යේෂණ පවත්වා නිවැරදි අනාවරණය කර ගැනීම් පිළිබඳ තොරතුරු ජනතාව වෙත ඉදිරිපත් කරලීම මෙහි ප්‍රධාන අරමුණක් වේ. මෙරට පැරණි



වාරි කර්මාන්තය සමග බැඳුණු සාම්ප්‍රදායික අංග රැසක් මෙන්ම, ආවේනික වාග් කෝෂයක්, සිරිත් විරිත් සමුදායක් පවතී. එහෙත් මේ බොහෝ ක්ෂෙත්‍ර සම්බන්ධයෙන් සමාජය තුළ පවතින්නේ නිවැරදි අවබෝධයන් හෝ අර්ථකථන නොවේ. එම තොරතුරු බොහොමයන් අසත්‍යයෙන් වැසී ගොස්ය. ඇතැම් තොරතුරු හුදු ප්‍රලාප බවට පත්ව ඇත. ඒ අනුව ජනගත වී තිබෙන වැරදි තොරතුරු නිශ්ප්‍රභ කිරීමට නව පර්යේෂකයින්ට මෙම විෂයෙන් දොරටු විවර කෙරේ.

**චන්දන රෝහණ විතානාච්චි**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

# ලේඛන ඉතිහාසය හා පුස්කොළ පොත්



සත්ත්ව ලෝකයේ අන්‍ය ජීවීන් අතරින් මානව වර්ගයා වෙන්කර හඳුනා ගැනීමේ ප්‍රධානම ලක්ෂණය වනුයේ භාෂා භාවිතය ය. මිනිසාගේ සකලවිධ අත්දැකීම් ප්‍රකාශකිරීම සඳහා භාෂාව වැදගත් වේ. භාෂාව භාවිතා වන ආකාරය අනුව එය දෙවැදෑරුම් වේ.

1. භාෂණය
2. ලේඛනය

භාෂණයේ පශ්චාත් ඵලයක් වශයෙන් ලේඛනය බිහි වේ. මෙම ලේඛනය තුළින් භාෂාවේ චිරස්ථිතිය තහවුරු වේ. ඒ අනුව මානව චින්තනයේ අග්‍රගණ්‍ය සංස්කෘතික ඵලය ලේඛනය යි. ලේඛනයේ ඉතිහාසය සම්බන්ධයෙන් විවිධ මතයන් පවතී. ඒ අතරින් එක් විද්වත් මතයක් වනුයේ ස්පාඤ්ඤය, බැබිලෝනියාව, මිසරය ආදී රටවල භාවිතා වූ පැරණි චිත්‍රාක්ෂර ලේඛනයේ ආදීතම සාධකයන් වන බවයි. මින් අනතුරුව සංකේතාක්ෂර, ශබ්දාක්ෂර හා කුඤ්ඤාක්ෂර භාවිතා වූ බව විශ්වාස කෙරේ. මොහෙන්ජොදාරෝ හරප්පා ශිෂ්ටාචාරයෙන් හමුවන ක්‍රි. පූ. 30000 ට වඩා පැරණි චිත්‍රාක්ෂර විශ්වීය ලේඛනයේ ප්‍රාරම්භය තහවුරු කරන බවට තවත් විද්වත් මතයක් පවතී.

පුරාවිද්‍යාඥ මතයට අනුව මානව ඉතිහාසයේ මූලාරම්භයේ පටන් ම මිනිසා භාෂණයට මෙන් ම විවිධ ලිඛිත ක්‍රම වලට ද හුරු වී සිටි බව තහවුරු කරයි. ලංකාවේ පුරා ශිලා යුගයට තරම් ඈතට දිවෙන ලේඛන කලාවක් පිළිබඳ තොරතුරු පුරාවිද්‍යාඥයින් විසින් තහවුරු කර ඇත. දැදුරු ඔය මධ්‍ය නිම්නයේ පිහිටි අරන් කැලේ සහ ගනේවිහාර යන පුරාවිද්‍යා ස්ථානවල පැවති ලෙන් හා තවත් එබිදු ස්ථාන කිහිපයක චිත්‍ර සටහන් හමු වී ඇති එමෙන් ම දොරවක්කන්ද කැණීමේ දී නවශිලා යුගයට අයත් සංකේත රූප හමුවී ඇති එමෙන් ම ප්‍රොටෝ ඓතිහාසික යුගයට අයත් යැයි සිතිය හැකි මුද්‍රා සහිත වළං කැබලි හමුවීමෙන් හා මෙගලිතික සුසානවලින් විවිධ සංකේතයන් අනාවරණය වීමෙන් ද පැහැදිළි වනුයේ එවක සංකේතාත්මක ලේඛන ක්‍රමයක් පැවති බව යි. ලේඛන කලාවක ප්‍රාථමික අවස්ථා ලාංකීය ප්‍රාග් ඓතිහාසික යුගයේ පැවති බව ට මෙම සාධක සාක්ෂි සපය යි. එසේම පැරණි කාසිවලින් ද සංකේත නිරූපණයක් හඳුනාගත හැකි අතර මේ තුළින් ද පැහැදිළි වනුයේ සංකේතාත්මක ලේඛන කලාවක් අතීතයේ පැවති බවයි.

කෙසේ වුවත්, සිංහල ලේඛන කලාව පිළිබඳ ප්‍රත්‍යක්ෂ සාධක හමු වනුයේ මහින්දාගමනයත් සමග රචිත පුරා ලිපි මගින් ඇරඹි ලේඛන සම්ප්‍රදාය තුළ ය. ශිලා පුවරු හා මැටි පුවරු වැනි ස්ථාවර මාධ්‍යයෙන් හැරුණු විට සිංහල ලේඛනය සඳහා භාවිතා වූ ජංගම මාධ්‍යයන් වනුයේ තල්කොල, ලී පතුරු, රෙදි, ගඩොල් ආදිය යි. මේ අතරින් පෘතුගීසි සමයේ මුද්‍රණ කර්මාන්තය ඇරඹෙන තුරු ලංකාවේ බහුලව ව්‍යාප්ත වූ ලේඛන මාධ්‍ය වූයේ තල්කොළ ආශ්‍රයෙන් නිර්මිත පුස්කොල ලේඛනය යි.

කිසියම් සංස්කෘතියක් සතු දැනුම් සම්භාරය හා පාරම්පරික ඥානය අනාගතය වෙත සම්ප්‍රේෂණය කරනු ලබන්නේ සමකාලීන ලේඛන මාධ්‍යයන් තුළිනි. වසර දහස් ගණනක් තිස්සේ ශ්‍රී ලාංකීය සමාජය විසින් අත්දැකීමෙන් හා ප්‍රත්‍යක්ෂයෙන් ග්‍රහණයකරගත් සාම්ප්‍රදායික දැනුම එක්තැන් වී ඇත්තේ ලංකාවේ පැරණි ලේඛන මාධ්‍ය වූ පුස්කොළ පොත් වලය. එහෙයින් මෙම ලේඛන ජාතික උරුමයක් සේ සැලකිය යුතු යි අතීත ශ්‍රී ලංකාවේ මෙන් ම දකුණු හා අග්නිදිග ආසියාතික රටවල වසර දහස් ගණනක් තිස්සේ ප්‍රධාන ලේඛන මාධය බවට තල්පත් පත්ව තිබුණි. ක්‍රි.පූ. යුගයේ පටන්ම මෙම ලේඛනය පැවති බව සාහිත්‍ය මූලාශ්‍ර මෙන්ම පුරාවිද්‍යා මූලාශ්‍ර ද සාක්ෂි සපය යි.

ක්‍රි. පූ. 3- ක්‍රි. ව. 1 අතර කාලයේ පුස්කොළ පොත් පැවති බවට පුරාවිද්‍යාත්මක කැණීම් මගින් තොරතුරු අනාවරණය වී ඇති නිදසුනක් ලෙස අනුරාධපුර ඇතුල්නුවර සල්ගහ වත්ත 2 කැණීමෙන් ඇත්දළ මාධ්‍යයෙන් හා සත්ත්ව අස්ථි මාධ්‍යයෙන් නිර්මාණය කරන ලද පොත්කම්බා හමුවී ඇත. තව ද අනුරාධපුර ඇතුල්නුවර හා කිරින්ද කැණීම් වලින් පුස්කොළ පොත් ලිවීම සඳහා භාවිතා වූ පන්හිඳවල් හමු වී ඇත.


මේ අනුව අනුරාධපුර මුල් යුගයේ සිට ම තල්පත් වල ලේඛන කටයුතු සිදුකළ බවට පුරාවිද්‍යා මූලාශ්‍ර මෙන්ම සාහිත්‍ය මූලාශ්‍ර ද සාක්ෂි සපය යි. එනම් අනුරාධපුර යුගයේ සිදු වූ මහා පරිමාණ ලේඛන කටයුතු වන ක්‍රි. පූ. 3 වන සියවසයේ හෙළ අටුවා රචනා කිරීම, ක්‍රි.පූ 1 වන සියවසයේ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම හා ක්‍රි. පූ. 5 වන සියවසයේ පාළි අට්ඨකථා ලිවීම යන කටයුතු සඳහා පුස්කොළ භාවිතා කරන්නට ඇති බව පිළිගත හැකි ය. නමුත් මේ දක්වා බහුල වශයෙන් ශේෂව ඇත්තේ ක්‍රි. ව. 19 වන සියවසට අයත් පුස්කොළ පොත් ය.

ක්‍රි. ව. 5 වන සියවසයේ බුද්ධඝෝෂ හිමියන් විසින් රචනා කරන ලද සමන්තපාසාදිකා හා කංඛාවිතරණී යන අට්ඨකථාවල ලේඛන මාධ්‍ය වශයෙන් තල්පත් භාවිතා කළ බව සඳහන්කර ඇත. තව ද සංයුක්ත නිකාය අට්ඨකථාවෙහි හා විශුද්ධි මාර්ගයේ විහාර ආශ්‍රිතව තල් ගස් වගාකර තිබූ බව සඳහන්කර ඇත. මෙම ගස් වගා කරන්නට ඇත්තේ පුස්කොළ සකස්කර ගැනීමට බව සිතිය හැකි ය.

ක්‍රි. ව. 10 වන සියවස වන විට තල් ගස් කැපීම තහනම් කරමින් රාජ ආඥා පණවා තිබුණි. පුලියන්කුලම ශිලා ලිපියක හා හතර වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ සිදහන් තොරතුරු මේ සඳහා සාක්ෂි සපය යි. එසේ ම ක්‍රි. ව. 12 සියවස වන විට ප්‍රධාන ලේඛන මාධ්‍ය පුස්කොළ වූ බවට ද අභිලේඛන සාක්ෂි සපය යි. එනම් එකල මෙම ලේඛන මාධ්‍ය ඉතා ජනප්‍රිය ව පැවති බවත්, ඒවාට මීයන් හා වේයන්ගෙන් දැඩි තර්ජනයන් පැවති බවත්, නිශ්ශංකමල්ල රජුගේ පොළොන්නරු පුවරු ලිපියේ සිදහන් වේ.

දැනට අනාවරණය වී ඇති පරිදි සිංහල අකුරින් ලියැ වී ඇති පැරණිම පුස්කොළ ලේඛනය ක්‍රි. ව. 7 වන සියවසට අයත් මහායාන ධාරණී ග්‍රන්ථයකි. මෙම ග්‍රන්ථය චීනයේ විහාරස්ථානයක පවතින බව හෙළි වී ඇත. වර්තමානයේ දැනට ශේෂව ඇති පුස්කොළ පොත් අතරින් වැඩි ප්‍රමාණයක් රචනාකර ඇත්තේ 18 හා 19 වන සියවස් හි දී ය. මෙම පොත් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක අන්තර්ගතය මෙම කාලයට වඩා වසර සිය දහස් ගණනක් පැරණි ඒවා බව අමතක නොකළ යුතු ය. ලංකාවේ දැනට ශේෂව ඇති පැරණිම පුස්කොළ පොත ක්‍රි. ව. 13 වන සියවසට අයත් චුල්ල වග්ගය යි.

සමස්තයක් ලෙස සලකා බලන කල්හි ලේඛන මාධ්‍යයක් ලෙස පුරාණයේ සිටම



පුස්කොළ පොත් භාවිතා වූ බව මෙතුළින් තහවුරු වේ. ශ්‍රී ලාංකීය ජන සමාජයේ විවිධ සංස්කෘතික පැතිකඩයන් නිරූපණය කරනු ලබන මෙම පුස්කොළ පොත් ජාතික උරුමයක් සේ සලකා ලේඛනගත කිරීම, සංරක්ෂණය කිරීම, අමුද්‍රිත පොත් මුද්‍රණය කිරීම ආදිය සිදු කිරීම කාලීන අවශ්‍යතාවයකි. පුස්කොළ පොත් පිළිබිඳ දැනට කෙරී ඇති පර්යේෂණ අවම මට්ටමක පවතින බැවින් නවක පර්යේෂකයන්ට, දැනුම සොයන ගවේෂකයන්ට මෙම ක්ෂේත්‍රය වඩාත් වැදගත්වනු ඇත. පුස්කොළ පොත් ලේඛනය පිළිබිඳ ජනතාව දැනුවත් කිරීම සිදහා ලිපි මුද්‍රණය කර ප්‍රකාශයට පත්කිරීම, ප්‍රදර්ශන සංවිධානය කිරීම ආදිය තුළින් මෙම ජාතික උරුමය අනාගත පරපුර වෙත දායාද කිරීමේ ශක්‍යතාව පවතී. කිසියම් සංස්කෘතියක් සතු දැනුම් සම්භාරය හා පාරම්පරික ඥානය අනාගතය වෙත සම්ප්‍රේෂණය කරනු ලබන මෙම ලේඛන කලාව ජාතික උරුමයක් සේ සලකා රැක ගැනීම අප සැමගේ වගකීම හා පරම යුතුකම වන්නේ ය.

**ඒ. ජී. ටී. සංජීවනී**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
අවිස්සාවේල්ල.

# මධ්‍යවලව නිම්නයේ ව්‍යාප්ත වූ ප්‍රධානඝර සංකීර්ණය

මධ්‍යවලව නදී නිම්නයේ පිහිටි පුරාවිද්‍යාත්මක ස්ථාන අතුරින් බුදුගල පධානඝර සහිත නටඹුන් ස්ථානයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ. බලන්ගොඩ නගරයේ සිට දකුණු දෙසට දිවෙන වේලිඔය මාර්ගයේ කිලෝමීටර් 32 ක් ගියවිට උග්ගල් කල්තොට හමුවේ. එතැන් සිට වැලිපතයාය කපුගල දෙසට දිවෙන මාර්ගය ඔස්සේ කි.මී. 2 1/2 ක් පමණ ගිය විට බුදුගල ගල්ලෙන් විහාරය හා පධානඝර සහිත නෂ්ඨාවශේෂ පිහිටි ස්ථානයට ලගාවිය හැකියි.

බුදුගල, කාලයාගේ ඇවෑමෙන් වනගතව ගිය අතීත බෞද්ධ උරුමයේ ප්‍රෞඪ වූත්, සුවිශේෂ වූත්, කේන්ද්‍රස්ථානයක් බව ශේෂව ඇති නෂ්ඨාවශේෂ අනුව පෙනී යයි.

මෙම ප්‍රදේශයට අදාළව මා විසින් සිදු කරන ලද ස්වයං අධ්‍යයනයේ දී පධානඝර 13 ක්ද, වැසිකිලි 02 ක්, කැසිකිලි 01 ගොඩනැගිලි 02 පනා බැම් 01 පිවිසුම් දොරටු 01 වශයෙනි.

පනා බැම්මට සමීපව ආයත චතුරස්‍රාකාර ගොඩනැගිල්ලක නෂ්ටාවශේෂ හමුවේ. එය මීටර් 20ක් පමණ දිගින්ද මීටර් 12.90 පමණ පළලින්ද යුක්තය. ගොඩනැගිල්ලට පිවිසීමට පියගැට 4 කින් යුක්ත පඩි පෙලකි. මෙම ගොඩනැගිල්ල මධ්‍යයේ හතරැස් ගල් කණු සිටුවා තිබී ඇත. දැනට මෙහි එම ගල් ටැම් වල පාදම් හා ඇලවුණු ගල් කණු කිහිපයක් දැකිය හැකිය. අඩි 8 ක් පමණ මෙම ගල් කණුවක් උස්ව පිහිටා ඇත. එවැනි ගල් කණු දෙකක් ගොඩනැගිල්ල මධ්‍යයේ බිම වැටී ඇත. ගොඩනැගිල්ල උතුරින් හා දකුණින් තවත් එවැනිම ගල් කණු දෙකක් ඇල වී ඇත. ගොඩනැගිල්ල මැද ගල්, ගඩොල් කැබලි සමූහයක් වේ.

මෙම ස්මාරකයේ සිට මීටර් 18.20 දුරින් පළමු පධානඝරය වටා යොදා ඇති ප්‍රාකාර බැම්ම වේ. එය සිව් දිශාවම වන්නට විශාල ගල් කුට්ටි යොදා වටකර ඇත. එහි එක් පසක දිග මීටර් 36.20 කි. පළල මීටර් 34 කි.

බැම්මට යාබදව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් මෑත කාලයේ සංරක්ෂණය කරන ලද පධානඝරය වේ. මෙය භූමි මට්ටමින් අඩි 5 ක් පමණ උසකින් ආයත චතුරස්‍රාකාර කුටි දෙකකින් යුක්තය.

මෙම ස්මාරකය සංරක්ෂණය කර ඇති බැවින් හඳුනා ගැනීම පහසුය. පධානඝරයේ විශාල කොටසේ සිට කුඩා කොටසට යෑම සඳහා මැද වේදිකාවක් වේ. මැද වේදිකාවේ සිට දෙපසට බැසිය හැකි පරිදි පියගැට 4 කින් යුත් සෝපාන පංති දෙකකි. පධානඝරයේ උතුරින් ඇති චතුරස්‍රාකාර හැඩයෙන් යුත් කොටසෙහි ගල් කණු පාදම් 8 ක් වේ. මෙම ගල් කණු වහලක් දරා සිටීමට තරම් උසකින් තිබී පසු කාලීනව විනාශ වන්නට ඇත. මෙම කුටිය මීටර් 19.50 දිගින්ද මීටර් 14 ක් පලළින්ද යුක්තය. මෙම කොටසට ඇතුළු වීම සඳහා පියගැටපෙළ 4 කින් යුත් සෝපානයක් වේ. මෙම පධානඝරයේ ඉදිරිපස විශාල මණ්ඩපය දිග මීටර් 20.70 හා පළල මීටර් 15.65 කි. මෙම



බුදුගල පහත මළුවේ පධානඝරය



බුදුගල ඉහල මළුවේ පධානඝරය

කොටසෙහි සුවිශේෂී කැටයම් ගලක කොටසක් වේ. මිනිස් ක්‍රියාකාරකම් වලින් විනාශ වී ඇති මෙම ගල් පුවරුවේ ශේෂ වූ කොටස අඩි 4x4 ප්‍රමාණයෙන් යුක්තය. අඩි 2 ක් පමණ උස මෙම ගල් පුවරුවේ අර්ධොන්නත ලෙස නිර්මාණය කර ඇති කොළ සහිත නෙළුම් මල් රටාවකි. මෙහි ශේෂ වී ඇති කොටසෙහි නෙළුම් මල්, කැකුළු, දඬු, කෙමිය හා කර්ණිකාව පැහැදිලි දැකිය හැකි වේ.

මෙම පධානඝරයේ සිට ඉහළ මළුවේ සංරක්ෂණය කර ඇති පධානඝරය කරා යෑමට විශාල පියගැටපෙලකි. ගලින්ම නිම කරන ලද පියගැට 107 කින් හා ගල් වැටි අල්ලා සකසන ලද මළු 23 කින් යුක්තව මෙම සෝපාන පංතිය නිර්මාණය කර ඇත.

සෝපාන පංතියට යාබදව පිහිටි පුරාවිා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කර ඇති මෙහි ඇති පධානඝරය කලාත්මක බවින් හා නිර්මාණශීලීත්වයෙන් ඉහළ අගයක් ගනී. සාමාන්‍යයෙන් මෙහි දිග පළල මීටර් 60.30 පමණ වේ. පොළොව මට්ටමේ සිට අඩි 4 ක් පමණ ඉහළින් පධානඝරය නිර්මාණය කර ඇති මෙහි සුවිශේෂීත්වය පාදම් වටේ ලී ස්තර තීරු හා කවාකාර බොරදම් නිර්මාණය කර තිබීමයි. පධානඝර දෙක අතුරින් දෙපසට බැසිය හැකි පරිදි නිර්මාණය කර ඇති සෝපාන පංති දෙක පියගැට 5 කින් සමන්විතයි. මෙහි මතුපිට ඔප මට්ටම් කරන ලද පැතලි ගල් පුවරු එකිනෙකට බද්ධකර ක්‍රමවත්ව සකස් කිරීම සුවිශේෂයි.

බුදුගල පධානඝර සංකීර්ණයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන සංරක්ෂණය කර ඇති පධානඝර දෙකට අමතරව තවත් පධානඝර 11ක පමණ සාධක මා හට හඳුනා ගැනීමට හැකි විය. ඒ අනුව සංරක්ෂිත ඉහළ පධානඝරයේ සිට බටහිර දෙසට (පඩිපෙල ඇති පසට) ගමන් කිරීමේදී මීටර් 39 ක් පමණ දුරින් ගරා වැටී ඇති පසින් වැසී ගිය තවත් ප්‍රධානඝරයක සාධක හඳුනා ගැනීමට හැකි විය. කුටි දෙකෙහිම සාධක අතරින් පතර පැහැදිලිව හඳුනා ගත හැකියි. මීටර් 12.30 පමණ දිගට හා ඉදිරිපස කුටිය මීටර් 7.50 ක්ද කුඩා කුටිය මීටර් 5.60 ක්ද ලෙසින් පළල හඳුනා ගත හැකි විය. පඩි පෙලත් සමඟ ඇති මළුවෙන් දකුණට බැසීමට තවත් පඩිපෙලකි. කුටි දෙක එක් කරන අවකාශය සම්බන්ධ කිරීමට යොදා ඇති ගල් පුවරුවේ දිග x පළල මීටර් 1.40 ක් හා 0.95 ක් වේ.

මෙම පධානඝරයේ සිට හඳුනාගත් ඊළඟ පධානඝරය මීටර් 14.50 දුරකින් පිහිටා ඇත. මෙහි දිග මීටර් 15.40 ලොකු කුටියෙහි පළල 6.80 වන අතර කුඩා කුටිය 4.80 වේ. මෙහි කුඩා කුටියෙහි දකුණු පස සම්පූර්ණයෙන්ම පිහිටි ගල උපයෝගී කර ඉදිකර ඇත. අක්‍රමවත්ව ගරා වැටී විසිරී ගිය ගල් මේ අවට දැකිය හැක.

බුදුගල නටඹුන් සංකීර්ණයට පිවිසීමට වර්තමානයේ මාර්ගය සකසා ඇත්තේ වාරිමාර්ග ඇලෙන් කුඩා පාලමක් දැමීමෙනි.



බුදුගල ඉහල මළුවට නැගීමට ඇති පියගැට පෙළ

මෙම අධ්‍යයනයේ දී හඳුනා ගනු ලැබුවේ බෝධි ගෘහයට පිවිසෙන දොරටුවයි. පිවිසුම අසලම සුමට නොවූ හතරැස් ගලක රවුම් හැඩයක් කෙටූ ගල් පුවරුවකි. මෙය පා දෝවනය සඳහා ජල බඳුන තැබූ ස්ථානය විය හැකියි. නොඑසේ නම් මෙය මෙම සංකීර්ණයේ වෙනත් ස්ථානයක තිබී දෙවනුව මේ අසලින් තැබුවා වීමටද පිළිවන. මේ සමගම සකස් කළ ගල් පුවරුවකි. අනතුරුව යටිලිපත වේ. එහි එක් කත්තුවක් රවුම් ද අනෙක හතරැස් ද වේ. අනතුරුව තවත් ගල් පුවරුවක් වේ. අනතුරුව පිය ගැට පෙළ වේ. එක් පැත්තක ගල් කුට්ටියක් තබා ඇති අතර අනෙක් පස පිහිටි ගල උපයෝගී කරගෙන ඇත.

අක්කර 15 ක් පමණ වන ගහනය තුළ ව්‍යාප්තව ඇති මෙම නටඹුන් සංකීර්ණයේ දෘශ්‍යමාන සාධක තවත් බොහොමයක් තිබෙන්නට පිළිවන.

**එස්. ඒ. අමිතා විතාන**
කලාපහාර නිලධාරි (සීතාවක)
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
සීතාවක - අවිස්සාවේල්ල

# චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතියක්

ශ්‍රී ලංකාව කුඩා දිවයිනක් වුව ද ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මහනුවර යුගය දක්වා කාලවකවානුවට අයත් එහා මෙහා ගෙන යා හැකි චංචල පුරාවස්තු විශාල ප්‍රමාණයක් අප සතුව පවතී. පුරාවිද්‍යා ආඥා පනතේ චංචල පුරාවස්තු ලෙස අර්ථකතනය කර ඇත්තේ ක්‍රි.ව. 1815 මාර්තු 2 වන දිනට පූර්වයෙහි වූ කාල සීමාවක සිට පැවත එන්නා වූ නැතහොත් මෙසේ පැවත එන්නේ යයි යුත්තේ යුක්ත සහගතව විශ්වාස කළ හැකි වුව ද ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන හෝ පවතින හෝ සොයාගනු ලබන හෝ පහත සිදහන් ද්‍රව්‍ය අතුරෙන් යමක් අදහස් වේ. ප්‍රතිමා නෙළනු ලැබූ හෝ සකස් කරනු ලැබූ සියළු වර්ග වලට අයත් ගල් හෝ කිරිගරුඬ තහඩුවල මුද්‍රිත චිත්‍ර කැටයම් කරනු ලැබූ රූප, ශිලා ලේඛන, පින්තාරු කරන ලද චිත්‍ර, ලියවිලි සහ යම් ද්‍රව්‍යක් මත ඒවා දක්නට ලැබෙන එවැනි ද්‍රව්‍ය, පිඟන් භාණ්ඩ, ලෝහ භාණ්ඩ සහ රෙදිපිළි වල යෙදූ චිත්‍ර, කාසි, මැණික්, ගෘහ භාණ්ඩ, මුද්‍රා ස්වර්ණාභරණ, යුධ මෙවලම්, විසිතුරු භාණ්ඩ සහ චංචල දේපළ වන කළාත්මක ද්‍රව්‍ය ද අදහස් වේ. මෙම පුරාවස්තු ලංකාව තුළ අලෙවි කිරීම ලිග තබා ගැනීම පනතට අනුව හැකියාව







ඇතත්, ඒවා විදේශයන්ට රැගෙන යෑම සපුරා තහනම් වේ.

පුරාවස්තු බහුල රටක් වශයෙන් ලංකාව පුරා රාජ්‍ය, පෞද්ගලික ආයතන මෙන්ම වෙහෙර විහාර සහ පුද්ගලයන් සතුව පවතින චංචල පුරාවස්තු කොපමණ ප්‍රමාණයක් ඇත්දැයි මෙතෙක් සංඝණනයක් සිදුකර නොමැත. එහෙත් උතුරුමැද, මධ්‍යම, බස්නාහිර, දකුණ, නැගෙනහිර, උතුර, ඌව සහ සබරගමුව පළාත් චංචල පුරාවස්තු ඝනත්වය අතින් ප්‍රමුඛතාවය ගනී. මෙසේ පවත්නා චංචල පුරාවස්තු සොරකම් කිරීම, විදේශගත කිරීම, විනාශ කිරීම හා විකෘති කිරීම වැනි විවිධ වූ තර්ජන වලට ලක්වීමේ ප්‍රවණතාවයක් දැනට පැන නැගී තිබේ. එබැවින් අමිල වූ ඉතා වටිනා අපේ මුතුන් මිත්තන් විසින් අපට දායාද කර ඇති චංචල පුරාවස්තු ආරක්ෂා කර මතු පරපුරට වෙනුවෙන් සුරක්ෂිත කිරීමේ අරමුණින් යුතුව චංචල පුරාවස්තු ලේඛනගත කිරීමේ ව්‍යාපෘතියක් දෙපාර්තමේන්තුව මඟින් පළාත් හා දිත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම ව්‍යෘපෘතිය මඟින් ශ්‍රී ලංකාව තුළ සියළු රාජ්‍ය, පෞද්ගලික ආයතන සහ පුද්ගලයන් සතුව පවත්නා චංචල පුරාවස්තු පිළිබඳ සොයා බලා අධ්‍යනය කර ප්‍රමුඛතාවය මත ඒවා විධිමත්ව නියමිත ආකෘති පත්‍රයකට අනුව සැලසුම්, සහ ඡායාරූප සහිතව ලේඛනගත කිරීම සිදු කෙරේ. ඒ සඳහා ක්‍රමවේදයක් පළාත් හා දිස්ත්‍රික්ක කාර්යාල වලට ගවේෂණ අංශය මඟින් හඳුන්වා දී ඇති අතර අදාළ ආකෘති පත්‍ර, ලියාපදිංචි කිරීමේ ලේඛන, ලැප්ටොප්, කැමරා සහ කැලිපර්, තරාදි ආදි යටිතල පහසුකම් දැනටමත් ලබා දීම කටයුතු කර ඇත. මෙසේ ලේඛනගත කරන තොරතුරු මගින් පරිඝනක දත්ත බැංකුවක් ස්ථාපනය කිරීමට දෙපාර්තමේන්තුව මඟින් පියවර ගෙන ඇත. තව ද මෙම වර්ෂය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රතිපාදන මගින් ප්‍රධාන කාර්යාලය සහ පළාත් කාර්යාල මගින් ව්‍යාපෘති 16ක් පමණ ක්‍රියාත්මක වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ චංචල පුරාවස්තුවල අනන්‍යතාවය, ඒවාට නීතිමය ආවරණය ලබාදීම, පුරාවස්තුව ආරක්ෂාව තහවුරු කිරීම, පුරාවස්තු සංරක්ෂණය කිරීම සහ අධ්‍යයනය සඳහා පහසු දත්ත බැංකුවක් ස්ථාපිත කිරීම අපේක්ෂා කෙරේ.

**ඒ. ජී. එල්. තිලකවර්ධන**
සහකාර අධ්‍යක්ෂ (චංචල දේපළ)

# ආදි මානවයාගේ ආභරණ කලාව

දැනට ලෝකයේ ආභරණ භාවිතය පිළිබඳව මුල්ම සාධක දකුණු අප්‍රිකාවේ බොලම්බස් නම් ගල්ලෙනේ අදින් වසර 75,000 කට පමණ නිරපේක්ෂව කාල නීර්ණයවූ පස් තැම්පතුවෙන් අනාවරණය කරගෙන තිබේ. එම ගල් ලෙනෙහි සිදුකරන ලද පුරාවිද්‍යාත්මක කැණීමෙන් අනාවරණය කරගන්නා ලද පංච බෙල්ලන් ප්‍රාග්ඓතිහාසික මිනිසාගේ මැදිහත්වීමකින් මනාව සිදුරු කිරීමකට ලක්කර ඇති බව පැහැදිලි කරගෙන තිබේ. ස්වභාවිකව පවතින පංච බෙල්ලන් ස්වභාවික ක්‍රියාකාරිත්වයකින් ඒකාකාරී අයුරින් සිදුරු වීමක් සිදුවීම අස්වාභාවික වන අතර නියම වශයෙන්ම මේවා මානව ක්‍රියාකාරකම් ලෙසින් පුරාවිද්‍යාඥයන් සලකනු ලබයි. මෙවැනි පුරාවිද්‍යාත්ම වටිනාකමක් සහිත පබලු විශේෂයන් හා කෘතීන් සලකනු ලබන්නේ පෞද්ගලික ආභරණ ලෙසින් ය. එවැනි ආභරණ විශ්ලේෂණාත්මකව පැහිදිලිකර ගැනීමෙන් එම යුගයේ ජීවත්වූ පුද්ගලයින්ට ආවේණික වූ සුවිශේෂී ලක්ෂණ හා ආවේණික ස්වරූපයන් සංකේතවත් වේ. මෙම සුවිශේෂී ගල්ලෙනේ පුරාවිද්‍යාත්මක කැණීම් සිදුකරන ලද හැන්සිවුඩ් සහ අනෙකුත් පරීක්ණ කණ්ඩායම් පෙන්වාදෙන ආකාරය ට මුහුදු පබළු 40 ක් හමුව ඇත. ස්වභාවික බෙල්ලන්ගේ මෙවැනි සිදුරක් දක්නට ලැබෙන්නේ ඉතාමත්ම කලාතුරකිනි. ඒ අනුව උවමනාවෙන් මෙම සිදුරු සකසා ඇති බවක් මින් පැහැදිලි කරගෙන තිබේ. මෙම සිදුරු භාවිතයට ගනිමින් ගෙල පලඳනාවක් ලෙසින් එක දිගට අමුණා භාවිතා කරන්නට ඇති බවට හැන්සිවුඩ් ඇතුළු පරීක්ෂණ කණ්ඩායම අනුමාන කරනු ලබයි.

ලෝක ප්‍රාග් ඉතිහාසය දෙස බලනවිට මානව ඉතිහාසයේ මලවුන් භූමදනය හා ඒ සමග පෞද්ගලික ආභරණ හා භාණ්ඩ තැම්පත්කල පළමු පුද්ගලයා නියන්ඩර්තාල් මානවයා ය. ඒ පහල පුරාශිලා යුගයේ දීය. නවීන මානවයා හා සසඳ බැලීමේ දී නියන්ඩර්තාල් මානවයාගේ අභිචාර විධි හුදෙක්ම ඉතා සරල ය. එමෙන්ම චාම් ය. මොවුන් බොහෝවිට ශිලා මෙවලම් හෝ සත්ත්ව අවශේෂ සමඟ ඉතා චාමෙට මේවා තැම්පත්කර ඇත්තේ පැවති පරිසරයට ඔරොත්තු දෙන අයුරිනි. නමුත් ඉහල පුරාශිලා යුගයේ දී මේ තත්ත්වය තරමක් සංකීර්ණත්වයකට පත්ව ඇත. එයට මිනිසාගේ පරිණාමය හා මොළපරිමාවේ වෙනස්වීම බලපාන්නට ඇත.

ලෝක ප්‍රාග්ඓතිහාසික පුරාවිද්‍යාවේදී ආභරණ භාවිතය පිළිබදව මුල්ම සාධක එලෙස හමුවෙද්දී ශ්‍රී ලංකාවේ නවීන මානව සාධක අදින් වසර 48,000 දක්වා පහතරට නිවර්තන තෙත් කලාපයේ ගල්ලෙන් වලින් අනාවරණය කරගෙන තිබේ. එම තත්ත්වය දකුණු ආසියාවෙන් අසන්නට ලැබෙන පැරණිතම ආභරණ පැලදීම පිළිබදව සාධකවීම සුවිශේෂී ය. පුරාවිද්‍යාඥයින් විශ්වාසකරන හා හමුව ඇති තොරතුරු මතින් අනුමාන කරනු ලබන්නේ සාමාන්‍යයෙන් ආභරණ පැලදීම භාවිතයට පටන් ගැන්ම සිදුව ඇත්තේ ඉහල පුරාශිලා යුගයේදී බවය. එම සංස්කෘතික මානව ක්‍රියාදමය මධ්‍යශිලා යුගය වනවිට ඉතාමත් පුළුල් හා කලාත්මක අයුරින් භාවිතයට ගැනීම සිදුව ඇතිබව මේවන විට පැහැදිලි වී තිබේ. ඒ අනුව දකුණු ආසියානු රටවල් අතරින් පැරණිම නවීන මානව වාසභූමි පැවතුන රටක් ලෙසින් ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වයේලා හදුන්වාදිය හැකිය. විශේෂයෙන්ම හොරණ බුලත්සිංහල පාහියන්ගල 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කතුවරයා ද දයක වූ කැණීම් කාල සීමාවෙන් මතුකරගත් අගුරු නියදි අමරිකාවේ බීටා ඇනලිටික් ආයතනයේ කාබන් 14 නිශ්චිත දිනවකවානු පර්යේෂණ මගින් අදින් වසර 48,000 පැරණි මානව ජනාවාස තොරතුරු අනාවරණය කරගෙන තිබේ.

**එච්. එම්. එස්. කුමාර**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
අවිස්සාවේල්ල.


# ලක්දිව බලකොටු අතර සුවිශේෂී නමක් දිනාගත් මන්නාරම බලකොටුව

සාගරය හරහා දේශ දේශාන්තර වෙළඳම ස්ථාපනය කර ගැනීමේ බලාපොරොත්තු පොදි බැඳගෙන දුරු කතර ගෙවා අනන්ත දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් පෙරදිග කලාපයෙහි සාගරයෙහි සැරිසරමින් ලක්දිවට පැමිණි ලන්දේසි ජාතිකයන් සුන්වූ බලාපොරොත්තු වල බර හිසින්ගෙන පරාජයේ කනස්සල්ල සිත්හී දරාගෙන ගම්රටවල් බලා ආපසු ගියෝය. ඔවුන් ගෙන ආ නීතියත් ඔවුන් ඉදිකළ බලකොටුවත් ඔවුහු අපට ඉතිරිකර ගියෝය. එකී බලකොටු අතර මන්නාරම බලකොටුවට සුවිශේෂී තැනක් හිමිවෙයි.

මන්නාරම් දූපතට ආසන්න කෙළවර මුහුදට මුහුණලා මන්නාරම බලකොටුව පිහිටා තිබෙයි. ශත වර්ෂ ගණනාවක් ගෙවී ගියද අනෙක් බලකොටු මෙන් මෙම බලකොටුවෙහි මූලික ස්වරූපය වෙනස් කර නැත. එබැවින් එය බලකොටුවකට ආවේණික මූලික අංගෝපාංග සහිත සුවිශේෂී ස්ථානයක් වෙයි. 1710 දී ස්ට්ජර් විසින් චිත්‍රයට නගන ලද මන්නාරම බලකොටුවෙහි එවකට පැවති අංග ලක්ෂණ සියල්ලම පාහේ සිතුවමට නගා ඇත. එකී සිතුවම සමඟ සසඳන කළ අද දක්වාත් එහි ලක්ෂණ ඒ අයුරින්ම දක්නට හැකිවීම සුවිශේෂී ලක්ෂණයක් වේ.

එකල යාපනය පළාතේ දකුණු පර්යන්තයෙහි වෙළඳ කටයුතු මන්නාරම බලකොටුවෙන් පාලනය විය. එවකට මුතුපර භාර කපිතාන්වරයාගේ මූලස්ථානය වූයේ මෙම බලකොටුවය. උතුරු පළාතේ පෘතුගීසි සතුරු පෙරමුණු වලින් ඔවුන් නෙරපා හැරී මේ අවසාන තීරණාත්මක මෙහෙයුම 1658 දී ආරම්භ කරමින් ලන්දේසීන් ප්‍රථමයෙන්ම මන්නාරමට පැමිණියෝය. ඔවුහු බලකොටුවට නුදුරු ස්ථානයක දී දිවයිනට ගොඩ බැස්සෝය. බලකොටුවෙහි සිටි භට පිරිස යටත් කරගත් ඔවුහු එය අත්පත් කරගෙන යාපනය බලා ගමන් ගත්හ.

මන්නාරම බලකොටුව ලන්දේසී යුගය පුරාම අඛණ්ඩ වැදගත් කමක් ඉසිලීය. එහි රඳවා සිටි බලසේනාවට සෞඛ්‍ය සම්පන්නව දිවි ගෙවීමට ප්‍රමාණවත් පහසුකම් සහිත විය. ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමෙහි ධන උල්පතක් වශයෙන් ඊට ලංකාවේ වැදගත් විය. එහි මුතුපරවලින් වාර්ෂිකව ලද ආදායම සමාගමේ මූල්‍ය ස්ථාවරයට ඉමහත් දායකත්වයක් සැපයීය. "අරිපොවු" අල්ලා සකස් කළ අත්තිවාරම මගින් සවිමත්කර ඇත. ලන්දේසි සමයෙහි අවසාන භාගයෙහි 1782 වසරෙහි සම්පාදිත වාර්තාවක බලකොටුවට පිටතින් පිටස්තර පස් වැටියකින් ආරක්ෂාව තිබුණු බව සඳහන්ය.



බලකොටුවෙන් මුතුපර වෙරළෙහි විදිනෙදා කටයුතු අධීක්ෂණය කෙරිණි.

එවකට වැදගත් කමින් ප්‍රමුඛ ස්ථානයක් ගෙන සිටි මන්නාරම බලකොටුව 1795 වසරෙහි ඔක්තෝබර් මස 15 වන දින අනිකුත් උතුරුදිග ලන්දේසි බලකොටු මෙන්ම කිසිඳු විරෝධතාවයක් නොදක්වා ම බ්‍රිතාන්‍යයන්ට යටත් විය. කොළඹ යටත්කර ගැනීම සඳහා වූ දැවැන්ත මෙහෙයුමේදී භට පිරිස් ඒකරාශි කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ඉන් පසුව එය උපයෝගීකර ගනු ලැබීය. මන්නාරමේ සිට මුහුදෙන් ගමන් කළ භට පිරිස් ගොඩබිමින් ප්‍රවාහනය කෙරුණු සැපයුම් ලබා ගැනීම පිණිස රාත්‍රී කාලවල දී වරින්වර වෙරළ ආසන්නයට පැමිණියහ. භට පිරිස පිටත්ව යන මොහොතේ ඔවුන් දුටු මන්නාරම බලකොටුවත් අද දක්නට ඇතිබල කොටුවත් අතර වෙනසක් නොමැති තරමිය.

ලන්දේසි ගෘහ නිර්මාණ ශිල්පයට අනුව බලකොටුවක සියළු වැඩ අවසන් කර ඉන් පසුව එකී පිවිසුම් දොරටුවෙහි වැඩ නිම කිරීම ඔවුන්ගේ සම්මතය වී ඇත. ඒ අනුව ලන්දේසීන් මන්නාරම බලකොටුවෙහි වැඩ අවසන් කර ඇත්තේ පෘතුගීසීන්ගෙන් අත්පත් කර ගැනීමෙන් තිස් වසකරට පසුව 1686 දීය. ඒ බව ප්‍රාකාරයේ දොරටුවට ඉහලින් සටහන් කර තිබීමෙන් මනාව පිළිඹිබු වේ.


ප්‍රහාරක මුරපලවල් හතරකින් සන්නද්ධ වූ මෙම බලකොටුවෙහි කොටුපවුරෙහි පිටත මායිමේ උස අඩි 18-20 අතරවෙයි. පිවිසුම් මංපෙත හැරුණු විට බලකොටුව හාත්පසින්ම ජලයෙන් වටවී තිබෙයි. ආරක්ෂක අගල ගිණිකොන දෙසින් මුහුදට විවෘත වෙයි. දිය අගලෙහි බලකොටුවට දුරින් පිහිටි ඉවුර ගල්

සෑම ප්‍රහාරක මුරපොලකට ඒ එක් මුහුණතක කාලතුවක්කු කවුළු දෙක බැගින් ද පැති මුහුණත කාලතුවක්කු කවුළුව බැගින් ද වෙයි.

දකුණු කොටුපවුර මත ඉදිකර ඇති ප්‍රාකාරයෙහි දොරටුවට ඉහලින් 1686 වර්ෂය සටහන් කර තිබී ඇත. ප්‍රාකාරය මත දිගටම කපොළු පේළියකි. ශ්‍රී ලංකාවේ දක්නට ඇති ඒ ආකාරයේ කපොළු සහිත එකම බලකොටුව මෙපමණකි. දකුණු දිග කොටුපවුර පළලින් අඩු බැවින් ප්‍රහාරක මුහුණතට අවශ්‍ය ශක්තිය ඊට ලබාදීම පිණිස ඒ තාප්පය දිගේ ඒ අයුරින් ප්‍රහාරක කවුළු සකස් කර ගන්නට ඇත. එය යාත්‍රා නැවතුම්පලට ආසන්නව පිහිටීමත් යාපනය සහ කොළඹ අතර ප්‍රධාන මුහුදු මග ඒ අද්දරින්ම වීමත් ඒ අමතර ආරක්ෂක ඉදිකිරීමට හේතු වන්නට ඇත.

ග්‍රීෂ්මය සමහන් කිරීම සඳහා පුළුල් විවෘත ඉදිරි ආලින්දයෙහි තව ඉදිකර ඇති ගබඩා ගෙවල් ද නිරිත දිග මුරපල ඉස්මත්තෙහි කුළුණු හතරක් මත නැංවූ ස්ථූපාකාර මුදුනත් සහිත ඝණ්ඨාර කුළුණු ද දේවස්ථාන ගොඩනැගිල්ල ද එම ගොඩනැගිල්ල ඇතුලත මිය ගිය අයගේ නම් සඳහන් කලාත්මක කැටයමින් යුත් සමරු ඵලක ද අභාවයට ගිය කම්මල් ගොඩනැගිල්ලක් ද බටහිර අද්දර ඔස්සේ විදිනෙදා පරිහරණය සඳහා අවශ්‍ය දෑ ගබඩා කළ කාමර ද මැද මිදුලෙහි උතුරු දෙසින් බංගලා ගොඩනැගිල්ල ද නැගෙනහිර අද්දර දිගටම කුඩා කාමර බැරැක්ක ආදියෙන් සමන්විත ගොඩනැගිලි පද්ධතියකි. එය බ්‍රිතාන්‍ය යුගයේ රිමාන්ඩ් සිරමැදිරි ලෙස ප්‍රයෝජනයට ගෙන ඇත. නිරිත දිග ප්‍රහාරක මුරපොල හා ගිණිකොන දිග ප්‍රහාරක මුරපොල ඇතුලතට ගිල්වා නිමැවුණු වෙඩිබෙහෙත් ගබඩා දෙකකින් ද වතුර ටැංකි දෙකකින් ද අවශ්‍ය සෑම මූලික අංගයකින්ම සමන්විත කැඩී බිඳී නොගොස් සුරැකිව පවතින මධ්‍යම ප්‍රමාණයේ බලකොටුවකට හොඳම නිදර්ශනය මන්නාරම ලන්දේසි බලකොටුව වේ.

**එම්. චමින්ද සිල්වා**
කලාප භාර නිළධාරී
මන්නාරම.



මන්නාරම් බලකොටුව මුහුදට දිස්වන අයුරු - 1710 චිත්‍රයකි.
(ඇම්ස්ටර්ඩෑම් හි "රිජ් මියුසියම්" කෞතුකාගාරයෙහි අනුග්‍රහයෙනි.)



වර්තමානයේ මන්නාරම් බලකොටුව
දිස්වන අයුරු

# නිර්මාණ පිටුව



## පුන් සඳ


එළියෙන් තරු අරා බැබළුණ ගගනත අස්සේ
කප්පරකට හෙළු එළි වැට නිවෙමින් ගැස්සේ
මහ කළු වළා වහගෙන දෝ රෑ තිස්සේ
මනුදම් පිරූ පුන් සඳ අකලට බැස්සේ

**ඩී. ඩබ්ලිව්. මංජුලා චාන්දනී ප්‍රේමරත්න**
අවිස්සාවේල්ල - පුරාවිද්‍යා කාර්යාලය

## බලාපොරොත්තුවේ කෙලවර

ලිදක් ලග ඉපදුන මෙමා
මුහුද තරමට හිතුවේ
ගඟක්වත් වෙයි කිය කියා
ඔයක් අද්දර ලතවුනා
දෙලක්වත් වෙන්නැති නිසා
ඇලක් ලග සක්මන් කලා
මොකක්වත් වෙන්නැති නිසා
ලිද මගේ ලෝකය කලා

**සමන් කුමාර ඇරැගම**
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය,
අවිස්සාවේල්ල.



## වෙනස

කිසිවකුගේ ඇස නොගැටී
කිසිවකුත් අත නොගැසූ
පුරාවත්, නිර්වචන,
අනාවැකි වකවානු
මතවලට හසු නො වී
සැඟව පස් යටට වී
තිබේ නම් බෝ කලක්
පුරාවස්තුව රැකේ.

**හිමත් වීරබද්දන**
පු.ව.වි.වා. විශේෂ ඒකකය




## පුරා වස්තුව

දනිනම් මා
බේරා ගැනීමට
දරණ වෙහෙස
මියැදෙනවා
මව් කුසේ ම
නූපන් ව .......

**අයි. ඩී. එම්. විජේබණ්ඩාර**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
මහනුවර පුරාවිද්‍යා කාර්යාලය.



# හරස් පද ප්‍රහේලිකාව



**හරහට**

1. රෙද්දක නූල් ගැලවීයාම වැලකීමට වියන ලද වාටිය
5. දින 365 ක කාලය.
7. කෙටි මන්ත්‍ර මේ නමි.
8. හේන්වලින් ලැබුණු අස්වැන්නෙන් රජුට බදු වශයෙන් ගෙවූ කොටස.
9. ප්‍රතිමා ඉරියව්වකි.
10. වාස්තු විද්‍යාවේ කවුළු විශේෂයක් සඳහා භාවිත කෙරේ.
11. පැමිණි යන අරුත් ගැන් වේ.
13. කොළ වැටුණු අත්ත හෝ රිකිල්ල.
15. මේ නමින් සාහිත්‍යයේ නාග රාජයෙක් සිටී.
16. පව් කරන්නවුන්
18. සුදු
19. දිය සිඳුණු වැව
20. ඉවතලුව ද ඖෂධ සඳහා ද ගැනේ.
22. සොහොන යන්නට පර්යාය වේ.
23. ගෙය යන අරුත ඇත.

*හරස් පද ප්‍රහේලිකාව සකසා අප වෙත එව්වේ,*
***අයි. ඩී. එච්. විජේබණ්ඩාර***
*ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය, මහනුවර.*

**පහළට**

1. බුලත් තබා දෙන පාදකයක් සහිත තට්ටුව.
2. වලිගය.
3. අශ්ව ආහාරයකි.
4. තෑගි, කප්පම් සඳහා භාවිත වදනකි.
6. ජන සුබසිද්ධිය උදෙසා පිහිටුවා ගන්නකි.
8. ක්ෂත්‍රිය කුලයකි.
12. දහවල් කාලය.
13. උකුණාගේ ගැහැණු සතා
14. ශිලා ලේඛනයන්හි අග බිසව මේ නමින් ද හැඳින් වේ.
16. මළ භාෂාවකි.
17. දිව්‍යමය පානය.
18. කුඹුරේ සෑදුණු කුඩා දිය වළ.
21. ගස සඳහා පර්යාය වදනකි.



ඡායාරූප වාර්තාකරණය මගින් සුරක්ෂිත කරන ලද ඓතිහාසික දෙගල්දොරුව රාජමහා විහාරයේ බිතුසිතුවම්

## ශ්‍රී ලංකාවේ පෞරාණික සිතුවම්
# ඡායාරූප වාර්තාකරණය මගින් සුරක්ෂිත කෙරේ

**ශ්‍රී ලංකාවේ අතීත උරුමය අනාගතය වෙනුවෙන් දායාද කිරීමේ තවත් එක් පියවරක් ලෙස මෙරට පවතින පෞරාණික සිතුවම් ඡායාරූප වාර්තාකරණය මගින් සුරක්ෂිත කරලීමේ ව්‍යාපෘතියක් 2016 වසර මැද සිට ඇරඹුනි. ඒ යටතේ දෙගල්දොරුව රජමහාවිහාරය, සීගිරිය, කැලණිය, පොළොන්නරුව තිවංක පිළිම ගෙය ආදී ස්ථානයන්හි ඡායාරූප වාර්තාකරණය අවසන් කර ඇත. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදු කෙරෙන මෙම ව්‍යාපෘතිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය විසින් මෙහෙයවයි.**

# උරුම රකින මිනිස්සු

ශ්‍රී ලාංකීය පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් සිය කාලය, ශ්‍රමය, ධනය කැප කළ බොහෝ දෙනෙක් සිටිති. මේ වන විට ඔවුන් අතුරින් ඇතැමෙක් මෙලොව හැර ගොසිනි. අපගේ මෙම ව්‍යායාමය පුරාවිද්‍යා ක්ෂේත්‍රයට අමිල සේවාවක් ඉටු කළ දැනට ජීවතුන් අතර සිටින මිනිසුන් සොයා ගොස් ඔවුන්ගේ තොරතුරු සහ අත්දැකීම් ඔබ සමග බෙදා හදා ගැනීමයි. මේ යටතේ මෙවර විජේසුන්දර, වීරකෝන්, කුලතිලක යන මහත්වරුන් තිදෙනා පිළිබඳව කරුණු සාකච්ඡා කෙරේ.



ඒ. ඒ. ඩී. එම්. විජේසුන්දර මහතා

1950 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ගාඩ් පරීක්ෂක ලෙස සේවයට බැඳුණු විජේසුන්දර මහතා 1983 වසරේ නාමිකව විශ්‍රාම ගියද ඉන් අනතුරුව 1998 දක්වා ඔහු මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ සීගිරි, පොළොන්නරුව, පුරාවිද්‍යා ව්‍යාපෘතීන්හි සේවයේ නිරත විය. පුරාවිද්‍යා සංරක්ෂණ කාර්යයන්හි දි තම නිපුණතාව ප්‍රකට කළ මොහු ලංකාවේ පුරාවිද්‍යා ස්ථාන රැසක කටයුතු හා සම්බන්ධ වූවෙකි. සිය සේවා කාලයෙන් වැඩිම ප්‍රමාණයක් වයඹ පළාතේ පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය වෙනුවෙන් යොදවා ඇති විජේසුන්දර මහතා පඬුවස්නුවර රජ මාලිගාවට අයත් සියලු ගඩොල් ගොඩනැගිලි සංරක්ෂණයට දායක වී ඇත. එහි දිය අගල වටා ඇති ගරාවැටී තිබූ ප්‍රාකාර බැම්ම සංරක්ෂණයන් බිසෝකොටුව සංරක්ෂණයත් විශේෂය. පඬුවස්නුවර පන්සල් භූමියේ පිහිටි දළදා මාළිගය ප්‍රතිසංස්කරණයේ දී මොහුගේ පූර්ණ දායකත්වය ලබා දී ඇත.

බිංගිරිය ටැම්පිට විහාරය ප්‍රතිසංස්කරණයේ දී සිය දායකත්වය ලබාදුන් ආකාරය විජේසුන්දර මහතා මෙලෙස පැහැදිලි කරයි. "ටැම්පිට විහාරය සාදා තිබුණේ විශාල ගල් කුළුණු මත ලී බාල්ක යොදා එය මත වරිච්චි බිත්ති බැඳ ඒවායේ චිත්‍ර සායම් කිරීමෙනි. එම ගොඩනැගිල්ලේ ගල් කණු මත යොදා තිබූ ලී බාල්ක සමහරක් දිරාපත් වී ඉතා අබලන් තත්ත්වයට පත්ව තිබුණා. අපට තිබුණු විශාලම අභියෝගය තමයි සායම් කරන ලද බිත්ති දෙදරා යාමට ඉඩ නොදී දිරාපත්වූ දැව බාල්ක ඉවත්කර ශක්තිමත් කිරීම." අපි සියලු දෙනා එක් වී සාකච්ඡා කර දිරාපත් වූ දැවවලට මුක්කු ගසා, ගල් කණු මත දිරාපත් වූ දැව ඉවත් කිරීමට ගල් කණු වටා බිම හාරා ප්‍රවේශමෙන් ඒවා ඉවත් කර අලුත් බාල්ක යොදා යළි ගල්කණු සිටවීම කළා ..."

බිහල්පොල, පාදෙණිය යන ස්ථානයන්හි පැරණි ස්මාරක මේ ආකාරයෙන්ම සංරක්ෂණය කළ බව ඔහු කියයි. පඬුවස්නුවර මාළිගාව අයත් භූමියේ යම් යම් ගොඩනැගිලි සංරක්ෂණය සඳහා කැණීම් සිදුකිරීමේදි ඔහු සිය දායකත්වය සපයා ඇත.

විජේසුන්දර මහතාගේ වසර 48 ක් තරම් දිගු රාජකාරි ජීවිතයේදී පොළොන්නරුව, පඬුවස්නුවර, යාපහුව, සීගිරිය, පාදෙණිය, බිහල්පොල, දඹදෙණිය, බිංගිරිය, මැදගම, දඩස්ගිරිය යන ස්ථානයන්හි සේවය කැපී පෙනේ. රාජකාරි ජීවිතයේ අවසන් කාලය මධ්‍යම සංස්කෘතික අරමුදල හා සම්බන්ධව කටයුතු කළ ඔහු සිගිරි ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරු ලෙසත්, පොළොන්නරුව ආලාහන පිරිවෙන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරු ලෙසත් පසුව එහි තාක්ෂණ උපදේශක වශයෙනුත් සේවය කර ඇත.


මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය ගොඩකුඹුර, ආචාර්ය රාජා ද සිල්වා, ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න, ආචාර්ය රෝලන්ඩ් සිල්වා වැනි පුරාවිද්‍යා කොමසාරිස්වරු රාශියක් යටතේ සේවය කර තිබේ.

වාස්තුවිද්‍යා සංරක්ෂණ පිළිබඳ ප්‍රතිපත්ති මාලාව "මැයෙන් වූ ප්‍රකාශනයේ සම්පාදක මණ්ඩලයේ සාමාජිකයෙකු වූ මොහු පුරාවිද්‍යා ශූරී සම්මානයෙන් ද පිදුම් ලද්දෙකි. සිය ජීවිත කාලය පුරාවිද්‍යාවට කළ කැප කිරිම වෙනුවෙන් එවකට ගරු අග්‍රමාත්‍යවරයා වූ ඩී. බී. විජේතුංග මැතිතුමා විසින් එම සම්මානය 1990 වසරේ දී පිරිනමා ඇත.

දරුවෝ 05 දෙනෙකුගේ ආදරණීය පියාණන් වූ ඔහුගේ දැන් වයස අවුරුදු 93 කි. බිරිඳ ඇඩ්ලින් විජේසුන්දරගේ වයස අවුරුදු 84 කි. දූවරු 02 කි. පුතාලා 03 කි. පුතාලා 02 ක් විදේශ රටක ජීවත් වෙති. ඉතා සෞඛ්‍ය සම්පන්නව සිටින ඔහුගේ කන් ඇසීම තරමක් දුර්වලය. අවුරුදු 93 ක් ආයුෂ විදින, නිරෝගී විජේසුන්දර මහතාගෙන් එහි රහස මා විසින් විමසා සිටියා.

"මගේ හිතේ කිසිම කහටක් නෑ. කාටවත් ඊර්ෂ්‍යාවක් නෑ" ඔහු එසේ කියමින් සිනාසෙයි.

"තාත්තාගේ වාහන එළවීම නැවැත්තුවේ ගිය අවුරුද්දේ අපි බයයි තාත්තාට කරදරයක් වෙයි කියල, තාත්තාට හොරෙන් කාරෙක අපි විකුණුවා.." විජේසුන්දර මහතාගේ වැඩිමහල් දියණිය සමන් ලීමා විජේසුන්දර එලෙස පැවසුවාය.



සී.බී. වීරකෝන් මහතා

1950 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට මාර්ගෝපදේශකයෙකු ලෙස සේවයට බැදුණු වීරකෝන් මහතා රාජකාරි ජීවිතයෙන් විශ්‍රාම ලැබුවේ කෞතුකාගාර අධීක්ෂකවරයෙකු ලෙසිනි. 1988 වසරේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගන්නා විට ඔහු පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ විෂයන් කිහිපයක සිය සක්‍යතාව ප්‍රකට කළ පුද්ගලයෙකි. පුරාවිද්‍යා සංරක්ෂණයත්, කෞතුකාගාර ශිල්පයත්, ලංකාව පුරා විසිරී ඇති පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව මෙරට මහජනතාවට මෙන්ම විදේශිකයින්ට නිවැරදි මගපෙවන්නෙකු ලෙසින් මාර්ගෝපදේශනයත් පිළිබඳ ප්‍රමාණික දැනුමැත්තෙකු විය.

සිය මාර්ගෝපදේශක තනතුරේ වැඩකටයුතු මුලින්ම ආරම්භ වනුයේ සීගිරියෙනි. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා එවකට පුරාවිද්‍යා කොමසාරිස් ධූරය හෙබවූ වකවානුවයි. සීගිරිය තම ස්ථිර සේවා ස්ථානය කරගනිමින් වසර ගණනක් එහි කටයුතු කරන වීරකෝන් මහතාට එම වකවානුවේම පිදුරංගල පුරාවිද්‍යා කටයුතු හා සම්බන්ධ වීමට ඉඩකඩ සැලසේ. විශේෂයෙන් 1950 ගණන්වල පිදුරංගල සිදු කෙරුණු ක්ෂේත්‍ර කැණීම් කටයුතුවලත් පරණවිතානයන්ගේ සීගිරි කුරුටු ගී කියවීමටත් ඔහුගේ සහාය ලබා ගැනේ.

සීගිරියේ රාජකාරි අතරතුරේ දැදිගම පුරාවිද්‍යා කෞතුකාගාරයට සහාය කෞතුකාගාර අධිකාරීවරයකු ලෙස පත්වීමක් ලැබේ. වසර විසි ගණනක් දැදිගම කෞතුකාගාරයේ සේවයේ නිරත වුවද ඔහුගේ

බහුවිධ දැනුම් පරාසය වටහා ගත් එවකට පුරාවිද්‍යා කොමසාරිස්වරු ඔහු ලංකාවේ විවිධ ස්ථානයන්හි සංරක්ෂණ කටයුතු සඳහා යොදවා ගෙන ඇත.

රාජකාරි ජීවිතයේදී අභියෝගයන්ට මුහුණදුන් ආකාරය ඔහු මෙලෙස පැහැදිලි කරයි. "ආචාර්ය ගොඩකුඹුරේ එවකට පාලන අධිකාරියත් සමග සාකච්ඡා කොට දැදිගම කොට වෙහෙර දාගැබ වසරක් ඇතුලත සංරක්ෂණය කිරීමේ අභියෝගය මා ඇතුළු කණ්ඩායමට බාර දුන්නා. ව්‍යාපෘතියට අදාළව අනියම් කම්කරුවන් විශාල පිරිසක් බඳවා ගෙන වසරක් ඉක්ම යන්නට මත්තෙන් දාගැබ සංරක්ෂණය කොට බාර දුන්නා" මම රාජකාරියට දක්වන උනන්දුවත් එය ඉටුකිරීමේ ඇති හැකියාවත් නිසා එවකට කෞතුකාගාර නිළධාරියා මගේ වැඩ ගැන පැහැදිලා ආචාර්ය රෝලන්ඩ් සිල්වා කොමසාරිස්තුමාට ඒ ගැන පවසා තිබුණා. ඒ අනුව රෝලන්ඩ් සිල්වා මහතා මා කැඳවා කිරිබත්කුඹුරට නොදුරු මංගලගම අම්බලම සංරක්ෂණය කිරීමට බාර දුන්නා..." මංගලගම අම්බලමේ ඒ වනවිට ඉතිරි වී තිබුණේ කණු දෙකක් පමණක් බවත් එවකට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පියෙකු වූ එල්. කේ. කරුණාරත්න මහතා ලබා සැලසුම් ආඳගෙන අම්බලමේ සංරක්ෂණ කටයුතු සිදු කර ඇත.

රඹුක්කන දැලිවල කොට වෙහෙර දාගැබ් සංරක්ෂණ කටයුතු වෙනුවෙන් ද, දනගිරිගල විහාරයේ පිය ගැට පෙළ සංරක්ෂණය වෙනුවෙන් ද ඔහුගේ මඟ පෙන්වීම ලැබී ඇත. පඩි 700 ක් පමණ ඇති දනගිරිගල පියගැට පෙළ සංරක්ෂණයත් එවකට ඉතා දුෂ්කර කාර්යයක් වූ බවත් සඳහන් කරයි. සංරක්ෂණයට අවශ්‍ය ද්‍රව්‍යය සහ අනෙකුත් උපකරණ සොයා ගැනීමත් අතිදුෂ්කර කාර්යයක් වූ බව පැවසේ. බීමට ජලය පවා රැගෙන ආවේ ඉතා ඈතක සිට බව ඔහු පවසයි.

දනගිරිගල සංරක්ෂණ කටයුතුවලින් අනතුරුව දනගිරිගල පැරණි විහාරගෙය සංරක්ෂණයට එක්ව ඇත. වර්ච්චි බිත්ති මත ඇඳ ඇති සිතුවම්වලට හානියක් නොවන සේ වහල පිළිසකර කළ යුතු විය. එවකට බිතුසිතුවම් සම්බන්ධයෙන් ක්ෂේත්‍රයට අදාල බොහෝ දෙනෙකු සිතුවම් ආරක්ෂා කර ගනිමින් වහළ සංරක්ෂණය කර ගත යුතු ආකාරය පහදා දී ඇත. මින් එකදු ක්‍රමවේදයක් හෝ ප්‍රායෝගික නොවූයෙන් වීරකෝන් මහතා එවකට එම පළාතේ සිටි දක්ෂ වඩුකාර්මිකයෙකු කැඳවා ගෙන අවුත් කාර්යය ඉටු කර ඇත. අද අපි මහනුවර කොළඹ ප්‍රධාන මාර්ගයේ ගමන් ගන්නා විට පිළිමතලාවේ දී දකින අම්බලම වීරකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් සංරක්ෂණය වූ පුරාවිද්‍ය ස්ථානයකි.

ඉන් අනතුරුව ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා සංරක්ෂණ කටයුතු සඳහා ඔහුගේ සේවය ලබා ගැනේ. ඒ අතුරින් බදුල්ල ගොඩේගෙදර බෝධිය වටේ ප්‍රාකාර බැම්ම සංරක්ෂණයත් සොරබොරවැව ආශ්‍රිතව ලැබුණු ශිලා ලේඛණ බදුල්ල පුස්තකාලය පිටුපස ස්ථාපනය කිරීමත් වැදගත් කටයුතුය. නගරය මධ්‍යයේ වැස්සට තෙමී තෙමී අව්වට වේලි වේලි තිබූ සෙල්ලිපිය ජනතා විරෝධය කරුණු පැහැදිලි කිරීමෙන් සංසිඳුවා ආරක්ෂිත ස්ථානයක් වෙත රැගෙන ගොස් තැන්පත් කිරීමට ලැබීම ඔහු භාග්‍යයක් කොට සලකයි.

මීට අමතරව ශ්‍රී ලංකාව පුරා රාජකාරි ඉටුකළ ස්ථාන රාශියක් වෙයි. ඒ අතුරින් කහටගස්දිගිලිය, ගෝනසිරිපුර විහාරය දාගැබ සංරක්ෂණය, මහනුවර ඉපැරණි මාලිගය, පඬුවස්නුවර, බිහල්පොල, විහාරහින්න දාගැබ, බිංගිරිය දාගැබ, මැද්දේගම, දන්තුරේ, බලනකොටුව, සූරියගොඩ විහාරය, දොඹවෙල දේවාලය, අනුරාධපුර කුට්ටම්පොකුණ, යාපනය අර්ධද්වීපයේ කන්තරෝඩය විශේෂ බව පවසයි. කලක් ඔහු අම්පාර පුරාවිද්‍යා කෞතුකාගාරයේ ද සේවය කළේය.

මහාචාර්ය සෙනරත් පරණවිතානයන් සමග බොහෝ කාලයක් රාජකාරි කටයුතු කිරීමට ලැබීම මහත් සතුටට කරුණක් බවත් විශේෂයෙන්ම සීගිරි සිතුවම් තාර ගෑමෙන් මැකී ගිය පසු ඒවා යළි පාදා ගැනීම වෙනුවෙන් මෙරටට පැමිණි ඉතාලි ජාතික මරංසි මහතා සමග කටයුතු කිරීමට ලැබීමත් ඔහු ඉතා ඉහළින් අගය කරයි.

මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය චාල්ස් ගොඩකුඹුර, ආචාර්ය සිරාන් දැරණියගල, රාජා ද සිල්වා, ආචාර්ය රෝලන්ඩ් සිල්වා, ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න, වැනි පුරාවිද්‍යා කොමසාරිස්වරු රාශියක් යටතේ කටයුතු කිරීමට ඔහුට අවස්ථාව උදාවී ඇත.

වීරකෝන් මහතාගේ දන් වයස අවුරුදු 89 කි. හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් පසුවන ඔහු පොත පත කියවමින් ඔහුටම ආවේණික දින චර්යාවක් සකසා ගෙන ජීවත් වෙයි. ස්මරණ ශක්තියෙන් පොහොසත් ඔහු පැරණි සංදේශ කාව්‍ය මෙන්ම පිරිත් පොත් කටපාඩමින් කියයි.

සිංහල, ඉංග්‍රීසි භාෂා ද්විත්වයම චතුර ලෙස හසුරුවමින් කරුණු පහදයි. බිරිඳ 2012 වර්ෂයේ මිය ගොසිනි. වීරකෝන් මහතාට දරුවන් 06 කි. ඔවුන්ගෙන් දෙදෙනෙකු විදේශ රටවල ජීවත් වන අතර මෙරට වෙසෙන දරුවන් ගෙන් කිහිප දෙනෙකු රාජ්‍ය අංශයේ රැකියාවල ද අනෙක් අය වෙළඳ ව්‍යාපාරවල ද නියැලෙති.



**ඇම්. ආර්. ජී. කුලතිලක මහතා**

1951 වසරේ සුළු පරිපාලකවරයෙකු ලෙස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයට බැඳී වසර 34 ක රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනුයේ පුරාවිද්‍යා වැඩ අධිකාරීවරයෙකු ලෙසිනි. පුරාවිද්‍යා ගවේශන, කැනීම්, සංරක්ෂණ ආදී සෑම විෂයකම තම හැකියාව ප්‍රකට කළ කුලතිලක මහතා මෙරට ජාතික උරුමයන් සුරැකීම වෙනුවෙන් සිය ජීවිත කාලයම කැප කළ පුද්ගලයෙකි. දැනට 84 වියේ පසුවන ඔහු සොයා පසුගියදා නිට්ටඹුව පනාවල පිහිටි ඔහුගේ නිවස වෙත ගියෙමු.

ඉතා උණුසුම්ව පිළිගත් ඔහු ආගිය තොරතුරු විමසයි. ඒ අතරේ මම ඔහුගෙන් පැණයක් විමසුවෙමි. ඔබ ලංකාව පුරා රාජකාරි ඉටුකළ පුරාවිද්‍යා ස්ථාන ආදිය මතකද?

"1950 දශකයේ මුල් භාගයේ මාළිගාවිල තිබුණේ මහා ඝණ වනාන්තරයක. මිනිස් වාසයකට තිබුණේ ඔක්කම්පිටියේ ගොවි ජනපදයත් පැරණි ගම්මානයත් පමණයි. දෙමටමල් වෙහෙර පිහිටා තිබුණේ පැරණි ගමේ "හෙලගම" එතැන් සිට මාළිගාවිලට සැතපුම් හතරක් තිබෙනවා. මාළිගාවිලට ළඟම පන්සල ගල්ටැම්මණ්ඩියයි. මාළිගාවිල වැඩ ඇරඹීමට අපි නවාතැන් ගත්තේ ගල්ටැම්මණ්ඩිය පන්සලේ බණ මඩුවේ ලී කණු සිටුවා මානා සෙවිලි කළ, බාගෙට මැටි බිත්ති බැදපු තාවකාලික බණ මඩුවක්. අපි නවාතැන් ගත් දිනට පසුදා රෑ වල් අලි ඇවිත් අපි හිටපු තාවකාලික මඩුව කඩන්න පටන් ගත්තා. අපි ඔක්කොම එකතු වෙලා කෑගහලා, බාල්දි වැනි උපකරණවලට ගහලා වල් අලි එළවා දැමුවා. අපගේ කූඩාරම වල් අලි කැඩූ වාර ගණන කියන්න බෑ. අපි ලැගුම් ගත් ස්ථානයේ සිට මාළිගාවිල බුදු පිළිමය ළඟට කි.මී. 2ක් පමණ ඇති. අපි කැලේ කපමින් අඩිපාරක් සකස් කිරීමට පටන් ගත්තා. දිගින් දිගටම වල්අලි ඊටත් බාධා කළා. මාස ගණනක් බොහෝ දුක් විඳ යෑමට ඒමට සුදුසු ලෙස කුඩා මාර්ගයක් සකසා ගෙන කරෙන් හෝ අතින් බඩුබාහිරාදිය රැගෙන ගියා. එකල ප්‍රවාහන පහසුකම් තිබුණේ නෑ.

ඒ වනවිට මාළිගය බුදුපිළිමය පත්මාසනයෙන් කැඩී ඉවත්ව විසිරී තිබුණා. පාද සඟල කැඩී පැත්තකට විසි වූ තිබුණු අතර කඳ කොටස වෙනමත් සිරස වෙනමත් තිබුණා. බුදුපිළිමය බිම පතිතව තිබුණේ උඩුකුරුවයි. මාළිගාවිල පුදබිම එළිපෙහෙළි කරමින් සිටිනවිට ඒ අසල තවත් තැනක් පිළිමයක් කඩා විනාශ කර ඇති බව දැන ගන්නට ලැබුණා. ලදු කැලෑ පසුකර උස් බිමක් මතට ගමන් කිරීමේ දී විශාල බෝධිසත්ව ප්‍රතිමාව මුහුණින් අතර බිම පතිතවී

තිබෙනු දුටුවා. මේ පිළිබඳව එවකට සහකාර කොමසාරිස් ධුරය දැරූ සී. ඊ. ගොඩකුඹුර මහතා මඟින් එවකට පුරාවිද්‍යා කොමසාරිස්තුමා පරණවිතාන මහතා දැනුවත් කොට ඉතා කඩිනමින් මෙම ස්ථාන සංරක්ෂණයට කටයුතු ඇරඹුවා. මහපොළොව මත කැඩී බිඳී විසිරී තිබූ යෝධ මාළිගාවිල බුදුපිළිමයත්, දඹේගොඩ බෝධිසත්ව ප්‍රතිමාවත් නගා සිටුවීම වෙනුවෙන් ඒ වකවානුවේ කුලතිලක මහතා ඇතුළු විශාල පිරිසක් සිය දායකත්වය සපයා ඇත. ඇතැම් විටෙක කුසට ආහාරයක් නොලැබ, වනසතුන්ගෙන් බේරී දිවි බේරාගනිමින් ඔවුන් එකල සිදු කොට ඇති සේවය විශිෂ්ටය.

20 දශකයේ මැද භාගයේදී කුලතිලක මහතාට පොළොන්නරු මැදිරිගිරියේ සේවය සඳහා වාර්තා කිරීමට සිදුවෙයි. එවකට එහි වැඩබිම බාරව කටයුතු කර ඇත්තේ හැරී ගුණරත්න මහතාය. ගුණරත්න මහතාගේ මූලිකත්වයෙන් මැදිරිගිරියට යන මාර්ගයේ දැනට භාවිත කරන කලංගෙඩි පාලම නිර්මාණය වී ඇත. පාලම දෙපැත්තේ කුළුණු බැද ඒ උඩ පුන්කලස් සාදා ඇති හෙයින් එම නාමය පටබැඳී ඇත. එය සෙනරත් පරණවිතානයන්ගේ ඇගයීමට ද ලක්වූ නිමැවුමකි.

කුලතිලක මහතා ලංකාව පුරා සේවය ඉටු කළ ස්ථාන අතරේ කිහිපයක් පහත පරිදි වේ. ගලබැද්ද, දිඹුලාගල, දැදිගම, බෙලිගල, බෝතලේ, මාදුරු ඔය, කොළඹ ආදී ස්ථාන වෙයි. විශේෂයෙන් එවකට එම ස්ථානයන්හි සිදු කළ කැණීම් කටයුතුවලටත්, සංරක්ෂණ කටයුතුවලට සෘජුවම ඔහුගේ සේවය ලැබී ඇත. මැදිරිගිරියේ පැරණි රෝහල් ගොඩනැගිල්ල කැණීම්කර පාදා සංරක්ෂණය කර ඇත්තේ මොහු විසින්ය. පොළොන්නරුවේ පොත්ගුල් විහාරය අවට ඇති ප්‍රාකාර බැමි කැණීම් කර පාදා සංරක්ෂණය කිරීම හා පරාක්‍රමබාහු මාලිගය වටේ ඇති ඇතුල් නගර බැම්මේ කොටසක් කැණීම්කර පාදා සංරක්ෂණය කිරීමේ යෙදී ඇත. මාදුරුඔය ජලාශයේ අලුතෙන් ඉදිකර ඇති සොරොව්ව අසල ඇති පැරණි සොරොව්ව පාදා එය විනාශ වන්නට ඉඩ නොදී සංරක්ෂණය කරන ලද්දේ මොහු විසිනි. මාදුරුඔය පැරණි සොරොව්ව බේරා ගැනීමට සිය දායකත්වය ලබාදුන් ආකාරය මෙලෙස පහදයි " පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කන්දේගම කන්ද කෙළවරක පිහිටි මාදුරුඔය ජලාශයේ ඉදිකිරීමේ සැලසුම් සකස් කිරීම 1978 වර්ෂයේ දී ක්‍රියාත්මක වුණා. කන්දේගම කන්ද සහ දණගල කන්ද අතර මේ නව වැව්බැම්ම බැඳීමට සැලසුම් කර තිබුණේ. විදේශ ආධාර ඇතිව කැනඩා සමාගමකින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණා. ඩෝසර් හා බැකෝ යන්ත්‍ර යොදා ගෙන පොළව සැකසීමේ දී විශාල වශයෙන් ගඩොල් මතුව තිබුණා. එවකට පුරාවිද්‍යා කොමසාරිස් වූ ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න මහතා හදිසි පණිවුඩයක් මගින් එම ස්ථානයට ගොස් පරීක්ෂා කරන ලෙස දැන්වුවා. කි.මී. 65 ක් පමණ දුර ගෙවා මම එහි ළඟාවන විට රාත්‍රී 8.00 පසුවී තිබුණා. මට එහි ඇතුල්වීමට ඉඩ ලැබුණේ නෑ. කරුණු පහදා දී විදුලි ආලෝකය යොදා ගෙන ඩෝසර් යන්ත්‍ර වැඩ කරන තැනට යනවිට රාත්‍රී සොරොව්වේ උඩ කොටස විනාශ වී තිබුණා. ගඩොල් කුඩු වී කෑලි තැනින් තැන විසිරී තිබුණා. විදේශීය මහතුන්ට එහි වටිනාකම පහදා දී තාවකාලිකව එය නවත්වන ලෙස ඉල්ලීමක් කර ප්‍රමාද නොවී එදිනම රාත්‍රී දුම්රියෙන් කොළඹට ආවා. කොමසාරිස්තුමා, එවකට ජනාධිපති වූ ජේ. ආර්. ජයවර්ධන මහතා දැනුවත් කොට එතුමන්ගේ උපදෙස් පරිදි එවකට මහවැලි ඇමතිවරයාව සිටි ගාමිණී දිසානායක මහතා හෙලිකොප්ටර් යානයකින් මාදුරුඔයට යවා වහාම ක්‍රියාත්මක වන පරිදි පැරණි සොරොව්ව තවදුරටත් විනාශවීමට නොදී බේරා ගන්නා. මේක මගේ රාජකාරි ජීවිතයේ දීත් පුද්ගලික ජීවිතයේ දීත් බොහෝම භක්තියෙන් සිහිකරන සිද්ධියක්."

කොළඹ කොටුවේ ඕලන්ද ආරෝග්‍යශාලා පැරණි ගොඩනැගිල්ල ජපන් සමාගමක් මගින් සංරක්ෂණය කරන ලද්දේ මොහුගේ අධීක්ෂණය යටතේ ය.

මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය ගොඩකුඹුර, ආචාර්ය රාජා ද සිල්වා, ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න, ආචාර්ය රෝලන්ඩ් ද සිල්වා, එච්. එම්. සිරිසෝම වැනි පුරාවිද්‍යා කොමසාරිස්වරු යටතේ සේවය කළ පුද්ගලයෙකි.

දූවරු දෙදෙනෙකුගේ හා පුතුන් දෙදෙනෙකුගේ පියෙකු වූ කුලතිලක මහතාගේ දැන් වයස අවුරුදු 84 කි. ග්‍රන්ථ කිහිපයක් ද ලියා මුද්‍රණයට ලබා දී ඇත. ඔහුගේ බිරිඳ කමලා කුලතිලක මහත්මිය ද නිරෝගී සුවෙන් සිටී.

මෙම තිදෙනා පිළිබඳව තොරතුරු සම්පාදනයේ දී හිටපු සහකාර අධ්‍යක්ෂවරයෙකු වූ එම්. ඒ. ජේ. ආර්. මඩගම්මන මහතාගෙන් ලැබුණු සහයෝගය අගය කරමු.

සටහන :- **සුනිල් බණ්ඩාර කෝරළගේ**
ජායාරූප :- **පාලිත හේරත්**

# උතුරු පළාතේ පුරාවිද්‍යා ගවේෂණ කටයුතු තවදුරටත්

දශක තුනකට අධික කාලයක් පුරා උතුරු පළාතේ පැවැති ජනවාර්ගික ගැටුමෙන් අනතුරුව එම ප්‍රදේශයෙහි වූ පුරාවිද්‍යා ස්ථාන පිළිබඳව සිදුකරන ලබන මූලික ගවේෂණ කටයුතුවල ආරම්භය 2010 වර්ෂය තෙක් ගමන් කරන අතර එම කටයුතු 2016 වසරේදීත් සාර්ථකව සිදුකරනු ලැබිය. මේ වන විට ක්ෂේත්‍ර ගවේෂණ තුළින් මුලතිව් දිස්ත්‍රික්කයෙන් පුරාවිද්‍යා ස්ථාන 174 ක් ද, මන්නාරම දිස්ත්‍රික්කයෙන් ස්ථාන 62 ක් ද, කිලිනොච්චි දිස්ත්‍රික්කයෙන් ස්ථාන 16 ක් ද, යාපනය දිස්ත්‍රික්කයෙන් ස්ථාන 74 ක් ද වව්නියාව දිස්ත්‍රික්කයෙන් ස්ථාන 80 ක් ද අනාවරණය කරගෙන තිබේ. මෙම පුරාවිද්‍යා ස්මාරකයන්ගෙන් 80% කට වැඩි ප්‍රමාණයක් අනුරාධපුර අවධිය නියෝජනය කරන පුරාවිද්‍යා ස්ථාන ලෙස හඳුනාගෙන ඇත. මේවායෙන් බොහොමයක් බෞද්ධ විහාරාරාම ලෙස ස්ථානයෙන් හමුවන පුරාවිද්‍යාත්මක සාධකයන්ගෙන් තහවුරු විය. ප්‍රාග් ඓතිහාසික ජනාවාස සාධක සහිත පුරාවිද්‍යා ස්ථානයන් මෙන්ම කටාරම් ලෙන් හා පූර්ව බ්‍රාහ්මී ශිලාලේඛණ සහිත සංඝාවාසයන් ද හඳුනාගෙන තිබෙන පුරාවිද්‍යා ස්ථානයන් අතරට අන්තර්ගත ය.





2016 වසරේ දී මුලතිව් හා වව්නියාව දිස්ත්‍රික්කයන් පදනම් කරගෙන වැලිඔය, සම්පත්නුවර, කිරිඉබ්බන්වැව, හැළඹවැව, ජනකපුර හා සපුමල්ගස්කඩ යන ප්‍රදේශයන් හි මූලික ගවේෂණ සිදුකරන ලදී. උතුරු පළාත තුළින් මේ වන විට පුරාවිද්‍යා ස්ථානයන් 400 කට අධික ප්‍රමාණයක් වාර්තා කර ඇති අතර, මෙම ස්ථානයන්හි භූගෝලීය දත්ත ලබා ගැනීම සිදුකරන අතර, ඒවා සිතියම් ගත කිරීමට කටයුතු කර ඇත. තවද හමුවූ පුරාවිද්‍යා ස්ථානයන් පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරක හා තහනම් ඉඩම් ලෙස ගැසට් කිරීම ද මේ අතර සිදුකරනු ලැබේ. මෙම ගවේෂණ කටයුතු තවදුරටත් සිදුකරනු ලැබේ.

**එම්. වී. ජී. කල්ප අසංග**
පුරාවිද්‍යා පර්යේෂණ සහකාර
ප්‍රධාන කාර්යාලය

## ලංකාවේ ඉදිවූ ප්‍රථම පල්ලිය

# වුල්වන්ඩෝල් (wolvendaal) පල්ලියේ සංරක්ෂණ කටයුතු යළි ඇරඹේ



පුරාවිද්‍යා ස්මාරකයක් ලෙස ගැසට් කර ඇති කොළඹ 12, ආමර්වීදියේ පිහිටි වුල්වන්ඩෝල් රෙපරමාදු පල්ලියේ සංරක්ෂණ කටයුතු මේ දිනවල පුරාවිද්‍යා දෙපාර්තුමේන්තුව විසින් සිදුකරයි. මෙය ග්‍රීක ඩොරික් ගෘහනිර්මාණ ශිල්පයට අනුව නිර්මාණය කර ඇත. මෙම පල්ලිය ක්‍රි.ව. 1749 දී ඕලන්ද රෙපරමාදු සභාව විසින් VOC (Vereenigde Oost-indische Compagnie) සමාගමේ අනුග්‍රහයෙන් ඉදිකර තිබේ. ලංකාවේ ඉදිකරන ලද පළමු පල්ලිය වන මෙය අඩි 100 ක් පමණ උස්වූ ගොඩනැගිල්ලකි.

මෙම ගොඩනැගිල්ලේ පදනම විශාල කලු ගල් පුවරු අල්ලා සකස් කරන ලද කුරුසාකාර හැඩයෙන් යුක්තය. අඩි 5ක් පමණ ඝණ බිත්ති කබොක් ගලින් බැඳ ඇති අතර ඒ සඳහා හිරිගල් සහ හුණු පාෂාණ යොදාගෙන ඇත. ආරුක්කු පිළිස්සුණු රතු ගඩොලින් නිමවා තිබේ. මෙහි තවත් විශේෂත්වයක් වනුයේ එහි මුදුන් පියස්ස බදාම හා ගඩොලින් බැඳි අර්ධ ගෝලාකාර හැඩයෙන් සැකසීමයි. 1856 දී අකුණුසැර වැදී විනාශ වූ වහලය ප්‍රතිසංස්කරණය කර තිබේ. මෙම දේවස්ථානය උසම ස්ථානයක ඉදිකරන ලද්දේ මුල්කාලයේ දී කොළඹ වරායට පැමිණෙන විදේශකයින් හට යාත්‍රාවල සිට ම යාඥා කිරීමට හැකිවන පරිදි බව කියවේ. මෙහි පෞරාණිකත්වය පිළිබිඹු කරන තවත් ප්‍රධාන සාධකයක් නම් පල්ලිය පාලනය කළ පූජකවරුන්ගේ (ගවනර්) දේව පල්ලිය ඇතුළත මිහිදන් කොට තිබීමයි. එම සොහොන්බිම් සකස් කිරීම සඳහා යොදා ගෙන ඇත්තේ කලු ගල් පාෂාණය. ඒවා සියුම් ලෙස ඔපමට්ටම් කර ඇති අතර එකල මියගිය පූජකවරුන්ගේ තොරතුරු එහි සඳහන් වේ. පල්ලියේ ආලේපිත තීන්ත ආරම්භක අවස්ථාවේ ගල්වන ලද ඒවා ය.

ඉපැරණි පුරාවස්තු ගණනාවකින් සමන්විත මෙම පල්ලිය එහි මුල් ස්වරූපයට හානියක් නොවන පරිදි ප්‍රතිසංස්කරණය කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටී. මේ දිනවල දේවාස්ථානයේ කවුළුවල (ජනෙල්) රසායනික සංරක්ෂණය සිදු කරනු ලබයි. එහි එක් ජනේලයක උස අඩි 17ක් වන අතර පළල 4.4 පමණ වේ. ආරුක්කු හැඩයෙන් යුත් එවැනි ජනෙල් පහකි. එම ජනෙල් සඳහා යොදා ගන්නා වීදුරු සහ ඊයම් යුරෝපා රටවලින් ආනයනය කර ඇත. ඒ සඳහා යොදා ගෙන ඇත්තේ Fpained glass නැමැති වීදුරු විශේෂයයි. එම වීදුරු රතු, කහ, කොළ හා සුදු යන වර්ණ වලින් යුක්ත ය. ජනෙල් නිර්මාණය කිරීමේ දී යොදා ගන්නා මෙම වීදුරු විවිධ හැඩතල වලට කපා තිබේ. ජනේලයට වීදුරු සම්බන්ධ කර ඇත්තේ ඊයම් පටි උපයෝගීකර ගනිමිනි. එකල මෙහි ජනෙල් පියස්ස බුරුම තේක්ක දැවයෙන් නිර්මාණය කොට ඇත. සංරක්ෂණ කටයුතුවල දී ද තේක්ක දැව යොදා ගන්නා අතර කොස් දැව ද භාවිත කර තිබේ. ජනෙල් පියන් ඇතුළතට සකසා ඇති අතර පිටතින් ආරක්ෂාව සඳහා දැල් ආවරණයක් සහිතය. ජනෙල් පියන් රැඳවීමට සකසා තිබූ සුළං කොකු නැවත ප්‍රතිසංස්කරණය කර ඇත. ජනෙල් වැසීම සඳහා මුල්කාලයේ දී අගුළු නොමැති වූ අතර ඒ සඳහා පිත්තලවලින් නිර්මාණය කරන ලද අගුළු වර්තමානයේ යොදා තිබේ. ජනේලයේ පහළ පියන් විවෘත කිරීමට හැකිවන අතර ඒවා යකඩ රාමුවකින් සම්බන්ධකර ඇත.


නෙදර්ලන්ත රජයේ ආධාරයෙන් සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණයෙන් මෙහි රසායනික සංරක්ෂණ කටයුතු සිදු කෙරේ. පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සෙනරත් දිසානායක මහතාගේ උපදේශකත්වයෙන් යුක්තව රසායනික සංරක්ෂණ අංශයේ කාර්ය මණ්ඩලය මෙහි සංරක්ෂණ කටයුතු වල නිරත වෙයි.

සටහන හා ඡායාරූප:
**නිමිනි දසනායක, ගයානි රණතුංග, මෝෂාණි ලක්ෂිකා, ඩබ්.ඒ.ඊ.එස්. රණවීර, සඳුනි මධුෂා**
ජනසන්නිවේදන අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.





# VOC සළකුණෙහි සැබෑ අරුත



V.O.C. යන්න ඇසූ පමණින් අප සිහියට නැගෙනුයේ V.O.C. කාසි එසේත් නොමැතිනම් පිඟන් භාණ්ඩ ඇතුළු ලන්දේසි යුගයේ භාවිතයට ගත් ද්‍රව්‍යයන් වේ.

V.O.C. හෙවත් ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම (VEREENIGE COST INISCHECOMPAGNIE) තම සමාගමෙහි අරමුණු අභිමතාර්ථ සංකේත ඔස්සේ පෙන්නුම් කිරීමට දැරූ උත්සාහය කොතෙක්ද යන්න V.O.C. සමාගමෙහි ලාංඡනය දෙස බැලීමෙන් පැහැදිළිව පෙනේ.

ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම සාගරය පාදක කොටගත් වෙළඳ සමාගමකට සාකල්‍යයෙන්ම ගැළපෙන සංකේත සමූහයක් තම ලාංඡනය තුළින් නිරූපණය කොට තිබේ. රුවල් නැං වූ නෞකාවක් ලාංඡනයෙහි මධ්‍යයේ වෙයි. එහි සෑම පැත්තකින්ම පිටතට එල්ලවී ඇති කාලතුවක්කු ද ලෙළදෙන නෙදර්ලන්ත ධජ ද දක්නට ලැබෙයි. මුහුදට අධිපති නෙප්චූන් දෙවියන් කීටිස් දෙවිදුවත් එහි දෙපසින් වෙති. නැවට පහතින් මුදල් වෙනුවට භාවිත වූ මුහුදු බෙලිකටු සහ මුදුබෙල්ලන්ගේ චිත්‍ර පේළියකි. යුද්ධ ආධිපත්‍ය සංකේතවත් කරන යුධ බෙරයක් නැවට ඉහළින් වෙයි. එය මතුපිටින් හෙල්ල රැසක් ද සමාගමේ කොඩි ද නාවික ආම්පන්න හා යුද්ධායුධ තුවක්කු ආදිය ද පෙළ ගස්වා තිබෙයි. ඒ සියල්ල ඉස්මත්තෙහි වෙළඳ සමාගමේ V.O.C. අක්ෂර ලාංඡනය සටහන් කර තිබේ.

මෙලෙස තම ලාංඡනය තුලින් තම සමාගමෙහි වූ අරමුණු සංකේත ඔස්සේ කියා පෑමට උත්සාහ දරා ඇති බව මනාව වටහා ගත හැකිය. නාවික යාත්‍රා මගින් දේශ දේශාන්තරයන් තරණය කිරීමටත් ඒ ගමනේදී මුහුදට අරක්ගත් දෙවියන්ගෙන් ආරක්ෂාව පැතීමටත් තම ආධිපත්‍යය හා යුධමය ශක්තිය පෙන්නුම් කිරීමටත් ඔවුන් පෙරදිගට පැමිණීමේ මූලික අභිමාතාර්ථය වූ පෙරදිග පැවති ධනය උපයා ගැනීම පෙන්නුම් කිරීමටත් ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළඳ සමාගමෙහි ලාංඡන තුලින් උත්සාහ දරා ඇත.

**එම්. චමින්ද සිල්වා**
කලාප භාර නිළධාරී
මන්නාරම.

# පුරාණ තොටගමු රත්පත් විහාරයේ සංඝාවාසය ප්‍රතිසංස්කරණය කෙරේ

ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ තෙල්වත්ත මංසන්ධියෙන් මැටිවල ග්‍රාමය දෙසට දිවෙන අතුරු මාර්ගයේ මීටර 500 පමණ ගමන් කළ විට හමුවුන පුරාණ තොටගමු රත්පත් රජමහා විහාරය ගාලු දිසාවේ පවත්නා වැදගත් පුරාවිද්‍යා ස්මාරක සහිත භූමියකි. ජනප්‍රවාදගත තොරතුරුවලට අනුව අනුරාධපුර යුගයට අයත් මෙම විහාරස්ථානය මුල්ම වරට කරවනු ලැබ ඇත්තේ දෙවනපෑතිස් රජුගේ සොයුරු මහානාග කුමරු විසිනි. මහාවංශගත තොරතුරුවලට අනුව දඹදෙණියේ රාජ්‍ය කළ තුන්වන විජයබාහු රජු (ක්‍රි. ව. 1302-1326) විසින් මෙම විහාරය කරවූ බවට පැහැදිලි සාධක හමුවේ.

කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර රාජ්‍ය සමය තොටගමු රත්පත් විහාරයෙහි ස්වර්ණමය යුගය විය. එවකට තොටගමු විහාරය සහ එහි පැවති විජයබා පිරිවෙණ එවකට සමාජීය, සංස්කෘතික මෙන්ම ධර්ම ශාස්ත්‍රීය වශයෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කරනු ලැබූ වැදගත් විහාරස්ථානයක් විය.

පසුකාලීන මුහුදුබඩ ප්‍රදේශයන් විදේශීය ආක්‍රමණවලට නතුවීමේ ස්වභාවය මත මේ ආශ්‍රිත පෙදෙස්වල තිබූ බොහොමයක් බෞද්ධ ආරාමයන් සම්පූර්ණයෙන්ම පාහේ විනාශ වී ගොස් තිබුණි. මේ හේතුව නිසාම ගාලු වැල්ලබඩ ප්‍රදේශයන්හි පැවති ග්‍රාමීය සංස්කෘතික පරිහාණියත් සමග විහාරාරාම මූලික කරගත් සංස්කෘතියක් නැවතත් බිහිකිරීමේ අවශ්‍යතාවය මතුව තිබුණි.

වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් විසින් ඇති කරවන ලද ආගමික ප්‍රබෝධය මත රටේ බොහොමයක් ස්ථානවල බෞද්ධ වෙහෙර විහාර නැවතත් ඉදිවන්නට විය.

ඒ අනුව පල්ලත්තර පුඤ්ඤසාර හිමියන්ගේ මග පෙන්වීම යටතේ විනාශ වී ගිය තොටගමු රත්පත් විහාරයේ ද පුනර්ජීවය ආරම්භ විය.



භික්ෂූන් වහන්සේලා ගෙන් ඉටුවිය යුතු ශාසනික මෙහෙවර කඩිනමින් සහ විධිමත්ව ඉටු කර ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලා විශාල ප්‍රමාණයක් රත්පත් විහාරයට වැඩමවා රඳවා තබා ගැනීම පල්ලත්තර පුඤ්ඤසාර හිමියන්ගේ ප්‍රධානතම අරමුණක් වූ හෙයින් භික්ෂූන් වහන්සේලාගේ පරිහරණය සඳහා අත්‍යාවශ්‍ය වූ සුවිශාල සංඝාවාසයක් ද නිර්මාණය කිරීමට කටයුතු කරන ලදී.



මෙම සංඝාවාසය දේශීය ඕලන්ද ගොඩනැගිලිවල ලක්ෂණ අනුව යමින් නිර්මාණය කර ඇති අතර සංඝාවාසයේ ඉදිරි ප්‍රවේශකය දැවකණු පෙළක් සහිත ආලින්දයක් සමගින් නිර්මාණය කර තිබේ. එක්වර විශාල සංඛ්‍යාවකට ආලෝකය සහ වාතාශ්‍රය ලබා ගැනීමට හැකි වන සේ දොර ජනෙල් විශාලත්වය වැඩිවන පරිද්දෙන් නිමවා ඇත. මෙම සංඝාවාස ගොඩනැගිල්ලෙහි රත්පත් විහාර භූමියෙහි පවත්නා එක් ප්‍රධානතම පුරාවිද්‍යා ස්මාරකයකි.

2016 වසරේ සිට මෙම සංඝාවාස ගොඩනැගිල්ලෙහි කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සිදු කරමින් පවතියි. මේ වන විට සංරක්ෂණය වන ගොඩනැගිල්ල ඇතුළුව 2016 වර්ෂයේ දී තෙල්වත්ත රත්පත් විහාරයේ පැරණි පිළිම ගෙය, ආවාස ගෙය යන ස්මාරකයන්ගේ ද නඩත්තු කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදි. මීට අමතරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් තොටගමු රත්පත් විහාරය ආශ්‍රිත ප්‍රදේශය කේන්ද්‍ර කොට ගනිමින් 2016 වර්ෂයේ පුරාවිද්‍යා සතිය වෙනුවෙන් පුරාවස්තු ආරක්ෂා කිරීමේ අගය පිළිබඳව ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලද අතර දවස පුරා පැවැත්වුණු එම වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ ද සහයෙන් ඉටු කරන ලදි.

**කේ. බී. ජී. සෞම්‍ය යශෝමාලි**
ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය
ගාල්ල.

# දකුණු ආසියාවේ පිහිටි රන් දොරටුව සහිත කෞතුකාගාරය


නේපාලයේ කත්මණ්ඩු අග නගරයේ කේෂව් නාරායන් චතුරස්‍රයේ පිහිටි පතන් කෞතුකාගාරය එරටට පමණක් නොව දකුණු ආසියානු කලාපයටම අතිශයින් වැදගත්වන්නකි. මෙය පිහිටුවන ලද්දේ 1977 වර්ෂයේ දී බිරේන්ද්‍ර ධීර් බික්‍රම් ෂා රජු විසිනි. යුනෙස්කෝ ලෝක උරුම ස්මාරකයක් ලෙස නම් කර ඇති මෙහි මූලික අරමුණ වන්නේ බෞද්ධ හා හින්දු දහමේ විශිෂ්ට කලාකෘති, සංස්කෘතිය හා ප්‍රතිමා පිළිබඳව අර්ථකථනය කරමින් සංරක්ෂණය කර ප්‍රදර්ශනය කිරීමයි.

මෙය එසේ වැදගත් වන්නේ අතීතයේ රජ මාළිගයක්ව පැවති ගොඩනැගිල්ලක් මනා සංරක්ෂණ ක්‍රියාදාමයකින් පසු කෞතුකාගාරයක් බවට පරිවර්තනය කිරීම නිසාය. එය කෙතරම් අපූර්ව දැයි වැටහෙන්නේ ලොව ප්‍රබල විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මේ පිළිබඳව දක්වා ඇති අදහස් සැලකිල්ලට ගැනීමේ දී ය. ඉන් කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

- ★ වරක් Lonely Planet මඟින් මෙය විශිෂ්ට අයුරින් සංරක්ෂණය කළ හා පැරණි නූතන අංගයන්ගෙන් මනාව ගළපා නිර්මාණය කළ දකුණු ආසියාවේ ඇති විශිෂ්ටතම කෞතුකාගාරයක් ලෙස මෙය අගය කර තිබුණි.
- ★ දකුණු ආසියාවේ ඇති විශිෂ්ටතම නිර්මාණය මෙය වන අතර ඉන්දියාවේ අප හට පාඩම් රැසක් ලබා ගත හැකි ස්ථානයක් යනුවෙන් පුවත්පත මඟින් ද වරෙක සඳහන් කර තිබුණි.

පතන් කෞතුකාගාරය නැවත ගොඩනැංවීමේ ක්‍රියාවලියේ දී මුල් ගොඩනැගිලි ද්‍රව්‍ය අංග හැකි උපරිමයෙන් යොදා ගැනීමට සංරක්ෂකයෝ කටයුතු කළහ. ඒ අතරින් කැටයම් කරන ලද පැරණි දොර, ජනෙල් සහ වහල සවිමත් කිරීමට යොදා ගන්නා ද්‍රව්‍යය ප්‍රධාන විය.

එක් දහස් නවසිය අසූ දෙකේ දී යුනෙස්කෝ සංවිධානය මඟින් ජාත්‍යන්තර වශයෙන් දියත් කළ කත්මණ්ඩු නිම්නයේ ස්මාරක ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතිය යටතේ නේපාල හා



ඔස්ට්‍රියානු රජයන්ගේ සහයෝගිතා වැඩ-පිළිවෙළක් ලෙස මෙහි ඓතිහාසික වටිනාකම උපරිම ආරක්ෂා කර ගනිමින් කෞතුකාගාර ගොඩනැගිල්ලකට අවශ්‍ය අංග එක් කරමින් ඉදිකිරීම් හා සංරක්ෂණ කටයුතු ආරම්භ කෙරිණි. එය දශකයකට අධික කාලයක් ක්‍රියාත්මක කිරීමට සිදුවිය. ඇතැම් ඉදිකිරීම් නව නිර්මාණ වන අතර ඇතැම් ඒවා එහි මුල් ස්වභාවය මතුවන ලෙස නැවත සකස් කෙරිණි. කෞතුකාගාරයකට අවශ්‍ය අංග ඇතැම් ඒවා එහි මුල් ස්වභාවය මතුවන ලෙස නැවත සකස් කෙරිණි. කෞතුකාගාරයකට අවශ්‍ය අංග එක් කරමින් ගොඩනැගිල්ලේ අභ්‍යන්තර කොටස් නිර්මාණය කිරීම ද සිදුවිය. එසේම මෙය තමන් අය කර ගන්නා මුදලින් කෞතුකාගාරය නඩත්තු කර පවත්වාගෙන යන නේපාලයේ ඇති වූ ප්‍රථම ජාතික කෞතුකාගාරය යි.

එසේම මෙම ස්ථානය පිළිබඳව විවිධ ජනප්‍රවාද හා මිථ්‍යා කථා බහුලව පවතී. එකම ජනප්‍රවාදය පිළිබඳව ඇති විවිධ අර්ථකථන ද හඳුනාගත හැකිය. මෙය ක්‍රිස්තු වර්ෂ පළමුවන සියවසේ දී රාජකීය බලපරාක්‍රමය පැවති මධ්‍යස්ථානයක් බවට කේෂව නාරායන් චතුරස්‍රයේ පිහිටි ක්‍රිස්තු වර්ෂ 643 ට අයත් ශිලා ලේඛනයක් මඟින් සනාථ වේ. එපමණක් ද නොව කෞතුකාගාරයට උතුරු දෙසින් හමු වී ඇති ක්‍රිස්තු වර්ෂ 650 ට අයත් අභිලේඛනයක් ද මෙහි ඉතිහාසය විමසීමේ දී වැදගත් වන බව පුරාවිද්‍යාඥයින්ගේ අදහසයි.





ක්‍රිස්තු වර්ෂ 1630 දී මේ මාළිගය හඳුන්වා ඇත්තේ "චච්කොට්" (සිව්කොන් බලකොටුව) යන නමිනි. වර්තමානයේ දක්නට ලැබෙන මේ මාළිගා ගොඩනැගිල්ල ඉදිකර ඇත්තේ ක්‍රිස්තු වර්ෂ 1734 දී විෂ්ණු ලලා රජ දවස ය. එමෙන්ම ක්‍රිස්තු වර්ෂ 1769 දී දේශීය නෙවා රජවරුන් පරාජය කර ගෝර්කාහි ෂාවරුන් විසින් ඔවුන්ගේ බලයට පිහිටුවීමෙන් අනතුරුව මෙම ගොඩනැගිල්ලේ රාජකීය මාළිගයක ස්වරූපය ගිලිහී යන්නට විය. 1997 වර්ෂයේ සිට මෙම මධ්‍යකාලීන රජ මාළිගය පතන් කෞතුකාගාරය බවට පරිවර්තනය කරනු ලැබීය.

### කෞතුකාගාර එකතුව හා අන්තර්ගතය

මෙහි ප්‍රධාන වශයෙන් පුරාවස්තු 1100 ක් පමණ ප්‍රමාණයක් දක්නට ලැබේ. වැඩි වශයෙන් අඩංගු වන්නේ කත්මණ්ඩු නිම්නයේ නිර්මාණය වූ බෞද්ධ හා හින්දු ප්‍රතිමාය. ඊට අමතරව ඉන්දියාව, ටිබෙටය හා බටහිර හිමාලය ප්‍රදේශවල ප්‍රභවය වූ ඒවා ද මෙහි දක්නට ලැබේ. නේපාලයේ සංස්කෘතික උරුමයේ අංගයන් ලෙස එම ප්‍රතිමාවල ආගමික හා ඓතිහාසිකමය වැදගත්කම පිළිබඳව කෙරෙන විග්‍රහයන් සහිතව ඒවා ප්‍රදර්ශනය කර ඇත.

ප්‍රදර්ශන කුටි අටකින් සමන්විත වන අතර ඒවා A සිට H දක්වා වර්ගකර ඇත. මෙහි කුටි දෙකක් බෞද්ධ ප්‍රතිමා සඳහා වෙන් කර ඇත. ශිව හා විෂ්ණු දෙවිවරුන් හා ඔවුන්ට සම්බන්ධ ප්‍රතිමා පුරාවස්තු තැන්පත් කර ඇත. මුල් හින්දු සමය හා තන්ත්‍රයානය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට වෙන් කළ ප්‍රදර්ශන කුටියක් මේ අතර වේ. මෙහි ඉහළම මහලේ 19 වන සියවසේ අග භාගයේ පතන්හි ස්වභාවය දැක්වෙන අගනා ඡායාරූප ප්‍රදර්ශනය කර ඇත.

අද්‍යතන කෞතුකාගාර සංකල්පය මැනෙවින් හඳුනා ගනිමින් මහජන ආකර්ශනය ලබා ගැනීම පිණිස මාළිගයෙහි එළිමහනේ ආහාරපාන ලබා ගැනීමේ පහසුකම්, සමරු හල් විද්වතුන්ට හා කලාකරුවන් සංස්කෘතික අංග හැදෑරීම සඳහා අවස්ථා සංස්කෘතික අංග එළිදැක්වීමට වෙන් කරන ලද ස්ථානයක් ආදී පහසුකම් මෙහි දක්නට ලැබේ.

### රන් දොරටුව

පතන් කෞතුකාගාරයේ ඇති අතිවිශිෂ්ට අංගය වන්නේ එයි ඇති රන් ආලේපිත දොරටුව හා ජනේලය යි. ලෝකයේ ඇති අතසුන්දර නිර්මාණවලින් එකක් ලෙස සැලකේ. කෞතුකාගාර දොරටුව ගලින් නෙලන ලද සිංහයන් (මිථ්‍යාමය) දෙදෙනෙකු ආරක්ෂා කරන ආකාරය දැක්වේ. දොරටුවට ඉහළින් ජනේලය සකස් කර ඇත. මෙහි ක්‍රි.ව 1854 යනුවෙන් සටහන් කර තිබේ.

**වාසනා සිරිමල්වත්ත**
ප්‍රකාශන නිලධාරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව



*ඓතිහාසික කතළුව පූර්වාරාම විහාරයේ බිතු සිතුවම්*

*කතළුව ඓතිහාසික පූර්වාරාම විහාරය ගාලු දිස්ත්‍රික්කයට අයත් තල්පේ පත්තුවෙහි පිහිටා ඇත. පන්සියක් පිරිස සමඟින් නැවකින් යාත්‍රා කරන පටාචාර භික්ෂුණිය මෙහි දැක්වේ. පසුබිමින් ඇති නැව ඔවුන්ගේ මුහුදු ගමන අඟවන අතර භික්ෂුණින් පස්දෙනා මගින් පන්සියක් භික්ෂුණීන් මෙහි නිරූපණය කර ඇති අතර වෙනත් රටක ජනයාගෙන් පටාචාර තෙරණිය වෙත උණුසුම් පිළිගැනීම ද මෙහි දැක්වේ.*

*පූර්වාරාම විහාරයේ සිතුවම් චිත්‍රයට නගා අප වෙත සැපයුවේ බස්නාහිර පළාත් පුරාවිද්‍යා කාර්යාලයේ ගයත්‍රී කාංචනා කුමාරපේලි විසිනි.*

---


**උපදේශකත්වය හා අධීක්ෂණය**
මහාචාර්ය පී. බී. මණ්ඩාවල - පුරාවිද්‍යා අධ්‍යක්‍ෂ ජනරාල්

**සංස්කාරක**
සුනිල් බණ්ඩාර කෝරළගේ

**විශේෂ සහාය**
දීපාල් විජේතිලක - වැ.බ. අධ්‍යක්ෂ (ප්‍රවර්ධන )

**කාටූන් නිර්මාණය**
සමන් කළුබෝවිල



**පාඨක ඔබේ අදහස් යෝජනා හා ලිපි ලේඛන**

සංස්කාරක,
''දායාද'' පුවත් අටුවාව,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.
යන ලිපිනයට යොමු කරන්න.
දුරකථන අංකය: 0112-688326
0112-692840 දිගුව 301


## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දුරකථන නාමාවලිය

| | | | |
|---|---|---|---|
| පුරාවිද්‍යා අධ්‍යක්‍ෂ ජනරාල් | - 011-2695255 | අංශ ප්‍රධාන (රසායන අංශය) | - 011-2691960 |
| අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල් | - 011-2683470 | සහකාර අධ්‍යක්‍ෂ (කෞතුකාගාර) | - 011-2696808 |
| නියෝජ්‍ය පුරාවිද්‍යා අධ්‍යක්‍ෂ ජනරාල් | - 011-2696808 | සහකාර අධ්‍යක්‍ෂ (අභිලේඛන) | - 011-2695609 |
| අධ්‍යක්‍ෂ (පාලන) | - 011-2698604 | සහකාර අධ්‍යක්‍ෂ (ගවේෂණ) | - 011-2696514 |
| අධ්‍යක්‍ෂ (මුදල්) | - 011-2694728 | සහකාර අධ්‍යක්‍ෂ (නඩත්තු) | - 011-2692844 |
| ගණකාධිකාරී | - 011-2667154 | සහකාර අධ්‍යක්‍ෂ (සැළසුම්) | - 011-2692842 |
| සහකාර අධ්‍යක්‍ෂ (සංවර්ධන) | - 011-2676449 | පුරාවස්තු විනාශය වැළැක්වීමේ | |
| පරිපාලන නිලධාරී | - 011-2691985 | විශේෂ ඒකකය | - 011-7222333 |
| | | විශේෂ පොලිස් ඒකකය | - 011-2694727 |
| | | | - 011-2692840 දිගුව 509/510 |
| අධ්‍යක්‍ෂ (වාස්තු විද්‍යා) | - 011-2693216 | නීති අංශය | - 011-2692843 |
| අධ්‍යක්‍ෂ (පොදුසේවා අංශය) | - 011-2688326 | පොදු දුරකථනය | - 0112-692840-41 |
| | | වෙබ් අඩවිය : www.archaeology.gov.lk | |


පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් 2017 ජූලි මස පාදුක්ක, පානළුව, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ දී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.